ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත




පිටුව 8 »



# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07




## සසුන් පිය උපහාර


5 » 12


අති උතුම් සොලොස්වන බෙනඩික් සසුනිසුරාණන් වෙනුවෙනි

විශේෂ අතිරේකය »


ක්‍රි.ව. 2013 ක් වූ පෙබරවාරි 24 ඉරිදා 147 වෙළුම 38 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.




# දැහැමියාවෙන් පිරිපුන් නිහතමානී යතිවරයාණන් දිගු කල් දිනේවා!

## කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රාර්ථනා කරති

අති උත්තම 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් මා දකින්නේ දෙවියන් වහන්සේ විසින් විශේෂාකාරයෙන් තෝරාගනු ලැබ සිල්වත් ජීවිතයක් මෙන්ම දැඩි දේව විශ්වාසයක් තුළ දේව ධර්මය පරිශීලනය කළ කතෝලික සභාවට ලැබුණු මහඟු දායාදයක් ලෙසයි. 15 පිටුවට »

## උසස් පෙළ ගණිතය, ජීව විද්‍යා සහ කලා අංශයේ ගම්පහ දිස්ත්‍රික් දෙවන ස්ථාන මීගමුව ලොයොලා විද්‍යාලයටත්, වත්තල සා. ආනා බාලිකාවටත් හිමිවේ

මීග/ලොයොලා විද්‍යාලය 2012 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල ඉතා විශිෂ්ඨ ලෙස ලබා ඉහළ ජයග්‍රහණයක් අත්පත් කරගෙන ඇත. එහි විද්‍යා අංශයේ හා ගණිත අංශයේ ප්‍රතිඵල පිළිබඳ අවධානය යොමු කිරීමේදී ජී.එල්. ඇන් උමේෂා කේෂානි පෙරේරා ශිෂ්‍යාව විද්‍යා අංශයෙන් විභාගයට පෙනී සිට A සාමාර්ථ 3 ක් ලබා ගම්පහ දිස්ත්‍රික්කයේ දෙවන ස්ථානයටත්, මුළු දිවයිනේම 22 වන ස්ථානයටත් පත්ව වෛද්‍ය පීඨයට තේරී පත්ව ඇති අතර ගයාන් සංජීව ප්‍රනාන්දු ශිෂ්‍යයා ගණිත අංශයෙන් A සාමාර්ථ 3 ක් ලබා ගනිමින් ගම්පහ දිස්ත්‍රික්කයේ 2 වන ස්ථානයටත් මුළු දිවයිනේම 48 වන ස්ථානයත් පත්ව ඇත.

එමෙන්ම කලා අංශයේ ගම්පහ දිස්ත්‍රික් දෙවන ස්ථානය ලබා ගැනීමට වත්තල සා. ආනා බාලිකා විද්‍යාලයේ ජේ. එම්. ඩී. දසුනි මල්ෂා සිසුවිය ද සමත්ව ඇත. මොවුනට ප්‍රදීපය සුබාසිංසන පිරිනමන්නීය.


විද්‍යා අංශයේ දෙවන ස්ථානය දිනාගත් මීගමුව ලොයොලා විද්‍යාලයේ ජී. එල්. ඇන් උමේෂා කේෂානි


ගණිත අංශයේ දෙවන ස්ථානය දිනාගත් මීගමුව ලොයොලා විද්‍යාලයේ ගයාන් සංජීව ප්‍රනාන්දු


කලා අංශයේ දෙවන ස්ථානය දිනාගත් වත්තල සා. ආනා බාලිකා විදුහලේ ඩී. දසුනි මල්ෂා

## කතෝලිකයන් යැදුමෙන් පෙළගැසිය යුතු සමයක්

### අපෝස්තලික තානාපති හිමි පවසයි



සෑම කතෝලිකයෙකුම දෙවියන් වහන්සේ කෙරේ දැඩි විශ්වාසයෙන් යුතුව ගත කළ යුතු කාලයක්. ශුද්ධෝත්තම පියතුමන්ගේ ඉසිඹු ලැබීමත්, නව සසුන් පියාණන් කෙනකු පත්වීමත් දෙවියන් වහන්සේගේ කැමැත්ත තුළ ඉටුවන්නක්. ඒ නිසා මේ කාලය තුළ කතෝලිකයන් යාච්ඤාවෙන් යුතුව ඒ සඳහා පෙළ ගැසිය යුතුයි.

ලොව විවිධ මාධ්‍යයන් මඟින් පළවන පුවත් හෝ තොරතුරු අසා දැන ගැනීමෙන් කළබලයට පත්විය යුතු නැහැ. සසුන් පියාණන් කෙනකු පත් කිරීමට කතෝලික සභාවේ සසුන් නීතිය අනුව පිළිගත් යාන්ත්‍රණයක් පවතිනවා. ඒ අනුව කටයුතු කරමින් දේව කැමැත්ත තුළ ශුද්ධාත්ම වරම් ලබා ගැනීම කතෝලික වගකීමයි.

## "මම සමිඳාණන්ගේ මිදි උයනේ සරළ, නිහතමානී සේවකයෙකු වෙමි" - අති උතුම් සොළොස්වන බෙනඩික් සසුන් පියා

## පදවියෙන් පදවියට

## අගරදගුරු පදවි කතෝලික පාසල්හි අ.පො.ස. උ.පෙළ හොඳම ප්‍රතිඵල ලබාගත් සිසු සිසුවියන් අගැයේ

**2012 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් අති විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගත් අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික හා පවරාගත් පාසල්වල සිසු සිසුවියන් අගැයීමට ලක් කිරීම කොළඹ අගරදගුරු කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි කාර්යාලය මඟින් පසුග යදා සිදුකෙරිණි.**



කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගෙ ප්‍රධානත්වයෙන් පැවති මෙම උපහාර උලෙළේ දී කථාකළ එතුමෝ ප්‍රකාශ කර සිටියේණි අප පදවියේ කතෝලික පාඨශාලා සහ පවරාගත් පාසැල්වල සිසු සිසුවියන් අති විශිෂ්ඨ ප්‍රතිඵල පෙන්වීම පිළිබඳව සතුටුවන අතර එම පාසල්වල ඇති හොඳ අධ්‍යාපනයණි විනය හා පාසල් ප්‍රධානීන්ගේ හා ගුරුවරුන්ගේ ඉමහත් කැපවීම මත මෙම ප්‍රතිඵල ලබා ඇති බව තමන්ගේ විශ්වාසය බවය.

අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් සමඟ අගරදගුරු පදවි කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමා ද අගරදගුරු පදවියේ කතෝලික පාඨශාලා සහ පවරාගත් පාසල්වල විදුහල්පතිවරුන් හා විදුහල්පතිනියන් ද හොඳම ප්‍රතිඵල ලබාගත් සිසු සිසුවියන් විශාල පිරිසක් ද මීට එක්වී සිටියහ.

අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සහ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් විසින් සියලුම සිසු සිසුවියන්ට උපහාර පුද කෙරිණි.

**පී. සුනිල් ප්‍රනාන්දු**

### කුරුණෑගල පදවි පශ්චත්තාපික දිනය 2 දා

'දුක වේදනාව තුළින් ජයග්‍රහණය කරා' තේමා කරගෙන ඇතුගල්පුර පදවි වාර්ෂික පශ්චත්තාපික දිනය මාර්තු 02 සෙනසුරාදා පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සඳලංකාව - තඹකන්ද කල්වාරි පුදබිමේදී පැවැත්වේ.

**සිසිල් ඩැනීසියස්**

### රදගුරු හිමි මීසම් බැහැදකී

ඇතුගල්පුර රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පසුගියදා මැල්සිරිපුර මීසම් ජනතාව බැහැ දුටහ.

සැදැහැ ජනතාව හමුවී ඔවුන්ගේ ප්‍රශ්න ගැටලු පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළේය. මීසම් සේවක ගරු මයිකල් කොස්තා පියතුමාගේ නොමඳ සහය මීට ලැබුණි.

**මැටිල්ඩා නානායක්කාර**

## සියළුම සැදැහැවතුනට දැනුම් දීමයි

නොබෝදා සිට වඩාත් විවෘතව කතෝලික දේශපාලකයින් හා ඉහළ තනතුරු දරන ප්‍රභූවරුන් කතෝලික නොවන ආගමික සිද්ධස්ථාන වලට ගොස් ඒ ඒ ආගමික වත් පිළිවෙත් ප්‍රසිද්ධියේ සිදුකරමින් ඒ ඒ ආගමික නායකයන්ගේ ආශිර්වාද ලබාගෙන තම සේවා කටයුතු ආරම්භ කරන ප්‍රවනතාවයකට පැමිණ ඇති බව විවිධ මාධ්‍ය හරහා අපට දැනගන්නට ලැබී ඇත. එලෙසම එවැනි අය මියගිය විට ඔවුන් කළ පොදු ජන සේවයට විශේෂ උපහාරයක් ලෙසින් කතෝලික වත් පිළිවෙත් වලට අමතරව වෙනත් ආගමික වත්පිළිවෙත් ද, අවමංගල්‍ය අවස්ථාවලදී සිදුකිරීමට යොමුවී ඇති බවටද සාක්ෂි ලැබී ඇත. මේ ගැන කතෝලික සැදැහවතුන් අප වෙත විවිධ අවස්ථාවලදී පැමිණිලි කර ඇත.

අන්‍යාගමික ජනතාවට එකසේ සේවය කරන්නට මෙවැනි නිල තල දරන අයට වගකීමක් ඇතත් තම සේවා කටයුතු වල දී වෙනත් ආගමික වත් පිළිවෙත් වලට සෘජු ලෙස සහභාගිවීම හෝ එවැනි වැඳුම් පිදුම් වල යෙදීම කතෝලික සභා ඉගැන්වීම් වලට පටහැනිවීමකි. අන්‍යාගමික දේශපාලනඥයින් මිය පරලොව ගියවිට ඔවුන්ගේ ආගමික වත් පිළිවෙත් පමණක් සිදුකර අවසාන කටයුතු කිරීම සාමාන්‍ය ප්‍රවනතාවයි. එහෙත් කතෝලික උසස් තනතුරු දරණ අය පමණක් ඒ ඒ වත් පිළිවෙත් සමඟ කතෝලික වත් පිළිවෙත්ද සිදු කිරීම කිසිදු ආගමකට ගරු නොකර ඒ ඒ ආගමික පිළිවෙත් හුදෙක් තමන්ගේම දේශපාලන වාසිය වෙනුවෙන් හරවා ගන්නට දරන පහත් උත්සාහයක් වේ. ආගමක් යනු මනුෂ්‍යයෙකුගේ ඇතුලාන්ත චින්තනය හසුරුවන්නට මෙන්ම මෙලොව පැවැත්මෙන් ඔබ්බට ඇති සදාකාලික පැවැත්ම වෙත ගමන් කරන්නට කෙනෙකුට මගපෙන්වන ඇදහිල්ලේ ජීවිත මාර්ග යයි. එබැවින් තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ඒ අදහන දහමට ලැදිව සියල්ල ඉටු කිරීම තුළින් අවංක ආගමික පැවැත්මක් ඇතිකර ගන්නට හා ඒ තුළ අන්‍යයන්ට ආදර්ශයක් වන්නට කෙනෙකුට ඒ ආගම අත්වැලක් වේ. ඒ නිසාම එම වගකීම පැහැර හැර සියලුම ආගමික චින්තනයන් කලවම් කරගෙන එකදු ආගමක්වත් හරිහැටි නොඅදහා ආගමික ජීවිතය විකුණාගෙන කෑම කිසිවෙකුට තරම් නොවේ.

කතෝලිකයන් වන අය දේශපාලන හෝ විවිධ ජාතික සේවාවල යෙදෙන්නේ නම් කතෝලික වත් පිළිවෙත් පමණක් අනුගමනය කරන්නට ඔව්හු ද බැඳී සිටිති. තමන් ලබාදෙන සේවය සැමට එකසේ ලබාදීමට ඔවුන් බැඳුනත් තමන් අදහන ආගමට අනුව නිතර දිවි ගෙවමින් ඒ වෙනුවෙන් සාක්ෂි දරන්නට ඔවුහු කැපවිය යුතුවේ. එසේ නොකරන්නේ නම් එය තමන්ගේම ආගමීක පැවැත්ම පමණක් නොව අනිකුත් ආගම්ද අවතක්සේරු කිරීමකි. ආත්මාර්ථකාමීව පාවිච්චි කිරීමකි. ඒ නිසා දේශපාලනය තුළ හෝ සමාජ නායකත්වය තුළ වගකීම දරන සියලුම කතෝලික සැදැහැවතුන්ගෙන් මා ඉල්ලා සිටින්නේ ඒ පිළිබඳව සැලකිලිමත් වී ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙසූ දහම ජීවිත අනුසාරයෙන් අවංකව අදහමින් නිතරම එයට ලැදිව ජීවත් වීමට ධෛර්යමත් වන ලෙසයි. මෙය දිගින් දිගටම ඉවතලන යම්කිසි දේශපාලන හෝ සමාජ මට්ටමක හෝ කෙනෙකු සිටි නම් ඒ තැනැත්තා හෝ තැනැත්තිය එවන් තනතුරු වලට පත් කිරීමෙන් හෝ යෝජනා කිරීමෙන් වලකින ලෙසද කතෝලික ජනතාව වෙතින් මම ඉල්ලා සිටිමි.

**අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි**
**ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ සභාපති**

## ලොව දෙව්මැඳුරු අතරින් වැඩිහරිය දේව මාතාවන්ට කැපකර ඇති ඒවා

මේ ලෝකෙ තියෙන දෙව්මැඳුරු අතරින් වැඩිම හරියක් කැප කරල ඇත්තේ දෙව්මව්ටයි. මේ දෙව්මැඳුරත් කැපකර ඇත්තේ දේව අම්මටයි. මෙයින් පෙන්වන්නේ අපේ ක්‍රිස්තියානි ජීවිත ගොඩගන්න දේව මෑණියන්ව ආදර්ශයට ගත යුතු බව යැයි අගරදගුරු පදවි සෙත් සරණ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා ජාඇල සුදුවැල්ල මඩු මාතා 32 වැනි වාර්ෂික මංගල්‍ය උත්සවයේ දී පැවසීය.



එහිදී වැඩිදුරටත් කතාකළ ගරු පියතුමා මෙසේද පැවසීය. මේ යුගයේ අපේ කතෝලික ජනතාවට නොයෙක් තාඩන පීඩන මූලධර්මවාදීන්ගෙන් එල්ල වෙනවා. අද අන්තවාදීන් අපේ පල්ලි සුරුවම් ගිනි තබා විනාශ කරනවා. ස්වාමීන් වහන්සේ අපේ හිසේ හැම කෙස් ගහක්ම ගණන් කරලයි තියෙන්නෙ. එම නිසා අප ඒ කෙරෙහි විශ්වාසයක් ඇත්නම් කිසිදේකට බිය විය යුතු නැතැයි පැවසීය.

තුඩැල්ල මීසම් සේවක ගරු දොන් සිසිල් කුමාර පියතුමාගේ මෙහෙයවීමෙන් මංගල්‍ය කටයුතු සංවිධානය කැරිණ.

**ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා/ ඇන්ටන් ජයසූරිය**



බටගම මීසමට අයත් කපුවාගාර සුව සහනයේ සමිඳුන්ගේ දෙව්මැඳුරේ දිව්‍ය හෘදය සමිතියේ 15 වන සංවත්සර දින බටගම මීසම් සේවක ගරු නිශාන් විලත්ග මුව පියතුමන් සමග සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **රීටා බොතේජු**

## වාස් පිය සමරු මෙහෙය පල්ලන්සේනේ

ලංකා භූමියේ කතෝලිකයන් ලැබුවා වූ උතුම්ම තිළිණය වූ භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා වෙස්වලාගෙන කතෝලිකයන් සොයා ගොස් ඔවුන්ගේ විශ්වාසය ස්ථිර කිරීමට සමත් වූවා යැයි කොළඹ අගරදගුරු පදවියේ දකුණු කලාපීය නාහිමි හා ජාතික ජුසේ වාස් කාර්යංශයේ ලේකම් අතිගරු ඇන්තනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා පල්ලන්සේන විඤෙෂ්ප දේව මාතා දේවස්ථානයේදී පැවසීය.

මේ දිව්‍ය යාගය කැපුචීන් නිකා අධිපති ගරු නෝබට් සෝසා හා පල්ලන්සේන මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමන් ඒකාබද්ධව පැවැත් විය. මීගමු දිසා ජුසේ වාස් යැදුම් සංඝයේ සමාජිකයන්ද අවට මීසම් වාසීන් ද මෙම මංගල දිව්‍ය යාගයට සහභාගි වූහ.

දිව්‍ය යාගය අවසානයේ දී කොළඹ අගරදගුරු පදවියේ ජුසේ වාස් කමිටුවේ ලේකම්, කිතුනු ලේඛක අසේල දසනායක මහතා භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමාගේ ජීවිත කථාව හා ලංකා සංචාරය අළලා ලියන ලද ග්‍රන්ථයක් නාහිමිපාණන්ට හා පල්ලන්සේන මීසම් සේවක පියතුමාට ද කැපුචීන් නිකායේ අධිපති පියතුමාට ද පිළිගැන්විය.

**මෙල්වින් ද කොස්තා**

ඉකුත්දා පූජක වරම් ලද ගරු මාලන් විජේන්ද්‍ර පියතුමා ප්‍රථම දේව මෙහෙය පැවැත්වීමට පැමිණි අවස්ථාවේ වෙන්නප්පුව මීසම් සේවක ගරු ප්‍රෑන්ක් තිසේරා පියතුමන් ඇතුළු වෙන්නප්පුව මීසම් ජනතාව දේවස්ථානය වෙත කැඳවාගෙන ගිය අයුරු.

**සටහන - ප්‍රියන්ත පීටර්ස්,**
**සේයා - මයිකල් පෙරේරා**





## මිනිස් උදාරත්වය දෙවිඳුන්ගේ මහිමයයි

කතෝලික සභාව විශ්වාසයේ සත්‍යය පදනම් කරගෙනයි කවදත් ඉදිරියට යන්නෙ. අද අප කරන්නේ ද මනුෂ්‍යත්වයේ උදාරත්වය ආරක්ෂා කිරීමයි. වර්ධනය කිරීමයි. මිනිස් උදාරත්වය දෙවිඳුන්ගේ මහිමය යැයි කරිටාස් සෙඩ්ගෝල් ගාලු පදවි අධ්‍යක්ෂ ගරු මයිකල් රාජේන්‍ද්‍රම් පියතුමා පැවසීය.

'යහපත් හෙට දිනක් උදෙසා මානව හිමිකම්' පිළිබඳ පුහුණු වැඩමුළුවකදී උන්වහන්සේ මේ බව ප්‍රකාශ කළහ.

කතෝලික, බෞද්ධ, ඉස්ලාම් දහම් පාසල් ගුරු භවතුන් වෙනුවෙන් පැවති මෙම පුහුණු වැඩමුළුව කරිටාස් මානව සම්පත් කළමනාකාර දිනුෂ් ජයසූරිය මහතා මෙහෙය වූ අතර ජාතික කාර්යාලයේ ෂාමිනි මෙනෙවිය ඊට සහයෝගය දැක්වූවාය. කරිටාස් සෙඩ්ගෝල් වැඩසටහන් සම්බන්ධිකාරක රවීන්‍ද්‍ර ලියනගේ මහතා එදින කටයුතු සංවිධානය කළේය.

ගාල්ල කරිටාස් සෙඩ්ගෝල් ආයතනයේ පැවතී මෙම පුහුණු වැඩසටහනට සර්වආගමික දහම් ගුරු භවතුන් විසි පස් දෙනෙකු පමණ සහභාගි වූ අතර සම්මන්ත්‍රණ, කණ්ඩායම් සාකච්ඡා, අදහස්, යෝජනා ආදි අවස්ථා කිහිපයක්ම මෙම වැඩමුළුවට ඇතුලත් විය.

**මංගල ජයවර්ධන**

## නව පැවිදි සොයුරියව පිළිගනී

බොල්ලත මීසම් පවුලේ හී වැඩුණු ගරු නිරෝෂනී විදුරංග නී ප්‍රනාන්දු මෙනවිය පැවිදි සොයුරියක් වශයෙන් සමිඳු මිදි උයනේ සේවයට භාග්‍යය උරුම කර ගත්තාය.

බොල්ලත මීසම ලක් කිතුනු ඉතිහාසයට සුවිශේෂි වාර්තාවක් එකතු කරමින් එකම පවුලේ සොයුරියන් 5 දෙනකු සහ සොහොයුරකු සමිඳු සේවයට කැපකළ ආශිර්වාදිත ගම්මානයකි. මේ අවස්ථාවේදී මීසම් සේවක ගරු බර්නාඩ් රෙහාඩ් පියතුමා සමගින් මීසම් ජනතාව සුබ පැතූහ.

**අජිත් කමල්ප්‍රිය ජයලත්**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2013 පෙබරවාරි 24 ඉරිදා

# අධ්‍යාපනය උදෙසා පවුලේ වගකීම

"මීටර් සියය කෙටිකථාවේ මුදලිහාමි උල්සපත්තු කාරයා සමග හරි හරියට දිව්වේය. ඔහුට උල් සපත්තුකාරයා සමග දුවන්නට ආත්ම ශක්තියක්, ධෛර්යයක් තිබුණේය. ඔහු උල්සපත්තු කාරයාට බිය වූයේ නැත. උල්සපත්තු කාරයා ඉහළ පාසලක, ඉහළ පුහුණුවක් ඇති දරුවකු නිසා කෙසේ හෝ උල්සපත්තුකාරයා පරදා ජයග්‍රහණය කළ යුතුය යන්න මුදලිහාමිගේ අධිෂ්ඨානය වූයේය. ඒ අධිෂ්ඨානයෙන් ඔහු උල්සපත්තු කාරයා පැරදවූයේය."

1970 දශකයේ හය වන පංතියට නියමිත සිංහල පාඩම් පෙළ පොතේ 'මීටර් සියය' කෙටිකථාව නැවතත් ආවර්ජනය කරන්නට මෙන් 'රාවය' පුවත්පතේ ජනරංජන "පොල් සොරකමේ සමාජ වගකීම" යනුවෙන් අපූරු කොළමක් පසු ගිය කලාපයක පළකොට තිබුනි. 1970 දශකය වගා සංග්‍රාමයේ යුගයයි. දේශීය එදායිතාවයට මුල් තැන දුන් යුගයයි. අභිමානනීය වූ නවෝදයේ හෙට උදයේ හිරු පායනවා යන්න දේශානුරාග යෙන් ඔද වැඩෙන්නට ගුවන් විදුලියෙන් අනාගත දැක්මක් ඇති කරමින් හැම උදයකම නවමු අයුරකින් උත්තුංග ගීත පාසල් ළමුනගේ කන වැටුන යුගයයි. 'කැලෑ කපා වල් උදුරා උයන් තනා අපට යන්න ජය මාවත මැදින් සදා' යන උදාන ගීතය, බලාපොරොත්තුව අපට තියේ හෙට හිරු පායන සේ' යන අපේක්ෂාවේ ගීතය එදා කන වැකුන පාසල් සිසුන් කිඹුලා බනිස් කෑල්ලකින් උදේ ආහාර කිස නිමවා පාසල වෙත ගියේ ලංගම බසයකිනි. අතේ කෑම පෙට්ටි තිබුනේ නැත. නිල් කොල අත ගැවසුනේ නැත. සත 50 කින් අච්චාරු ටිකක් අච්චාරු අම්මාගෙන් කන සිසු දරු දැරියන් නැවත ගෙදර පැමින බත් ටිකක් කෑවේ නැවුම් ශක්තියකිනි.

එදා මුදල් හාමි චරිතය සිසුනට මහත් අභියෝගයක් මෙන්ම චිත්ත ධෛර්යක්ද ඇති කළ බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඒ ධෛර්යය නව නිර්මාණ තුළට දරුවන් ගෙන ගියේ අමුතු බරක් ඔවුනට ලබා දෙමින් නොවේ.

එදාට වඩා අද බොහෝමයක් වෙනස්වී ඇත. දැන් තත්ත්වය අනුව මේ රටේ සෑම දරුවෙක්ම මුදලි හාමි කෙනෙක් වන්නේ නැත. ඒ විදිහට හිතන්නේ නැත. මුදලිහාමි ලෙස අභියෝගවලට මුහුණදීමට සෑම දරුවකුටම නොහැකිය.

දරුවන් එසේ වන්නට බලපානු ලබන කාරණා ගණනාවක් ඇත. පවුල් පසුබිම, සමාජ පසුබිම, ආර්ථික පසුබිම මේ අතර ප්‍රධාන වේ. එහෙත් දරුවකු මුදලිහාමි කෙනෙකු බවට පත්කර ගත හැකිය. ඔහුගේ මනස ආකල්ප වෙනස් කර ඔහුට ශක්තියක් ජීවයක් ලබාදිය හැකිය.

පාසලකට දරුවෝ විවිධ සමාජ තලයන්ගෙන් පැමිණෙති. එය වෙනස් කළ නොහැකි යථාර්ථයකි. පාසලේදී කළ යුත්තේ මේ දරුවන්ගේ ඇති සමාජයීය පරතරය, ආර්ථික පරතරය එකී දරුවන්ට දැනෙන්නට අවස්ථාවක් ලබා නොදීමට කටයුතු කිරීමය.

මෑතක මහත් ආන්දෝලනයකට තුඩු දුන් හොරණ එක්තරා විද්‍යාලයක ඒ කුඩා දරුවාගේ පොල් ගෙඩි කිහිපයක සිදුවීමද එකී සමාජයීය පරතරය සහ ආර්ථික පරතරය පාසල තුළ ඉස්මතු වීමේ ඛේදවාචකයේ ප්‍රතිඵලයකි. මෙහිදී විදුහල නිවැරදිද, නැතිනම් පවුල් පරිසරය නිවැරදිද යන්න ඇතිවූ සමාජ කතිකාවලට තවමත් නිමක් නොමැති තරමය.

හැල්මේ දිවෙන සමාජ තරඟකාරීත්ය, පංති කාමරයේ හටන දරුවනට වඩා අද දෙමව්පියන් අතට ගැනීම නිසා බොහෝ රජයේ පාසල් පවා අසරණ තත්ත්වයට පත්ව ඇත. ඵලදායිතාවය ඉස්මතු කරමින් හා ප්‍රාදේශීය කළාපකරණය අධ්‍යාපන තරගය තුළ පාසල් වල පහළම සමාජ පංතියක යැයි කියැවෙන ස්ථරයටවත් අද ගැලවීමක් නොමැති තරම්ය. දරුවනගේ අධිෂ්ඨාන ශක්තිය ගොඩනැංවීම කළ යුත්තක්මැයි. අභිමානයේ ධජය අත දරා ඉදිරිය බලා යන්නට ඔවුනගේ දෑත් ශක්තිමත් කළ යුතුමයි. නමුත් ඊටත් වඩා අද ප්‍රශ්නය පවතින්නේ දෙමව්පියන් අවස්ථාවට අනුචිත විවිධ අර්ථ කථන ළමුනගේ මනස් වලට දමමින් ඒ අත්දැකීමෙන්ම සියල්ල කිරා මැන බලන්නට පාසල් පරිසරයට අභියෝග කිරීමයි.

මූලික වශයෙන් පවුලේ වගකීමෙන් මිදී සියල්ල පාසල වෙත පමණක් පවරන්නට උත්සහ දරන දෙමව්පිය සමාජ රටාවක සමස්තය නිර්ණය කරන්නට අද මුදල හේතුකාරක වී ඇත. ඒ අනුව මුදල් සියලු වටිනාකම්හි මූලික මිනුම්දණ්ඩ වූ නිසා ප්‍රමාණාත්මක හා ගුණාත්මක සියල්ල නිර්ණය කරන්නට පවුලේ වගකීමෙන් මිදී දෙමව්පියන් දරුවන් අත මුදල් රදවන්නටත් එතුළින් ගුරුවරුන් දෙවන පෙළ කොටස්කරුවන් බවට පත් කොට ක්‍රියා කරන්නටත් උත්සහ ගෙන තිබීම ශෝචනීයයි. පෞද්ගලික පාසලකට වුවත් දරුවකු ඇතුලත් කිරීමේදී මූලික මිණුම් දණ්ඩ බවට දෙමව්පියන් අද මුදල පමණක්ම එකම සාධකය බවට පත් කොට ගෙන ඇත.

මුදලට වඩා ඔබ්බට ගිය මහ මාවතක් දිස්කර ගත යුතු බව පවුලේ දෙමව්පියන් අවබෝධ කර ගන්නේ නම් සමස්ථයේ එකම ස්ථාවරය බවට පාසල් පරිසරයේ ඇති කළ හැකි ගුණාත්මක වාතාවරණයේ නියම ඵල නෙලන්නෝ දරුවෝම වෙත්. එම නිසා නූතන අධ්‍යාපන කථාවේ පෙර ගමන් කරුවන් වන දෙමව්පියන් සතු වගකීම ගැන මීට වඩා කතිකාවක් සෑම සමාජ ස්ථරයකම ඇතිවිය යුතු බව අපගේ ඒකායන අවධාරණයයි.

**විශ්වාසයේ වසර**
**දහම් චින්තා 18**

# පාප්තුමාගේ නිල නිෂ්ක්‍රමණය

ශුද්ධෝත්තම පියතුමා තම නිල නිෂ්ක්‍රමණය කිරීම පිළිබඳ පුවත පසුගිය පෙබරවාරි 11 වන දින පෙරවරුවේ ප්‍රකාශයට පත් කිරීම ලොව මවිතයට පත් කළ කරුණක් විය. භාග්‍යවන්තයින් තිදෙනකු සාන්තුවරයට එසැවීම සඳහා පැවැත් වූ කාදිනල්වරුන්ගේ විශේෂ සම්මුති සභාව අමතා එතුමා යාච්ඤාවයෝගී ආකල්පනයකින් පසුව තම තීරණය සහිත නිල ප්‍රකාශනය ලතින් භාෂාවෙන් කියවීම මඟින් ලොවට එය හෙළි කළේය.

"මා හොඳින් වටහා ගෙන ඇති අයුරින් මෙම (පාප්) මෙහෙවර එහි අනැති ආධ්‍යාත්මිකභාවය නිසා වචනයෙන් හා ක්‍රියාවෙන් පමණක් නොව දැඩි යාච්ඤාවයෝගී බවකින් හා වේදනා දරා ගැනීමෙන් යුතුව ඉටුකළ යුත්තකි. එම හේතුව නිසාම මෙම ක්‍රියාවේ ඇති බැරෑරුම්කම දැඩි ලෙස අවබෝධ කරගෙන, පූර්ණ නිදහසකින් යුක්තව, 2005 වසරේ අප්‍රියෙල් මස 19 වන දින කාදිනල්වරුන් විසින් මා හට පවරන ලද පේදුරුතුමන්ගේ අනුප්‍රාප්තික මෙහෙවර එනම් රෝම පදවියේ මාගේ රදගුරු නිලය මම නිෂ්ක්‍රමණය කරන බවත්, 2013 පෙබරවාරි 28 වන දින ප.ව. 8.00 න් පසුව රෝමයේ ශුද්ධාසනය හිස් වන බැවින්, මෙම මෙහෙවර වෙනුවෙන් නව ශුද්ධෝත්තම පියතුමකු පත් කිරීමේ පාප් නිලවරණ රහස්‍ය සම්මුති සභාව කැඳවන පිණිස ඒ සඳහා අධිකාරි බලය ඇති තැනැත්තන් විසින් කටයුතු කරන ලෙසත් ප්‍රකාශයට පත් කරමි."

එම තීරණය පිටුපස ඇති හේතුව තමා ඉතා හොඳින් මෙනෙහි කර බලා ගැඹුරු යාච්ඤාවකින් පසුව ගත් බව එතුමා සඳහන් කරයි. "දෙවි පියාණන් ඉදිරියේ යළි යළි වාරයක් මාගේ හෘද සාක්ෂිය විභාග කිරීමෙන් අනතුරුව පේදුරුතුමන්ගේ අනුප්‍රාප්තික මෙහෙවර නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා වයෝවෘද්ධභාවය හේතුවෙන් මාගේ ශක්ති ප්‍රමාණය තවදුරටත් ප්‍රමාණවත් නොවන බව මම තරයේ වටහාගෙන සිටිමි."

මෑත කාලීන ඉතිහාසය තුළ, එනම් පසුගිය සියවස් 06 ඇතුළත ශුද්ධෝත්තම පියතුමකු නිල නිෂ්ක්‍රමණය කළ පළමු අවස්ථාව මෙය වේ. අවසාන වරට පාප් ධුරය අත්හළ ශුද්ධෝත්තම පියතුමා වූයේ 1415 දී xii ගෙගරි පාප්තුමාය. එකල සාන්ත සභාව තුළ ඇති වූ භේදයක් හමුවේ සාමය ඇති කිරීම පිණිස පාප් ධුරය අත්හැරීමට එතුමා එකඟ විය. ප්‍රංශයේ අවිඤොන් නුවර දී ව්‍යාජ ලෙස පිවිසි viii බෙනඩික්ට් යන නම ගත් කාදිනල් වරයා තමා පාප් ධුරයට පත් වූ බව ප්‍රකාශ කළ විට සභාව තුළ භේදයක් ඇති වුණි.

වර්ෂ 1406 දෙසැම්බර් මස දී රෝමයේ ශුද්ධාසනය වෙත සභාවේ 205 වන පාප්තුමා ලෙස xii වන ග්‍රෙගරි පාප් තුමා පත් වූ අතර එතුමා රෝම රදගුරු පදවියේ ආසන දෙව්මැඳුර වන ලැටරන්හි සාන්ත ජුවාම් තුමාගේ දෙව්මැඳුරේ දී පදවි ප්‍රාප්ත විණි. නමුත් පාප් නිලවරණ රහස්‍ය සම්මුති සභාව පැවැත්වීමට පෙර කාදිනල්වරුන් විසින් සභාව තුළ භේදය හට ගැනීමට හේතුව සලකා බලා එය සමතයකට පත් කිරීම පිණිස ඊළඟට පත් වන පාප්තුමා හා ව්‍යාජ ලෙස පත් වී සිටි කාදිනල්තුමන් දෙදෙනාම ඉල්ලා අස්විය යුතු බවට එකඟ වී තිබිණි.

ඒ අතරතුර දී පීසා නගරයේ දී කාදිනල්වරුන් පිරිසක් රැස් වී xxiii වන ජුවාම් යන නාමයෙන් වෙනත් කාදිනල්වරයකු පත්කරගෙන තිබිණි. ඔහු කොන්ස්ටන්ස් නගරයේ දී මන්ත්‍රණ සභාවක් කැඳවා නීත්‍යනුකූලව පත්වී ඇති පාප්තුමා කවරෙක් ද යන්න විභාග කළේය. නමුත් 1415 එම මන්ත්‍රණ සභාව විසින් xxiii වන ජුවාම් නමැත්තා ප්‍රතික්ෂේප කර පිටුවහල් කරන ලදි. ඉන් පසුව xii වන ග්‍රෙගරි පාප්තුමා කොන්ස්ටන්ස්හි මන්ත්‍රණ සභාව අභිනවයෙන් කැඳවා xxiii වන ජුවාම් විසින් කැඳවන ලද මන්ත්‍රණ සභාවේ සැසිවාර අවලංගු කර එහි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරන ලදි.

(මෑතක, 1958 දී පත් වූ ඇන්ජලෝ කාදිනල් රොන්කල්ලි හිමියන් විසින් තම පාප් ධුර නාමය වශයෙන් ජුවාම් යන නාමය භාවිතයට ගැනීමට හේතුව වශයෙන් දැක්වූයේ තම පියාගේ නාමය ජුවාම් වූ බැවිය. මෙලෙස එතුමා නිල වශයෙන් ජුවාම් යන නාමය භාවිතයට ගනිමින් xxiii වන ධුරාංකය භාවිත කළේය.)

අනතුරුව සාන්ත සභාව තුළ එකමුතුකම නඟාලනු පිණිස xii වන ග්‍රෙගරි පාප්තුමා සිය කැමැත්තෙන් තම නිල නිෂ්ක්‍රමණය කිරීමේ ලිපිය මන්ත්‍රණ සභාව වෙත භාර කරන ලදි. මන්ත්‍රණ සභාව විසින් එය පහත සඳහන් ආකාරයෙන් පිළිගන්නා ලදි.

"ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සාන්ත සභාව නියෝජනය කරමින් ස්ථාපිත කරන ලද මෙම කොන්ස්ටන්ස් හි ශුද්ධවූ මන්ත්‍රණ සභාව, පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් xii වන ග්‍රෙගරි පාප්තුමන් තම භාරකාර නියෝජිත කාර්ලෝ මලතේස්තා මඟින් අප වෙත ඉදිරිපත් කරන ලද පාප් ධුරයේ තමන්ට හිමිව තිබූ ධුර නාමය, අයිතිය හා භාරකාරත්ව නිල නිෂ්ක්‍රමණය කිරීමේ ලිපිය භාරගෙන අනුමත කොට එම ක්‍රියාව අගය කරනු ලබන බව මෙමඟින් ප්‍රකාශ කරනු ලැබේ."

1415 දී xii වන ග්‍රෙගරි පාප්තුමන් විසින් ඉදිරිපත් කරනු ලැබූ එම ලියවිල්ල භාර ගැනීමෙන් පසුව එම මහඟු ක්‍රියා කලාපය හා බැගෑපත්කම සැලකිල්ලට ගෙන මන්ත්‍රණ සභාව විසින් එතුමන් හට පෝර්ටාහි සාන්ත රුෆීනා නැමැති රදගුරු වසමේ රදගුරුතුමා වන ලෙස ආරාධනය කරනු ලැබිණි. ඉන් අනතුරුව එතුමා තමාගේ නාමය ඇන්ජලෝ කාදිනල් කොරාරියෝ හිමි ලෙස භාවිත කළේය. එතුමා පාප් පදවියට පත් වන විට වයස අවු. 80 ක් වූ අතර එයින් ඉවත් වන විට අවු. 88 ක් ඉක්මවා සිටියේ ය.

ඊට අවුරුදු දෙකකට පසු 1417 අවුරුදු 90 දී එතුමා ස්වර්ගස්ථ විය. එම මන්ත්‍රණ සභාව විසින් පසුව ව්‍යාජ ලෙස පත් වී සිටි viii වන බෙනඩික්ට් නැමැත්තා පිටුවහල් කරන ලදි. නමුත් xii වන ග්‍රෙගරි පාප් තුමා ස්වර්ගස්ථ වීමට පෙර ශුද්ධාසනය වෙත වසර 2 ක් යනතුරු පාප්තුමකු පත්කර ගැනුනේ නැත. පාප් ධුරයෙන් ඉවත් වූ ඇන්ජලෝ කාදිනල් කොරාරියෝ හිමි 1417 ඔක්තෝබර් 18 වන දින මිය යෑමෙන් පසුව නොවැම්බර් 11 වන දින v වන මාර්ටින් පාප්තුමා තෝරා පත් කර ගනු ලැබුවේය.

ඊට පෙරාතුව 1294 ජූලි මස දී සභාවේ 192 වන පාප්තුමා ලෙස පත් වූ v වන සෙලස්ටීන් පාප්තුමා එම වසරේ දෙසැම්බර් 13 වන දින නේප්ල්ස් හිදී ස්ව කැමැත්තෙන් නිල නිෂ්ක්‍රමණය සිදු කළේය. එතුමා ඉතිහාසය තුළ ස්වෙච්ඡාවෙන් පාප් ධුරයෙන් ඉවත් වූ පළමු පාප්තුමා විය. එතුමා තම නිල නිෂ්ක්‍රමණ ලියවිල්ලේ සිය පදවිය අත්හැරීම සඳහා හේතු සාධක ලෙස පහත සඳහන් කරුණු දැක්වූයේය.


"අපි, එනම් v වන සෙලස්ටීන් පාප්තුමන් යෝග්‍ය සහගත කරුණු හේතුකොටගෙන, ඒ කිම්ද යත්, බැගෑපත්කම පෙරදැරිකරගෙන වඩා යෝග්‍ය දිවි පැවැත්මක් හා නොකිළිටි හෘද සාක්ෂියක් පවත්වාගනු සඳහාත්, ශාරීරික දුබලකම හා බුද්ධි ශක්තිය මඳකම නිසාත්, ජනතා අප කීර්තිය හා පෞද්ගලික බෙලහීන බව නිසාත්, අපගේ පෙර ජීවිත පැවැත්මේ සංහිඳියාත්මක බව හා සැනසීම අත්පත්කරගනු සඳහාත්, නිදහසෙන් යුතුව හා ස්ව කැමැත්තෙන් පාප් ධුරයේ නිල නිෂ්ක්‍රමණය සිදු කරන බවත්, ස්ථානය, එහි උතුම් තත්ත්වය, කාර්යභාරය හා ඒ හා බැඳි ගෞරවය අප විසින් සෑජුවම අත්හරින බවත්, සභා නීතියට අනුකූලව විශ්ව සභාවේ දූත සේවකයාණන් පත් කර ගැනීම සඳහා කාදිනල්වරුන්ගේ සංගත සභාව වෙතට අපගේ පූර්ණ හා නිදහස් අධිකාරි බලය පවරා දෙන්නෙමු."

පාප් තුමන් ලෙස පත්වීමට පෙර එතුමා බෙනදිකාන නිකායික තපස්වරයකු ලෙස හා ඉන්පසුව සෙලස්ටීන් නිකායේ ආරම්භක හා එහි මඨාධිපතිවරයා ලෙස කටයුතු කර තිබේ. එතුමා තමාගේ මුල් නාමය වූ පීටර් මොරොන්නි යන නාමය නැවත භාවිතයට ගනිමින් මයෙල්ලා ස්ථානයේ තාපසාරාමය වෙත විශ්‍රාම ගොස් එහි පූර්ණ කාලීන යාච්ඤාව හා නොබිඳුණු ආත්ම දමනයකින් යුතුව කාලය ගත කළේ ය. තම නිල නිෂ්ක්‍රමණය සඳහා එතුමා භාවිත කළේ ඊට පෙරාතුව සිටි x වන ග්‍රෙගරි පාප්තුමා විසින් සම්පාදිත නීති මාලාවකි. එම නීතියට අනුව පාප්තුමකු හට නිල නිෂ්ක්‍රමණය කිරීමට අවකාශය තිබූ අතර පාප් අසුන හිස් වීමෙන් පසුව ඊළඟ පාප් නිලවරණ රහස්‍ය සම්මුති සභාව කැඳවීම දින නවයක කාලයකින් අනතුරුව කළ යුතු යැයි නියමිත කර තිබිණි.

v වන සෙලස්ටීන් පාප්තුමා ශුද්ධාසනය වෙත පත් වන විට එතුමා 79 වන වියෙහි පසු වූ අතර මාස 4 කට පසුව එම ධුරයෙන් ඉවත් වූයේ ය. එතුමා ජීවත්ව සිටියදීම 1294 දෙසැ. 24 වන දින ඊළඟ පාප්තුමා වූ viii වන බොනිෆස් පාප් තුමා පත් කර ගැනිණි. ඉන් වසර දෙකකට පසුව 1296 දී v වන සෙලස්ටීන් පාප්තුමා ස්වර්ග ස්ථ වූයේ ය. 1313 දී එතුමන්ව සාන්තුවර භාවයට ඔසවනු ලැබිණි.

ලබන සතියට »

**කැමිලස්ගේ —— තිත්ත ඇත්ත**



## මීසමෙන් මීසමට

### ප්‍රදීපය අගයයි

එදා මෙන් අදත් කිතුනුවන් වන අපට නොයෙකුත් තාඩන පීඩනවලට මුහුණ දීමට සිදුවී ඇත. පුංචි රෝමය යැයි විරුදාවලිය ලත් මීගමුවෙන් කිතු දහම ඉවත් කිරීමට නොයෙකුත් ප්‍රයත්න දරනවා. ලෝකයේ නොයෙකුත් රටවල රදගුරු තුමන්, පියතුමන් ඝාතනය කෙරෙනවා. අරාබි රටවල කිතු දහම ඇදහීම තහනම් කර ඇත. සතිපතා ඥනාර්ථ ප්‍රදීපය කියවන විට මෙවැනි තොරතුරු අසන්නට ලැබෙන බව ඉරබඩගම මීසම් සේවක ගරු රූපස් හිලරි පියතුමා පැවසීය.

ගරු පියතුමා මේ බව ප්‍රකාශ කළේ පසුගිය ඉරු දිනක ඉරබඩගම මීසමේ දේවස්ථානවල පැවති දේව මෙහෙයයකදීය. තවදුරටත් දේශනය කළ ගරු පියතුමා මෙසේද පැවසීය. කතෝලික දෙව්මැඳුරු අසල පිහිටි රජයට පවරාගත් ඇතැම් පාසල්වල කතෝලික නම ඉවත්වී ඇත. ප්‍රතිමා කඩා දැමීම් දෙව්මැඳුරු ගිනි තැබීම් අසන්නට ලැබේ.

**පෝල් විජේතුංග**



හලාවත වට්ටක්කල්ලිය හා. ජුසේ වාස් මුනිඳුන්ගේ මංගල්‍යය සඳහා තරුණ කැල විසින් ඉදිරිපත් කරන ලද අන්නාසි හා බඩඉරිඟු තොරනයි මේ.

**පර්සි ප්‍රනාන්දු**

# අපගේ ඇතුලාන්ත ජීවිතය වෙනස් කර ගැනීමට වරප්‍රසාද සහිත කාලයක් උදාවෙලා!

## කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමි පවසයි

**අපගේ ඇතුලාන්ත ජීවිතය වෙනස් කර ගැනීමට වඩාත් සුදුසුම වරප්‍රසාද සහිත චතාරික කාලයත් උදාවෙලා තිබෙන බවත් බාහිර ආටෝපයෙන් තොරව ඇතුලාන්ත ජීවිත පරිවර්තනයක් සඳහා සිත් හැරීමකට ක්‍රියාකරන ලෙස කුරුණෑගල සා. ආනා ආසන දෙව්මැඳුරේදී 'අළු බදාදා' විශේෂ දිව්‍ය පූජාවට සහභාගි වෙමින් කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ ප්‍රකාශ කළහ.**

වර්තමානයේ තම පවුල් ජපමාල උච්චාරණය යාච්ඤාව පසෙකලා රූපවාහිනි වැඩ සටහන් නැරඹීමට ප්‍රමුඛස්ථානයක් දීම කණගාටුවට කරුනක් බව වැඩිදුරටත් පැවසූ රදගුරු හිමිපාණෝ අසල්වැසියාගේ දුකේදී මරණයේදී දුක්වීම කණගාටුවීම වෙනුවට ඔවුන්ගේ මරණ වලදී රතිඤ්ඤා පත්තු කිරීමේ සංස්කෘතියක් ගොඩනැගීම කනගාටුදායක බවත් පැවසූහ.

කුරුණෑගල සා. ආනා ආසනදෙව් මැඳුරේ පැවති 'අළු බදාදා' විශේෂ දිව්‍ය පූජාවට කුරුණෑගල මීසම් සේවක ගරු ජේකබ් පෙරේරා හා සහයක ගරු ප්‍රියන්ත පියතුමන්ද සහභාගි විය.

**බී. කේ. ටී. රෙජිනෝල්ඩ්**

# විශ්වාසයේ වසරේ අපගේ විශ්වාසය බිඳ වැටී ඇත්තේ කොතැනද?

මෙම විශ්වාසයේ වසරේ අපගේ විශ්වාසය බිඳ වැටි ඇත්තේ කොතැනද යන්න සොයාගෙන, අසල්වැසියාගෙත් විශ්වාසය වැඩි කරන්න. කතෝලික ජනතාව තුළ ස්වාමින්වහන්සේව ජීවමාන නොමැති නිසයි දෙව්මඳුර අත්හැර රඟහලට පිරෙන්නේ. එනිසයි අද ලූර්දු මාතාවන්ට කැපවී තිබෙන මෙම ලුණුගල නගරයේ ලස්සන වගේම ජනතා හදවත් ලස්සන කරගැනීමට හදවත්වල මකුළුදැල් කඩා, ස්වාමින් වහන්සේට ලැගුම්ග න්න. වැරදි ඇති තැනින් හරිමගට හැරෙන්න යැයි ලුණුගල ලූර්දු මාතා මංගල්ලයේදී, සහායක ගරු මාලන් ඇන්තනි පියනම පැවසීය.


කොඩිගස එසවීමෙන් නුවාන ආරම්භ වූ අතර, දේශන සඳහා නිමල මරිය නිකායේ ගරු ජේසුදාසන් පියනම පැමිණියේය. මීසමේ සියලුම සමිති සමාගම් මංගල්ලය සාර්ථක කර ගැනීමට, මීසම් සේවක ගරු ඉයුජින් (නි.ම.නි) පියතුමාට සහාය වූහ. සන්ධ්‍යා මෙහෙය අනුනායක අතිගරු මාර්ෂල් රාජනායගම් සහ ගරු ලක්ෂමන් රණසිංහ පියතුමන් ඇතුළු පදවියේ පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මංගල්ලය යාපනයේ නිර්මල මරිය නිකා ප්‍රදේශාධිපති ගරු පෝල් නට්චෙත්තරම් පියනම සහ ගරු පියතුමන්ලා කීපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වූහ.




මත්තුමගල සා. වින්සන් ද පාවුලා ශ්‍රී හෘද කොන්පරන්සයේ මහ සභා රැස්වීම දිසාවේ ආත්මික අධ්‍යක්ෂ ගරු රෝෂන් ප්‍රසාද් මීසම් සේවක ගරු ඇන්සලම් ශිරාන් පියතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ. ඉන්පසු සමාජිකාවන් ප්‍රදීප කැමරාව හමුවේ පෙනී සිටි අයුරු.

**බර්ටි**

# යාපනයේ වඩමාරච්චි - කරවෙඩ්ඩි පාදනමස්කාර පුදබිම






ශ්‍රී ලංකාවේ උතුරු කරයේ අගනගරය වශයෙන් හැඳින්වෙන යාපනය නගරයට කිලෝමීටර් විස්සක් පමණ ඔබ්බෙන් වඩමාරච්චි - කරවෙඩ්ඩි කල්වාරි පුදබිම පිහිටා ඇත.

වඩමාරච්චියේ ඇති එකම කතෝලික දෙව්මැඳුර සා. අන්තෝනිමුනිතුමා නමින් කැපකර තිබිණි. වඩමාරච්චි, කරවෙඩ්ඩිහි නිහඬ, ශාන්ත පරිසරයක ශාන්ත අන්තෝනි දෙව්මැඳුරු භූමියේ මෙම පාදනමස්කාර පහසුකම් ඇති අතර දෙව්මවුන් සිය පුතණුවන්ගේ කුරුසයෙන් බාන ලද සිරුර උකුලේ හොවා ගෙන සිටින ප්‍රතිමාවක්ද වේ. පාලක පියවරුන්ගේ මැදිහත්වීම මත මෙම පාදනමස්කාර ස්ථානය වැඩිදියුණු කිරීම බලාපොරොත්තුවේ. 2003 දී ගරු අන්තෝනි දාස් පියතුමා මෙම කල්වාරි පුදබිම පිළිබඳ මූලිකත්වය ගත්තේය. වසර ගණනක යුද්ධය නිසා කලකිරි සිත්වේදනාවට පත්ව සිටි ජනතාව කුරුසියේ ජේසු විදි වේදනාව හා සමානව එය තේරුම් ගෙන තිබේ.

කරවෙඩ්ඩි මීසම් ජනතාවගේ සහය ඇතිව කල්වාරිය තනා නිම කර යාපනයේ කරිටාස් අධ්‍යක්ෂ, කරවෙඩ්ඩි මීසම් පුතකු වන ගරු සී. ඒ. ජයකුමාර පියතුමා ආසිරි ගන්වා විවෘත කළේය.

පාස්කු සමයේ 6 සිකුරාදා මේ දෙව්මැඳුරේ මංගල්‍යය පැවැත්වේ. මෙයට සූදානමක් ලෙස පූර්ව දින තුනක පාදනමස්කාරය හා දිව්‍ය පූජාව පැවැත්වේ. මංගල්‍ය දින ජනතාව තම පව් සමාකර ගනිමින් දිව්‍ය යාගයට සහභාගි වෙති. මංගල දින උදේ දිව්‍ය සත්ප්‍රසාදය හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ද පැවැත්වේ. සවස කල්වාරි භූමියේ පාදනමස්කාරය හා දිව්‍ය යාගය පවත්වා උත්සවය අවසන් කෙරේ. පේදුරු තුඩුව, අච්චුවේලි, සංකේකෝට්ටේ හා විරුඔවිල් යන මීසම්වල ජනතාවද මෙම උත්සවයට සහභාගි වෙති.

මංගල්‍යයට සහභාගිවන සියල්ලන්ටම දිවා ආහාර ආදී පහසුකම්ද සලසනු ලැබේ. හැම මාසයේම පළමු සිකුරාදා දිව්‍ය යාගය පැවැත්වේ. මෙහි විශේෂත්වය ආගම්, ජාති භේද වලින් තොරව ජනතාව පැමිණීමය.

යාපනයේ වඩමාරච්චි - කරවෙඩ්ඩි කල්වාරි පුදබිම ගැන වැඩිවිස්තර පහත සඳහන් ලිපිනයෙන් හා දුරකථන අංකය ඔස්සේ විමසීමෙන් ලබාගැනීමට පුළුවන.

ගරු එමිල් පෝල් පියතුමා, මීසම් භාර පියතුමා, කල්වාරි, සා. අන්තෝනි දෙව්මැඳුර, කරවෙඩ්ඩි. දුර : 021-2263118 (ශ්‍රී ලංකාවේ කල්වාරි ග්‍රන්ථයෙනි)

**මැක්සිමස් රෝයි පෙරේරා**

# "පොදු ජනතාවගෙන් තෝරාගෙන උසස් බවට පත් කළා"

**කිතු සමිඳාණන්ගේ ගෝලයන්ගෙන් බහුතරය ධීවර කාර්මිකයන්. ඒ මසුන් අල්ලන්නන් මිනිසුන් දිනන්නන් බවට පත්කළා. දස දෙස ගොස් සුභාරංචිය දේශනා කර දේව රාජ්‍ය පතළ කිරීමට වරම් ලැබ සාමාන්‍ය පොදු ජනතාවගෙන් ශ්‍රාවකයන් තෝරා ගෙන ඔවුන් උසස් තත්ත්වයට පත් කර ආදර්ශයක් දුන්නායයි රත්නපුර පදවියේ නව ධර්මෝපදේශ හා ජනවන්දනා අධ්‍යක්ෂ ගරු හරිහරන් රාජප්‍රිය පියතුමා රත්නපුර මීසමේ දහම් පාසල් දරුවන් හා වැඩිහිටියන් අමතමින් පැවසීය.**

රත්නපුර මීසම් සේවක ගරු රන්ජන්මාල් මොරායස් හා සහයක ගරු ගේබ්‍රියෙල් නික්ලස් පියවරුන්ගේ සහභාගිත්වයෙන් දේව මෙහෙය පැවැත්විණි.

2012 වසරේ වැඩිම ලකුණු ලබාගත් දහම් පාසල් සිසුන්ට සහතික පිරිනැමීමද සිදුකළ අතර සැම පන්තියකම නිරීක්ෂණ චාරිකාවකද තියැලුනි.

**තියබෝල්ඩ් සමරතුංග**



දැලතුර සෙත් සරණ සමිතියට අවුරුදු දෙකක් පිරීම නිමිත්තෙන් විශේෂ උත්සවයක් සෙත්සරණ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් හා මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමන් සහභාගිත්වයෙන් සිදු කෙරින. ප්‍රගති වාර්තාව බරදුන් අවස්ථාව.

**ඩබ්. ටී. සී. පෙරේරා**

# 'අද කඩලාන සා. අන්තෝනි විදුහල දීර්ඝ නින්දෙන් නැගිටලා'



දරුවකු නිදාගෙන සිටින විට කාගෙවත් අවධානයට ඒ දරුවා ලක් වන්නේ නෑ. නමුත් දරුවා නැගිටලා අඬන කොට දඟලන විට අවට සිටින අයගේ අවධානය ඒ දරුවා වෙතට යනවා. අද කඩලාන සා. අන්තෝනි විදුහලත් නැගිට සිටීම නිසා අවට අයගේ අවධානයට ලක්වී තිබෙනවා. එය මට මහත් සතුටක් බව කඩලාන සා. අන්තෝනි විදුහලේ වාර්ෂික ක්‍රීඩා උත්සවය අමතා මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමා ප්‍රකාශ කළේය.

ක්‍රීඩා උත්සවයේ විශේෂ ආරාධිත අමුත්තා වූ එම විදුහලේ ආදි ශිෂ්‍ය සුපිරි දඟ පන්දු යවන අජන්ත මෙන්ඩිස් මහතා ප්‍රකාශ කළේ විදුහලේ ක්‍රිකට් දියුණු කරන්නට අත හිත දෙන බවය. විදුහල්පති කපිතාන් රවින්ද්‍ර ජේ. ඇන්ටනි මහතා ආචාර්ය මණ්ඩලය දෙමාපියන් හා ආදි සිසුන් හා එක්ව මෙම උත්සවය ඉතාමත් අලංකාරව සංවිධානය කර තිබුණි.

**සුමිත් මාර්ක් ද සිල්වා**


# සමුදුර දූ පුතුන්ට නව නිවහනක්

රත්මලාන සා. මරියා දෙව්මැඳුර අවට ධීවර දෙමව්පියන්ගේ දූ පුතුන් හට අධ්‍යාපන කටයුතු සඳහා ශු. පවුලේ පැවිදි සොහොයුරියන් විසින් ගොඩනැගූ 'සමුදුරු නිවහන' මීසම් සේවක ගරු රොනී වික්‍රමසිංහ පියතුමා ආසිරි ගැන්විය.

ගිය වසරේ සිට සමුදුරු දූ පුතුන්ගේ අධ්‍යාපනය ගැන සොයා බලමින් කටයුතු කළ ගරු කැනිස් ප්‍රනාන්දු පැවිදි සොයුරිය එය විවෘත කළ අතර පංති කාමරය නවීකරණය කිරිමට බරපැන විවිධ මාර්ග වලින් සපයා දුන්නාය.

බිම වාඩි වී අකුරු කළ අපට මේස බංකු ලබාදීමට කාරුණික වූ බුද්ධි අංශයේ නාලක මහතාටද වහලය සාදා ගැනීමට දායක වූ ක්‍රිස්තු අසල් වැසියෝ සාමාජික සැමටද, පුංචි අපට ආහාර සැපයූ Software ආයතනයේ සැමටද ස්තූති කළාය.

සැම දිනක විවිධ විෂයයන් ඉගැන්වීම සඳහා ගුරුවරු පැමිණෙන බවත් ස්වයං රැකියාවන්ට යොමු කිරීමේ අරමුණින් මැහුම් පංති ආරම්භ කරන බවත් ආගම් භේදයක් නොමැතිව දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ අධ්‍යාත්මිකත්වය ගොඩනැගීම සඳහා දියත් කරන මේ වැඩ සටහන පිළිබඳව දෙමව්පියන්ට විශාල වගකීමක් පැවරෙන බවත් ගරු ඉරේෂා පැවිදි සොයුරිය පෙන්වා දුන්නාය.



**ප්‍රේමා හීනටිගල**

ක්‍රිස්තු වර්ෂ 2013 පෙබරවාරි 24 ඉරිදා

ඥානාර්ථ ප්‍රදීපය

# සසුන් පිය උපහාර

**අති උතුම් සොලොස්වන බෙනඩික් සසුනිසුරාණන් වෙනුවෙනි**

## විශේෂ අතිරේකය



# සසුන් පිය නමකට විශ්‍රාම යා හැකිද?

දහසයවෙනි බෙනඩික් පාප්තුමන්. තමන් පෙබරවාරි මස 28 වෙනිදා විශ්‍රාම යෑමට තීරණය කර ඇති බව පසුගිය 11 වෙනිදා කාදිනල් මණ්ඩලය ඉදිරියේ දැනුම්දීමත් සමගම, බොහෝ දෙනෙක් කියා සිටියේ මෙය කිසිසේත්ම බලාපොරොත්තු නොවූ ප්‍රවෘත්තියක් බවය. උන්වහන්සේගේ විශ්‍රාම යෑම පිළිබඳව ලෝකය පුරා විවිධ ක්ෂේත්‍රයන් තුළින් විවිධ මත ප්‍රකාශ වූවත්, ඒ සඳහා උන්වහන්සේ හේතු දක්වමින් කියා සිටියේ දෙවියන් වහන්සේ ඉදිරියේ තමන්ගේ හෘදය සාක්ෂිය බොහෝ වාරයක් පිරික්සා බැලීමෙන් පසු, තමන්ගේ වියපත්වීම නිසා, තමනට පැවරී ඇති දූත සේවාව ඉටුකිරීමට අවැසි ශක්තිය නොමැති බව වටහා ගැනීමෙන් පසුව මෙම තීරණය කරා එළඹි බවයි.

2005 අප්‍රේල් මස 19 දින කාදිනල් මණ්ඩලය විසින් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිමිපාණන් පාප් නිලය සඳහා පත් කරගැනීමෙන් පසුව, දහසය වෙනි බෙනඩික් නමින් පාප්ධූරය බාරගත් එතුමා, දැන් 85 වෙනි වියෙහි පසුවෙයි. ‘පාප් වහන්සේ කෙනෙකුට විශ්‍රාම යා හැකිද?’ යන්න මේ සිද්ධියත් සමග බොහෝ දෙනෙක් අසන ප්‍රශ්නයකි. මෙසේ ප්‍රශ්න කිරීමට මූලික හේතුව මෑත ඉතිහාසයේ මෙවැනි සිදුවීමක් වාර්තා නොවූ නිසාය.

නමුත් පාප් තුමකු විශ්‍රාම යෑම හෝ ධූරයෙන් ඉල්ලා අස්වීම සහා ඉගැන්වීම් වලට හා සාසන නීතියට අලුත් දෙයක් නොවේ. සාසන නීති සංග්‍රහයේ 332/2 නීති වගන්තියේ සඳහන් වන ආකාරයට, පාප්වහන්සේ තමන්ගේ පදවියෙන් විශ්‍රාම යෑමක් සිදුවිය යුතුනම්, එහි වලංගුභාවය සඳහා එම විශ්‍රාම යෑම නිදහස්ව හා නිසිලෙස ප්‍රකාශයට පත්කළ යුතු අතර, එය කිසිවකු විසින් පිළිගැනීම අවශ්‍ය නොවේ.

ඒ අනුව මෙම සාසන නීති වගන්තිය පැහැදිළිවම පාප්වහන්සේට තමන්ගේ කැමැත්තෙන් විශ්‍රාම යෑම නිදහස්ව හා නිසිලෙස ප්‍රකාශයට පත්කළ යුතු අතර, එය කිසිවකු විසින් පිළිගැනීම් අවශ්‍ය නොවේ. ඒ අනුව මෙම සාසන නීති වගන්තිය පැහැදිළිවම පාප්වහන්සේට තමන්ගේ කැමැත්තෙන් විශ්‍රාම යෑම හෝ සේවයෙන් අස්වීම කළ හැකි බැව් පෙන්වා දෙයි.

එම තීරණය කිසිවකුගේ බලපෑමට හෝ බලකිරීමකට යටත් නොවී නිදහසින් ගතයුතු තීරණයකි. එහි වලංගුතාවය සඳහා අවශ්‍ය වන්නේ කුමන හෝ ආකාරයකින් හෝ සභාවට දන්වා සිටීම පමණි. ඒ අනුව දහසයවෙනි බෙනඩික්ට් පාප්තුමා රැස්ව සිටි කාදිනල් මණ්ඩලය ඉදිරියේ තම විශ්‍රාම යෑම ප්‍රකාශ කිරීමත් සමගම එම ප්‍රකාශය වලංගුවේ.

සභා ඉතිහාසය තුළ පාප්තුමන්ලා 10 දෙනෙකුගේ පමණ ඉල්ලා අස්වීම් හා විශ්‍රාම යෑම් සඳහන් වී ඇතත්, ඒ අතුරින් පස්වෙනි සෙලෙස්ටියන් පාප්තුමන්ගේ ඉල්ලා අස්වීම පමණක් ඉතා පැහැදිළි ලෙස වාර්තා වී ඇත.

සභාව තුළ සාම්ප්‍රදායික විශ්වාසයට මුල් තැනක් දුන් දහසයවෙනි බෙනඩික්ට් පාප්තුමා දේවධර්මාචාර්යවරයෙකි, භාවනානුයෝගී චින්තකයෙකි, ග්‍රන්ථ කතුවරයෙකි, විශ්ව විද්‍යාල කථිකාචාර්ය වරයෙකි. ඒ හැමදේකටම වඩා තම අදහස් පැහැදිලිව හා නිර්භයව ප්‍රකාශ කරමින් කිතුනු විශ්වාසය ප්‍රකාශ කරමින් ආරක්ෂා කළ සභා එඬේරෙකි.

එක්දාස් නවසිය හැත්තෑව දශකයේ අගභාගය වනතුරු ජෝශප් රැට්සිංගර් එතරම් කතාබහට හෝ කාගේවත් අවධානයට ලක්වූ පුද්ගලයකු නොවේ. 1927 අප්‍රේල් මස 16 වෙනි දින ජර්මනියේ බැවේරියාවේ උපත ලද මෙතුමා, දරු තුන්දෙනෙකුගෙන් යුත් පවුලේ බාලයාය. දොළොස් වෙන වියේදී තම වැඩිමහල් සොහොයුරාගේ අඩිපාරේ යමින්, පූජකවරය පතා දෙවිසත් හලට ඇතුළත් විය. එදා පැවති ලෝක යුද්ධය නිසා, පූජක පුහුණු කාලය තුළ නොයෙක් කරදර බාධකවලට මුහුණ දුන්නත්, 1951 දී පූජකවරය ලැබීය.

1977 දී මෙතුමා මියුනිච් නගරයේ අගරදගුරු පදවියට පත්ව, පසුව හයවෙනි පාවුළු පාප්තුමන් විසින් කාදිනල් ධූරය සඳහා නම් කරන ලදි. පසුව දෙවන ජුවාම් පාවුළු පාප්තුමාගේ ආරාධනයෙන් වතිකානයේ පරිපාලන කටයුතු වලට හවුල් වූයේය. දෙවන ජුවාම් පාවුළු පාප්තුමා ස්වර්ගස්ථ වෙද්දී, රැට්සිංගර් කාදිනල් තුමා, කාදිනල් මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් හා කිතුනු විශ්වාසය පිළිබඳ වතිකාන සංසදයේ ප්‍රධානියා ලෙස කටයුතු කරමින් සිටියේය.

දොළොස්වන බෙනඩික් පාප්තුමා විශ්‍රාම යෑමෙන් පසු, ආශ්‍රමික ජීවිතයක් ගත කරන බවත්. මීලග පාප්වරණය සඳහා සහභාගි නොවන බවත් ප්‍රකාශ කළ බව විශ්වාස කටයුතු මාර්ගවලින් හෙළිදරව් කර ඇත.

## පවුල වෙනුවෙන් ඔබ නැගු හඬ

ලොව තුළ සැබෑ වෙනසක් කළ හැකි  එකම
බලවේගය යනුවෙන් පෙම පිරි  පරම
මහිමය පවුල් දිවියේ පළකල  තරම
මතකය ලැබූ ඔබ සුදොතුම් පිය  වරම

යහපත පිණිස අනෙකාගේ විටම  හැම
රැඳෙමින් චමත්කාරය තුළ පිරුණු  පෙම
රකිමින් ගරුත්වය දෙදෙනා ලෙසම  සම
විඳගන්නටය කීවේ දිවි මිහිර  අම

නිරතුරු සබැඳෙමින් සමගින් සමිඳු  දෙවී
ගෙවමින් එකිනෙකා තුළ නිරතුරුව  දිවී
අයහට ඇද වැටෙන ලැබදී නොමඳ  සවී
අපි ගතකරමු අනෙකා හට තිළිණ  වෙවී

අඹු සැමි දෙදෙන මෙන් දරුවන්  සම්පත්‍ය
ප්‍රේමය තුළම රැඳෙතොත් පෙම  ඉමහත්‍ය
බාදක පවුල වෙත ඇති අද  බලවත්‍ය
ඉන් ජය ලැබෙනුයේ පෙම තුළ  රැඳුනොත්‍ය

අභියෝගයක් අද දින මෙම  කැඳවීම
සැමවිට එකිනෙකා තුළ ජීවත්  වීම
සහයෝගයද විශ්වාසය  වගකීම
තුළ දුරුකරමු පවුලට ඇති  බලපෑම

ඉරුදින මිනිස් දිවිමාවත කරන  ඔප
දිනයක් බවට පත්කර නොවිඳින  සැප
නිවමින් පවස දෙවිඳුන් වෙත තුළැති  අප
මෙදවස පවුල වෙනුවෙන් අපි කරමු  කැප

සත්වන පවුල් හමුවේදී මෙලෙස  ලොව
මතකය සසුන් පියසඳ පළකෙරුව  බව
පාසල ප්‍රථම මෙම ලොව වෙත ගෙනෙන  සුව
බලවේගයයි මෙහි ලෝකය මවන  නව

අපගේ සසුන් පිය සඳ මෙම ඉසිඹු  ලද
පෙන්වූ මාවතේ සතුටින් පිරෙන  හද
පියවර තබා නිවැරදි ආකල්ප  මැද
මුළු හදවතින් බැතියෙන් තුති කරමු  පුද

**පස්කල් ජයමාන්න** - උස්වැටකෙයියාව

## දීගායු ලැබ සිටිනු සුවයෙන්


සොළොස්වන බෙනඩික්  නමින්
සබා එඬේරාණන්  වෙමින්
සභාව පෙරට ගෙන  යමින්
වගකීම් ඉටු කළේ  මැනවින්

දේව විශ්වාසය ජනිත  කරමින්
සබා මාතාවෝ ඉහළ  තබමින්
සැදැහැ ජන සිත් දිනා  ගනිමින්
දෙව් සේවයේ යෙදුනි  බැතියෙන්

අට මසක් දෙව් කිරුළ  දරමින්
ප්‍රශ්න හමුවේ නොසැලී  ඉදිමින්
සෙත සැලසුවා දේව  වරමින්
අපේ මතකයෙ සදා  රැඳෙමින්

ප්‍රසාදය මුළු ලොවෙන්  ලබමින්
යන ගමන ‘හිමි’ ඉසිඹු  ලබමින්
පියෙකි බෙනඩික් උතුම්  සුදොතුම්
දිගායු ලැබ සිටිනු  සුවයෙන්

**ඩබ්ලිව්. තිලක් ප්‍රනාන්දු**
කොරළවැල්ල



සසුන් පිය උපහාර

විශේෂ අතිරේකය

ශ්‍රද්ධානාථ ප්‍රදීපය

# සභා ඉතිහාසය තුළ ඉසිඹු ලැබූ ශුද්ධෝත්තම පියවරු........

**අති උත්තම සොළොස්වන බෙනදික් ශුද්ධෝත්තම පියතුමා විසින් පසුගියදා ප්‍රකාශ කරන ලද නිවේදනයට අනුව උන්වහන්සේ මෙම මස අවසානයේදී, විශ්‍රාම යාමට නියමිතය. ශුද්ධෝත්තම පියතුමාණන්ගේ විශ්‍රාම යෑම පිළිබඳ නිවේදනය මාධ්‍ය හරහා ලොවට ප්‍රකාශ කළ මොහොතේ සිටම කිතුනුවන් වන අපද, සෙසු ලෝකයාද, අසන ප්‍රශ්න අතර 'මෙලෙස ශුද්ධෝත්තම පියතුමකුට විශ්‍රාම යා හැකිද? යන්න පවතී. මුලින්ම ප්‍රකාශ කළ යුතු වන්නේ "ශුද්ධෝත්තම පියතුමකු විශ්‍රාම යන පළමු අවස්ථාව මෙය නොවන බවයි."**

ශු. සභා ඉතිහාසය දෙස විමසිලිමත් ව බැලීමේදී අවස්ථා 11 ක ශුද්ධෝත්තම පියතුමන්ලා ස්වකැමැත්තෙන් ඉසිඹු ලබා ඇත. ඉන් පළමුවැන්න අපට වාර්තා ගත වන්නේ ශු. ක්ලෙමන්ට් (88-97) අතර ශුද්ධාසනයේ වැඩහුන් සභාවේ 04 වන පාප්තුමාගේ ස්වකැමැත්තෙන් විශ්‍රාම ලැබීමත් සමගය. එතුමන් විශ්‍රාම යාමට ප්‍රබලව බලපෑ හේතුව වූයේ පෙරදිග සභාවන් එතුමාගේ නායකත්වය ප්‍රතික්ෂේප කිරීමය.

මෙහිදී වාර්තාගතව ඇති තොරතුරු වලට අනුව ශු. ජොහාන් අපෝස්තුළු තුමා ජීවත්ව සිටි බව සඳහන් වේ. එම නිසා එම අපෝස්තුළුවරයා ජීවත්ව සිටි නිසා පෙරදිග සභාව (නැගෙනහිර, ආසියාතික සභා) ජොහාන් අපෝස්තුළුවරයාගේ නායකත්වය පිළිගත් අතර, රෝමානු නායකත්වය (බටහිර සභා නායකත්වය) ප්‍රතික්ෂේප කිරීම නිසා, ශු. ක්ලෙමන්ට් පාප්තුමා තම මරණයට පෙර ඉසිඹු ලැබූ බව සඳහන් වේ. දෙවන අවස්ථාව ලෙස හැඳින්වෙන්නේ ක්‍රි.ව. 230-235 අතර පාප්ධූරය දැරූ ශු. පොන්සියානස් පාප්තුමාගේ විශ්‍රාම යාමය. මේ කාලයේදී සභාවට එරෙහි ව මැක්සිමින් අගරජ පීඩන එල්ල කළ යුගයක් වූ අතර. හිපොලිටස් නැමති සභාපිතෘවරයා, සභාවේ යම් යම් මතවාදයන්ට එරෙහි නැගී සිටි අවධියකි. මේ කාලයේ දී අගරජගෙන් හා සභාවේ ප්‍රධානින්ගෙන් මතුවු යම් යම් බලපෑම් හමුවේ නිවැරදි දැක්ම තමන් ඉසිඹු ලැබීම බව සිතූ ශු. පොන්සියාන ඒ පාප්තුමා වසර 05 සිය ධූරය නිම කොට විශ්‍රාම ගත්තේය.

තෙවන අවස්ථාව ලෙස ඉතිහාසගතව ඇත්තේ ක්‍රි.ව. 536-537 ත් අතර කාලයේ පාප්ධූරය දැරූ ශු. සිල්වේරියුස් පාප්තුමාගේ විශ්‍රාම යාමයි. එතුමා ශු. සභාවේ 58 වන පාප්තුමා වූ අතර සභාව පාලනය කළේ මාස 9 ක කාලයක් පමණි. වර්ෂ 536 ජූනි 08 වන දින එතුමා පාප්ධූරයට තේරිපත් වන විට එතුමා තේවාචාර්යවරයකුව සිටියේය. මෙතුමාගේ ඉසිඹු ලැබීමට ප්‍රබලව බලපෑවේ අධිරාජ්‍යවාදියාගේ බලපෑම්ය. මන්ද මිථ්‍යා මතධාරි පෙරදිග රදගුරුවරුන් පිරිසක්, කිසිදු අධ්‍යයනයකට හෝ විශ්වාසය සම්බන්ධ තහවුරු කිරීමක් නොකර සභාවට ඇතුළු කර ගන්නා ලෙස ජස්ටිනියන් අගරජ හා තියෝඩෝරා බිසව ශුද්ධෝත්තම පියතුමාට බලකර සිටීමය. මන්ද පෙරදිග හා බටහිර සභා භේදය මුල් යුගයේ සිටම විකාශනයව පැවති අතර ඉගැන්වීමේ හා සභා ගුරුබලයේ ද වෙනස්කම් දක්නට ලැබීම මෙහි විශේෂත්වයකි. මෙහිදී සිල්වේරියුස් පාප්තුමා 'ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ විශ්වාසය කිසිසේත්ම පාවා නොදෙන බව එඩිතරව ම ප්‍රකාශ කළේය. මේ නිසාම වඩා නිවැරදි වන්නේ අගරජට නොව ස්වාමින් වහන්සේට අවනත වීම බව පසක් කරගත් සිල්වේරියුස් ශු. පියතුමා සිව් වසරක තම පාලන ධූරය අවසන් කොට විශ්‍රාම ගත්තේය. මීළඟ සිව්වන අවස්ථාව ලෙස ක්‍රි.ව. 795-816 අතර පාප්ධූරය ඉසිලූ ශු. III වන ලියෝ පාප්තුමා නම් කළ හැකිය. වසර 21 ක් සභාව පාලනය කළ මෙතුමා හට එකල විසූ රෝම ප්‍රභූවරුන්ගේ විරෝධතා හා බලපෑම් ඉතා ප්‍රබල ව පැවති අතර, එක් වරක් එතුමන්ව ජීවිතක්ෂයට පත් කිරීමට ද ඇතැමෙක් පියවර ගත්තේය. මේ නිසා මහා චාර්ල්ස් අගරජගේ මරණින් පසුව ක්‍රි.ව. 816 ජූනි 12 වන දින මෙතුමා ඉසිඹු ලැබීය.

පස්වන අවස්ථාව ලෙස ක්‍රි.ව. 897 අගෝස්තු මස පත් වූ රොමානස් පාප්තුමා නම් කළ හැකිය. එතුමා සභාව පාලනය කළේ මාස තුනක් පමණි. එතුමා වනාහි තාපසවරයෙකි. මේ නිසා ඇතැම් කාදිනල් වරුන්ගේ හා සභා මූලිකයන්ගේ තීරණ හා මෙතුමාගේ ප්‍රතිපත්ති නොගැලපුනි. එම නිසා තෙමසකට පමණක් සීමා වූ සිය ධූර කාලය නිමා කොට එතුමා 897 වසරේ නොවැම්බරයේම විශ්‍රාම ගනු ලැබීය. සය වන අවස්ථාව ලෙස ක්‍රි.ව. 914-928 අතර කාලයේ විසූ දසවැනි ජුවාම් ශුද්ධෝත්තම පියතුමා නම් කළ හැකිය. එතුමාගේ පාලන සමය වසර 14 කට සීමාවූ අතර ක්‍රි.ව. 928 මැයි මාසයේ දී එතුමන් විශ්‍රාම යාමට බලපෑවේ රෝම ප්‍රභූවරුන්ගේ විරෝධයන් හා බලපෑම්ය. පසුව මෙතුමන්ව සිරගත කොට ඝාතනය කරන ලද බව කියැවේ. හත්වන අවස්ථාව ලෙස ඉතිහාසගත වන්නේ දොළොස්වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමාය. මේ කාලයේ දී සභාව ලෞකික කරුණු කාරණා මත දූෂණය වී තිබූ අතර පාප්තුමන් පත්වීමද, දැඩි දෝෂදර්ශයට තුඩුදුන් කරුණක් විය. මේ නිසාම මෙම පාප්තුමන්ගේ පත්වීම හා හැසිරීම් රටාව ගැන පූජාප්‍රසාදිවරුන්, රදගුරුවරුන් හා රෝම ප්‍රභූ මණ්ඩලය විසින් දැක්වූ දැඩි විරෝධතා මත ක්‍රි.ව. 964 දී එතුමන්ට විශ්‍රාම ගැනීමට සිදුවිය.

මීළඟ අවස්ථාව ලෙස සඳහන් වන්නේ ක්‍රි.ව. 1003-1009 අතර පාප්ධූරය දැරූ 18 වැනි ජුවාම් ශුද්ධෝත්තම පියතුමාගේ විශ්‍රාම යෑමය. එතුමාගේ පාලන සමය වසර 08 සීමා වූ අතර එතුමා තාපසවරයකු වීම සඳහා පාප්ධූරය ප්‍රතික්ෂේප කොට ඉසිඹු ලැබූ බව සඳහන් වේ. මීළඟට ලැබෙන තොරතුරු අනුව තෙවතාවක් පාප්ධූරයේ රැඳී සිටි හා විවිධ හේතු මත අස් වූ, විටෙක දේශපාලනික වශයෙන් නැවත පත් වූ පාප්තුමකු ලෙස 9 වන බෙනදික් පාප්තුමා නම් කළ හැක. මේ කාලයේදී සභාව හා රෝම අධිරාජ්‍යය එකක් ලෙස තිබූ හෙයින්, සභාව තුළ ද ලෞකික ලක්ෂන බෙහෙවින් දක්නට ලැබුනි. මේ කාලයේ දී පාප්ධූරය පරිහානියට පත් වූ යුගය ලෙසද හැඳින්වේ. 9 වන බෙනදික් පාප්තුමාගේ පාලන සමය ක්‍රි.ව. 1003-1009, 1032-1044, 1045 මාර්තු 10 - මැයි 01 දක්වා ද, 1047 නොවැම්බර් - 1048 ජූලි 16 දක්වා ද විහිදී තිබුනි.

මීළඟ අවස්ථාව ලෙස ක්‍රි.ව. 1294 අගෝස්තු 29 වන දින සිට එම වසරේම දෙසැම්බර් 13 වන දින දක්වා පාප්ධූරය ඉසිලූ ශු. පස්වන සෙලෙස්ටීන් පාප්තුමන් නම් 'කළ හැක. ඉතා දිළිඳු පවුලකට ආව උපන් මෙතුමා අවු. 17 දී බෙනදිකාන තාපසවරයෙකු වී වයස අවුරුදු 24 දී රෝමයේ දී පූජකවරම් ලැබීය. නිරතුරුවම යාච්ඤාවේ දිවියකට ප්‍රිය කළ මෙතුමා මොන්ටේ මොරෝන්හි පාලුකරය වෙත ගිය අතර, ඉරුදින හැරෙන්නට අනිකුත් සෑම දිනයකම එක්වරු ශීලය රැකි අතර එතුමන්ගේ ආහාරය වූයේ පාන් කැබැල්ලක් හා වතුර පොදක් පමණි. කල්යත් ම එතුමා අනුගාමී වූ පිරිස් ද 600 පමණ විසූ බව සඳහන් වේ. ක්‍රි.ව. 1294 ජූලි 05 වන දින පෙරුජියානි රැස්වූ කාදිනල්වරුන් පීටර් මොරෝන් හිමියන් (V වන සෙල්ටීන් පාප්තුමාගේ නාමය) පාප් ධූරයට පත්කළ යුතු බව තීරණය කොට එතුමාගේ විරෝධතාව මධ්‍යයේ වුවද, රෝමය වෙත රැගෙන එනු ලැබු ක්‍රි.ව. 1294 අගෝස්තු 29 වන අක්කියුලාහිදී පාප්ධූරයට අභිෂේක කරන ලදි. මෙතුමාගේ කාලය වසරක් 05 ක් වු අතර, පාප්ධූරය හා පරිපාලනමය අත්දැකීම් එතුමන්ට නොතිබු නිසා දැඩි පසුබෑමක සේයා පෙනෙන්නට විය.

තවද ඒ සැමට වඩා තමන් ගත කළ නිසල අල්පේච්ඡ දිවියට බෙහෙවින් ප්‍රිය කළ සෙලෙස්ටින් පාප්තුමෝ. පාප්ධූරයේ ඇති ලෞකික වටිනාකම් කෙරේ කිසිදු ප්‍රියභාවයක් නොදැක්වූහ. මේ නිසා වඩා නිවැරදි දේ පාප්ධූරයෙන් ඉල්ලා අස්වීම බව සිතූ මෙතුමා ක්‍රි.ව. 1294 දෙසැම්බර් 13 වන දින නිල වශයෙන් ඉල්ලා අස්වුනි. මෙය සභා ඉතිහාසය තුළ නිලවශයෙන් දක්වන ලදුව විශ්‍රාම ලැබූ ප්‍රථම අවස්ථාව විය. මීට පෙර විසූ පාප්වරුන් ඉල්ලා අස්වීමේ රහසිගත ලෙස සිදුවූ බව කියැවේ. මෙලෙස තම ධූරයෙන් ඉල්ලා අස්වූ සෙලස්ටින් පාප්තුමා තම තාපසාරාමය වෙත ගොස් තපස්වරයකු ලෙස ජීවත්වන්නට ඉල්ලූ

# අති උතුම් ÷ාලොස්වන බෙනදික් පිය අභියෝගය

**පෙබරවාරි මස 11 වන දා ලූර්දුවේ අප ස්වාමිදුවගේ අනිවාර්ය අනුස්මරණ දිනයේ දී වතිකානයේ කාදිනල්වරු අබිමුව, අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා, පාප් ධූරයේ විශ්‍රාම ගැනීම නිවේදනය කිරීම විශ්මයාර්ථ ප්‍රවෘත්තියක් බවට පත් විය. මෑත කාලීන ඉතිහාසයේ පාප්තුමකු එලෙස විශ්‍රාම නො ගැනීම ඊට හේතු විය. ධූරයෙන් විශ්‍රාම ගැනීම පිළිබඳ පැහැදිලි කරමින් ශුද්ධෝත්තම පියතුමා සඳහන් කළේ සිය වයෝවෘද්ධභාවය සහ අයහපත් සෞඛ්‍ය හේතුවෙන් මේ තීරණය ගත් බව යි. පේදුරුතුමන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස ශුද්ධාසනයේ කටයුතු මෙහෙයවීමට තවදුරටත් තමන්ට ශක්තියක් නොමැති බව උන්වහන්සේ අවධාරණය කළ සේක.**

පසු ව ජනමාධ්‍ය හමුවේ අදහස් දක්වමින්, වතිකානයේ නිල මාධ්‍ය ප්‍රකාශක, ගරු ෆෙඩ්රිකෝ ලොම්බාර්ඩි පියතුමා (Federico Lombardi SJ) අවධාරණය කළේ කිසිවෙකුගේ කිසිදු බලපෑමකින් තොර ව සාසන නීතියට එකඟ ව 'නිදහස් කැමැත්තෙන්' අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා මේ තීරණයට එළඹ ඇති බව යි. ඒ අනුව, පෙබරවාරි මස 28 වන දා වතිකානයේ වේලාවෙන් ප.ව. 8.00 ට සාසන ඉතිහාසයේ 265 වන පාප්තුමන් වූ අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා ධූරයෙන් විශ්‍රාම ගනු ඇත.

ක්‍රි.ව. 1927 අප්‍රේල් මස 16 වන දා උපත ලද වර්තමානයේ 85 වන වියෙහි පසු වන අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා, පාප්ධූරයට පත් වුයේ ක්‍රි.ව. 2005 අප්‍රේල් මස 19 වන දා ය. උන්වහන්සේ පාප් ධූරයෙහි පිහිටුවීමේ මංගල දිව්‍ය පූජා යාගය (Papal Inauguration Mass) ක්‍රි. ව. 2005 අප්‍රේල් මස 24 වන දා වතිකානයේ සා. පීතර චතුරස්‍රයේදී පුද කෙරුණි. ඒ අනුව, උන්වහන්සේ වසර 7 ක් මාස 10 ක් සහ දින 10 ක් පාප් ධූරයේ කටයුතු කරති.

ක්‍රි. ව. 1406-1415 කාලයේ පාප් ධූරය දැරූ අතිඋතුම් දොළොස්වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා ද මෙලෙස ස්වාභිමතයෙන් පාප් ධූරයෙන් ඉවත් විය. ඒ අවසන් අවස්ථාවෙන් වසර 598 කට පසු අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා, පාප් ධූරයෙන් විශ්‍රාම ගැනීම නවීන ලෝකයේ එවැනි ක්‍රියාදාමයකට යොමු වූ පළමු අවස්ථාව ලෙස ඉතිහාස ගත වන්නකි. අතීත තත්ත්වයට වඩා අතිශය සංකීර්ණ ව්‍යුහයකින් යුතු විශ්වීය සාන්ත සභාව, මෙහි දී නව අද්දැකීමකට මුහුණ දෙනු ඇතැ' යි අපේක්ෂා කෙරේ.

උන්වහන්සේ තම විශ්‍රාම දිවිය, වතිකාන උද්‍යානයට යාබද 'මාටාර් එක්ලේසියේ' (Mater Eclessiae) තාපසාරාමයේ ගත කරනු ඇතැ'යි ද විස්තර ඉදිරිපත් වේ. එහි දී පෞද්ගලික යැදුමට, භාවනාවට සහ අධ්‍යයන කටයුතු සඳහා කාලය වෙන් කිරීමට ශුද්ධෝත්තම පියතුමා අපේක්ෂා කරයි.

සාසන නීතිය අනුව ශුද්ධෝත්තම පියතුමා ධූරයෙන් විශ්‍රාම ගැනීමෙන් දින 20 ක කාලය තුළ නව පාප්තුමන් අරභයා කාදිනල් තුමන්ලා විසින් පාප් නිලවරණය පැවැත් විය යුතු වේ. ඒ අනුව මෙවර කාදිනල් හිමිවරු 117 ක් සිය ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් සපුරා සිටිති. මේ වර්ෂයේ පාස්කු මහා පූජෝත්සවයට පෙර නව පාප්තුමන් ප්‍රකාශ වෙතැ'යි විශ්වාස කෙරේ. අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමාගේ විශ්‍රාම ගැනීමෙන් අනතුරු ව නව පාප්තුමන් නම් කෙරෙන තෙක් ශුද්ධාසනයේ පරිපාලන වගකීම, වතිකාන රාජ්‍ය ලේකම් අතිගෞරවනීය තාර්සිසියෝ කාදිනල් බර්ටෝනි හිමිපාණන් (Tarcisio Cardinal Bertone OSB) විසින් දරයි.

පාප්වරණය හුදු මිනිස් ප්‍රයත්නයක් ලෙස සලකමින් පාප්ධූර අපේක්ෂකයන් නම් කිරීමට ඇතැම් ජනමාධ්‍ය දරණ අහිතකර අන්තවාදී ප්‍රයත්නය හෙළා දැකිය යුතු ය. සභා ඉතිහාසය තුළ, අනපේක්ෂිත කාදිනල්වරු කොතෙකුත් පාප්ධූරයට පත් වූහ; ඔවුහු සාන්ත සභාවට මහ මෙහෙවරක් ඉටු කළ උත්තමයෝ ය. (උදා : අතිඋත්තම විසිතුන්වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා, දෙවන වතිකාන කතිකාවතේ පිතෘවරයා ය.) සාන්ත සභාවේ නො සැලෙන විශ්වාසය අනුව, නව පාප්තුමන් නම් කෙරෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙනි. සැදැහැවත්හු ඒ සඳහා යාච්ඤා කරත්වා! විය යුත්තේ ද එය මැ යි.

පූර්වයෙහි මෙවැනි අද්දැකීමක් නොමැතිවීම නිසා ම පාප්තුමාගේ විශ්‍රාම ගැනීම පිළිබඳ නොයෙකුත් අදහස් ඉදිරිපත් විය. එය ඇතමෙකුගේ කැළඹීමට, සැකයට සහ විවේචනයට භජනය වූ බව ද නො රහසකි. අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා, පාප්ධූරයෙන් විශ්‍රාම ගනුයේ කිසිදු බාහිර බලපෑමක් නොහොත් අප්‍රිය අද්දැකීමක් නිසා නො ව තවදුරටත් ශුද්ධාසනයේ කටයුතු මෙහෙයවීමට උන්වහන්සේට ශක්තියක් නොමැති බව හැඟෙන නිසාවෙනි.

වරෙක, එතුමා සාන්ත පස්වන සෙලෙස්තයින් ශුද්ධෝත්තම පියතුමාගේ ශුද්ධ වූ ධාතු අභිමුව සිට ප්‍රකාශ කළේ "සාන්ත පස්වන සෙලෙස්තයින් ශුද්ධෝත්තම පියතුමා, තම හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කිරීම මගින් දෙවියන් වහන්සේට කීකරුවීම තුළ නො බිය ව ක්‍රියා කිරීමට දැන සිටි" බවයි. (ක්‍රි. ව. 2012 පෙබරවාරි 12) එ බැවින්, පිරිහෙන සෞඛ්‍ය තත්ත්වය මත අපහසුවෙන් ශුද්ධාසනයේ කටයුතු ඉටු කරනු වෙනුවට. එම වගකීම් වඩා විධිමත් ව සපුරාලිය හැකි පුද්ගලයෙකුට දැරීමට අවකාශ සලසා විශ්‍රාම ගැනීම, තම හෘදය සාක්ෂියට එකඟ ව සිදු කළ හැකි යැ'යි පාප්තුමා කල්පනා කළ බව පැහැදිලි ය.

භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ සමීප ඇසුර තුළ ලත් අද්දැකීම් ඒ කෙරෙහි ධෛර්යවන්ත වූ බව හැඟේ. තවදුරටත් වයෝවෘද්ධවීමෙන්, වේදනාවෙන්, සම්ප්‍රදාය රකිනු පිණිස ස්වර්ගස්ත වන තෙක් පාප් ධූරය දැරීමට වඩා, එම ධූරයේ වගකීම් දැරීමට සුදුසු නව පාප් තුමකු යටතේ සාන්ත සභාවේ සුසංවර්ධනය දැකීමට එතුමා අපේක්ෂා කිරීම යුක්ති යුක්තය. විප්ලවවාදී වුව ද කාලෝචිත ය. එය සාන්ත සභාවේ අභිවෘද්ධිය අපේක්ෂාවෙන් ගත් තීරණයකි. උන්වහන්සේ සැබවින් ම සාන්ත සභාවේ සේවකයන්ගේ සේවකයෙකැ'යි හැඟේ.

වර්තමාන ලෝකය බල අරගලයක යෙදී සිටියි. ඉතා ම ප්‍රාථමික සමාජ ඒකකයේ සිට සංස්කෘතික, දේශපාලන, ආර්ථික, තාක්ෂණික, ආගමික ප්‍රභේදයන් වෙත එහි පැතිරීම කණගාටුදායකය.

ශුද්ධෝත්තම පියතුමා, වර්තමානයේ බිලියන 1.2 ක් පමණ ජනගහනයකින් යුතු විශ්වයීය කතෝලිකයන්ගේ අසහාය නායකයා ය. එය බිලියන 7 ක් පමණ වන ලෝක ජනගහනයෙන් 1/7 පමණ වේ. එහි අදහස, ලොව මිනිසුන් 7 දෙනෙකුගෙන් එක් අයෙක් හෝ පාප්තුමා තම ආධ්‍යාත්මික නායකයා ලෙස පිළිගන්නා බවයි. පාප්තුමා විශ්ව ක්‍රිස්තියානි සංඝයේ නායකයකු ලෙස පිළිගන්නා, ලෝක නායකයකු ලෙස ගරු කරන පිරිස ඊටත් වඩා විශාල වේ. මෙ වැනි අසමසම බයක් හිමි දේශපාලන නායකයකු වුව ද ලොවෙහි නැත. ශුද්ධෝත්තම පියතුමා,

ජේසුස්වහන්සේගේ අග්‍රමහා ශ්‍රාවකයන් දොළොස් දෙනා අතර පළමුවැන්නා වූ සාන්ත පේදුරුතුමන්ගේ අනුප්‍රාප්තිකයා ය. එම මහා අපෝස්තුළුවරයා මෙන් ම විජාතීන්ගේ අපෝස්තුලුවරයා වූ සාන්ත පාවුලු තුමා 'ක්‍රිස්තියානි විශ්වාසය' උදෙසා ප්‍රාණ පරිත්‍යාගි වූ 'රෝමය' එතුමාගේ වාසභවනය වේ. ශුද්ධෝත්තම පියතුමා, රෝමයේ අගරදගුරු තුමා ය; ඓතිහාසික ලතරානු ආසන දෙව්මැඳුරේ උරුමකරුවා ය. වතිකානයේ රාජ්‍ය නායකයා ය. එබැවින්, 'ශුද්ධෝත්තම පිය ධූරයේ' මහිමය තවදුරටත් විවරණය කළ යුතු නැත.

මේ සියල්ල ස්වර්ගස්ත වන තෙක් තම මුළු ජීවිත කාලය පුරා ම නිරායාසයෙන් හිමි 'පාප් ධූරයෙන්' විශ්‍රාම ගැනීම. බලකාමීත්වයෙන් උන්මන්තක වූ ලෝකයට අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා ඉදිරිපත් කරන 'අභියෝගය' යි. සාන්ත සභාවේ තිර අභිවෘද්ධිය සඳහා නොමඳ ව ජීවිතය කැප කර හෘදය සාක්ෂියට එකඟව ඉසිඹු ලැබීමට, සැකසුණු පරිචයක් සහිත විස්මිත ආධ්‍යාත්මික පරිණතභාවයක්, අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා සතු ව ඇත.

නමුත් ඊළඟට පත්වූ ශුද්ධෝත්තම පියතුමා අවසර ලබා නොදුන්නේය. මේ නිසා ම එතුමන්ට වතිකානයේ ම සිටීමට සිදු වු බව සඳහන් වේ. පසුව එතුමන් වෙත තම තාපසාරාමයට යෑමට අවසර ලැබුනු අතර ක්‍රි.ව. 1296 මැයි 19 වන දින එතුමා මරණයට පත්විය. මීළඟ අවස්ථාව ලෙස ඉතිහාගතව ඇත්තේ මීට වසර 600 ක පමණ පෙර ඉසිඹු ලැබූ 12 වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමාය (ක්‍රි. ව. 1406-1415). මේ කාලයේ දී එකවර පාප්වරුන් තිදෙනෙකු පත් වී සිටි අතර අවිග්නොන්, රෝමය මෙන්ම පිසාහිදි මධ්‍යස්ථාන තුනක් විය. ග්‍රෙගරි පාප්තුමා වනාහි රෝමයේ විසු තැනැත්තාය. මෙලෙස සභාවේ ඇති ව තිබු අවුල් වියවුල් බවට විසඳුම් සිතු යුරෝපීය නායකයෝ රෝමානු අධිරාජයාගේ සහය ඇතිව ජගත් මන්ත්‍රණ සභාවක් පැවැත්වීය.

මෙහිදී පාප්ධූරය පිළිබඳ ප්‍රශ්නය නිරාකරණයට පත් කළ අතර නියම පාප්තුමා ලෙස ග්‍රෙගරි පාප්තුමා බව ප්‍රකාශ කළ අතර වඩා නිවැරදි බුද්ධිමත්ම ක්‍රියාදාමය තමන් සිය ධූරයෙන් ඉල්ලා අස්වීම බව සිතු 12 වන ග්‍රෙගරි පාප්තුමා ක්‍රි. ව. 1415 ජූලි 14 වන දින සිය ධූරයෙන් ඉසිඹු ලැබීය. මේ අනුව බලන කල වත්මන් ශුද්ධෝත්තම පියතුමාගේ ඉසිඹු ලැබීම අරුමයක් නොවේ? තවද ශු. සභා සම්ප්‍රදායට සහා නීතියට අනුව සෑම රදගුරුතුමකුම වයස අවු. 75 දී විශ්‍රාම යති. කාදිනල් තුමන්ලා වයස අවු. 80 දී විශ්‍රාම යති. මේ අනුව බලන කල ශුද්ධෝත්තම පියතුමන්ගේ විශ්‍රාම යෑම ද ලෝකයට ප්‍රබල ආදර්ශයකි. මන්ද සිය දිවි අවසානය තෙක් තනතුරේ හිඳීමට එතුමන්ට තිබිණි. නමුත් එතුමා විශ්‍රාම යනු ලබන්නේ සැබෑ ක්‍රිස්තුවරයකුගේ ආදර්ශය ශු. බයිබලයේ සඳහන් නායකත්වයට පක්ෂපාති වෙමිනි. මේ අනුව මමත්වය සෑම ස්ථානයකම ඉස්මතුව පවතින, තම නිලය බලය අයථා ලෙස භාවිත කරන නූතන සමාජ සන්දර්භයට ශුද්ධෝත්තම පියතුමාගේ ඉසිඹු ලැබීම. බෙහෙවින්ම ආදර්ශයක් හා අභියෝග යක් වන්නේය.

**– අසේල දසානායක**

තම ධූර කාලය අවසානයේ තම කාර්ය ගැන තෘප්තිමත් ව එවැනි සැහැල්ලුවකින් විශ්‍රාම ගැනීමට, නූතන සමාජයේ විවිධ තානාන්තරයන් දරණ ලොකු කුඩා නායකයන් කොපමණ ප්‍රමාණයකට හැකි ද යනු ගැටලුවකි.

ඒ ගැන සිතන්නට. අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමාගේ ආදර්ශය ඇරියුම් කරයි. සුප්‍රකට දේවධර්මාචාර්යවරයකු ලෙස ජෝසප් කාදිනල් රැට්සිංගර් හිමිපාණන් සතු වු කීර්ති කදම්භය, ප්‍රඥාගෝචර වූවක් පමණක් නොව සැබෑ ක්‍රිස්තු ගතිගුණ ප්‍රගුණ කළ යථාර්ථවාදී මානුෂික පැවැත්මෙන් ද උද්ජීවලිත වූවක් බව පෙනේ.

බලයෙන් ‘ප්‍රබලවීම’ නොව බලයෙන් ‘දුබලවීම’ මගින් ක්‍රිස්තුන් වහන්සේ තුළ සියල්ල කළ හැකි බවට අතිඋතුම් සොළොස්වන බෙනදික්ත ශුද්ධෝත්තම පියතුමා සාක්ෂි දරමින් සිටියි. දේවත්වයේ යස ඉසුරින් හිස්වීම තුළ මැවිල්ලේ අග්‍රකිරීටය වූ ක්‍රිස්තුන් වහන්සේගේ ක්‍රියාව (පිලිප්පි 2:6-11) සිහිගැන්වෙයි. එයින් ම සුදත් පිය සොළොස්වන බෙනදික්ත ක්‍රිස්තු අනුගාමිකත්වය, මනරම් ව විචිත්‍රණය නො වේ ද? ‘අනුගාමිකත්වය’ වෙත කෙරෙන ‘අභියෝගය’ සුපැහැදිලිය.

භාග්‍යවන්ත විසිතුන්වන ජුවාම්, සවැනි පාවුලු, භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු, අපේ කාලයේ ශ්‍රේෂ්ඨ ශුද්ධෝත්තම පියතුමන්ලා අතර ‘සොළොස්වන බෙනදික්ත’ නාමය රැඳෙනු නොඅනුමානය.

සැරදෙ සුදත් පියතුම සොළොස්වන බෙනදික්ත!

**බෙවලි එම්. ප්‍රනාන්දු**

# පාප් තුමාගේ නොවරදින සුළුභාවය

**කතෝලික සභාව අවිවාදයෙන්ම පාප්තුමාගේ නායකත්වය පිළිගන්නා අතර, අනිකුත් කිතුනු සභා හා කණ්ඩායම් එතුමා තමන්ගේ ආගමික නායකයා ලෙස පිළිගන්නේ නැත. මෙසේ පිළිනොගැනීම තුළද තවත් බොහෝ ප්‍රභේදයන් දැකිය හැක. ඒ අතුරින් මුල් තැනක් ගන්නේ කතෝලික සභාව විසින් පිළිගන්නා පාප්තුමාගේ ‘නොවරදින සුළු භාවය’ යි. (Infallibility). පාප්තුමා සාමාන්‍ය මනුෂ්‍යයකු නිසා, එතුමා අනිතුත් අනිත් මිනිසුන්ට මෙන් වැරදි අතපසුවීම් සිදුවිය හැකි නිසා, එතුමාට නොවරදින සුළු භාවය ඇත්තේ කෙසේදැයි යමෙකුට ප්‍රශ්න කරන්නට පුළුවන. නමුත් කතෝලික සභාව පාපත්මාගේ නොවරදින සුළු භාවය පිළිගන්නේ එවැනි සරල තර්කයක් පසුබිම් කරගෙන නොවේ. කතෝලික සභාව තුළ මේ පිළිබඳ මත ගැටුමක් නොමැත්තේ, එකී නොවරදින සුළු භාවය මෙලොවට පමණක් හිමි හුදෙක් විශේෂිත බලයක් හෝ අභූත බලවේගයක් ලෙස නොසලකන නිසාය.**

පාප්තුමන්ගේ නොවරදින සුළු භාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? මේ පිළිබඳ නිසි අවබෝධයක් නොමැති අය විවිධ දුර්මත පදනම් කරගෙන, එය නොපිළිගන්නවා පමණක් නොව, කිසිම හරයක් නොමැති විවේචන ද ඉදිරිපත් කරමින්, විටෙක පරිභව කරමින්, නොවරදින සුළු භාවය (Infallibility) හා නිර්දෝෂකම (Impeccabliity) නැතහොත් එතුමා අතින් කිසිදු වරදක් හෝ පාපයක් සිදුවිය නොහැකිය යන්න අතර මත පටලවා ගැනීමක් කරගෙන ඇත. පාප්තුමා මිනිසෙකි. අප සෑම කෙනෙක්ම මෙන් මිනිස් දෙමාපියන්ගෙන් මෙලොව එළිය ලබා, එතුමාත්, ඇස්, මස්, නහර ඇති හැඟීම් හා උද්වේගයන් ඇති මිනිසෙකි. එතුමාත් ජම්මයෙන් උරුමවී ඇති සමහර ගතිගුණ, පුරුදු හැකියාවන් හා දුර්වලතාවයන් මෙන්ම, පසුව සමාජය තුළින් හුරු පුරුදු කරගත් යහපත් හා අයහපත් හැසිරීම් රටාවන්ටත් හිමිකම් කියති. ඒ නිසා එතුමා පාප් පදවිය දැරීම සඳහා බිහිවු සුපිරි මිනිසෙක් නොවේ. එබැවින් එතුමා අතින්ද වැරදි සිදුවිය හැක. එතුමාත් දැහැමි කිතුනු බැතිමතකු ලෙස තමන්ගේ වැරදි අඩුපාඩුකම් මගහරවා ගැනීමට උත්සාහ කරමින්, තමන්ගේ වැරදි ගැන පසුතැවිලි වෙමින්, පව් කමාවේ දේව ප්‍රසාද නිධානය ලබාගනිමින් තම ආධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කර ගැනීමටත්, විශ්වාසය ගැඹුරු කරගන්නටත් උත්සාහ කරන්නාවු සිල්වත් සභා නායකයෙකි.

එසේම පාප්තුමා සතු නොවරදින සුළුභාවය දෙවියන් වහන්සේගෙන් ලත් විශේෂ අනුග්‍රහයක්ද (inspired) නොවේ. එතුමා කුමන හෝ අවස්ථාවක නොවරදින සුළු භාවය තුළ යම්කිසි ප්‍රකාශයක් කරන්නේ කෙලින්ම ස්වර්ගයෙන් පණිවිඩයක් ජනතාව ඉදිරියේ ප්‍රකාශ කිරීමක් හැටියටද නොවේ. එදා දේව මෑණියන්ට ගාබ්‍රියෙල් දේව දූතයා මංගලම් කිවූ ආකාරයේ විශේෂිත දේව අනාවරණයක් නොවරදින සුළු භාවය තුළ ඇතුළත් වී ඇත.

එමනිසා පාප්තුමා පුද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ යමක් ප්‍රකාශ කළ අවස්ථාවකදී හෝ එතුමා ගත් තීරණයකදී එතුමා අතින් යම්කිසි ප්‍රමාදදෝෂයක් හෝ වරදක් සිදුවිය හැක. පසුගිය කාලයේදී සභාව විසින් ඉතිහාසයේ ගත් යම් යම් තීරණයන් හා ක්‍රියාකාරකම් පිළිබඳව පාප්වහන්සේලා පොදුවේ සමාව ඉල්ලා සිටි අවස්ථාද අපට දැකගත හැකි විය. එබැවින් පාප්තුමා යමක් ප්‍රකාශ කරන හෝ උගන්වන සෑම අවස්ථාවක එය නොවරදින සුළු භාවයේ ප්‍රතිපලයක් ලෙස සැලකිය නොහැක.

පාප්තුමාගේ නොවරදින සුළු භාවය ගැන කථා කළ හැක්කේ, එතුමාණන් විසින් විශ්වාසය හා ශීල ධර්මය (Morals) පිළිබඳ, සමස්ථ සභාව විසින්ම පිළිගත යුතු හා පිළිපැදිය යුතු යම්කිසි ධර්මතාවයක් ගැන ප්‍රකාශ කරන නිල අවස්ථාවලදී පමණි. නිතැතින්ම එවැනි ධර්මතාවයන් පාප්තුමාගේ පුද්ගලික මතය නොව සභාවේ පොදු හැඟීම හා මතය විය යුතුය. පාප්තුමාගේ මුවින් නික්මෙන හැම වචනයකම, එතුමා අතින් ලියවෙන හැම වාක්‍යයකම කිසිම වැරැද්දක් නැතැයි කෙනෙකුට කිසිසේත් කිව නොහැක. එලෙස සභාව උගන්වන්නේද නැත. පාප්තුමන්ගේ නොවරදින සුළුභාවය විශ්වාස කළ යුතු හෝ පිළිපැදිය යුතු පවතින ධර්මතාවයක් වෙනස් කිරීමට හෝ නව ඉගැන්වීමක් ඉදිරිපත් කිරීමට හෝ බලපවත්වන්නේ ද නැත. එය බලපාන්නේ කලක් පවත්වාගෙන ආ හෝ, උගන්වමින් සිටි හෝ සාකච්ඡාවට භාජනය වෙමින් තිබූ යම්කිසි කරුණක් සභාව තුළ විශ්වාස කළයුතු හා පිළිපැදියයුතු ධර්මතාවයක් ලෙස තහවුරු කොට, ස්ථිර කිරීම සඳහාය. උදාහරණයක් ලෙස එකළොස්වන පියුස් පාප්තුමන් දේව මාතාවන්ගේ නිර්මල පිළිසිඳීම පිළිබඳ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරද්දී. එයට වසර සිය ගණනක් තිස්සේ දේව මාතාවන් ජම්ම දෝෂ රහිතව පිළිසිඳුන තැනැත්තිය ලෙස ජනතාව අතර ගෞරවාදරයට පාත්‍ර වෙමින් සිටියාය. සැදැහැවත් ජනතාවගෙන්, පූජක හා පැවිදි අයගෙන් හා ලොව පුරා සිටින රදගුරුතුමන්ලාගෙන් විමසා අවසානයේදී පාප්තුමා දේව මෑණියන්ගේ නිර්මල පිළිසිඳීම කතෝලිකයින් විසින් විශ්වාස කළයුතු කරුණක් ලෙස ප්‍රකාශයට පත් කළේය. එය පාප්තුමකු විසින් ප්‍රකාශයට පත්කළ නොවරදින සුළු ඉගැන්වීමක් ලෙස පිළිගැනේ. ‘ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඊයෙත්, අදත්, සැමදාත් ඒකාකාරමය’ (හෙබ්‍රෙව් 13:8). එමනිසා සභා ධර්මතාවයන් තුළ පාප්වහන්සේට වුවද නව ධර්මතාවයන් අමුතුවෙන් නිපදවිය හෝ නිර්මාණය කළ නොහැක. කළ හැක්කේ ඒවා ශුද්ධාත්ම වරමින් අනාවරණය කරගැනීම පමණයි.

පාප්තුමා සතු නොවරදින සුළු භාවය අපි පිළිගත යුත්තේ විශේෂිත දේව බලයක් හෝ හාස්කමක් ලෙස නොව, මානුෂික දුබලතාවයන්ගෙන් සමන්විත සභාව සුරැකීම සඳහා දෙවියන් වහන්සේ දානය කළ ශුද්ධාත්ම දීමනාවක් ලෙසය. එමනිසා එය එක් පුද්ගලයකුගේ ප්‍රබලතාවයක් හෝ බලයක් නොව, සභාව වෙත දෙවියන් වහන්සේ දානය කළ ආධ්‍යාත්මික දීමනාවකි.

පාප්තුමන්ගේ නොවරදින භාවය තුළ කිසිම බයිබලීය පසුබිමක් නොමැති බවද මේ පිළිබඳ විවේචන ඉදිරිපත් කරන සමහරුන්ගේ තර්කයකි. ‘මම ඔබට කියමි, ඔබ පේදුරුය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. මරණයේ බල වුවද එය පරාජය කළ නොහැකිය. ස්වර්ගරාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි. ඔබ පොළවේ යමක් බඳින්නහුද, එය ස්වර්ගයෙහිදීද බඳිනු ලබන්නෙහිය. ඔබ පොලවේ යමක් මුදන්නහුද, එය ස්වර්ගයේදීද මුදනු ලබන්නේය’ (මතෙව් 16:18-19).

මෙමගින් අපට පැහැදිලිව පෙනෙන්නේ අපෝස්තුළුවරුනට විශේෂයෙන් පේදුරුතුමාට බලය පවරා දුන්නා පමණක් නොව, සභාව තුළ ගුරු බලය නැතහොත් ඉගැන්වීමේ බලයද පවරා දුන් බවයි. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් වන ජෙරුසලම්හි මන්ත්‍රණ සභාවද (15:1-23) පාවුළුතුමා ගලාතිවරුනට ලියන ලද ලිපියේ 2:1-14 හි සඳහන් වන පාවුළුතුමා හා පේදුරුතුමා අතර ඇතිවු අර්බුදයද, ඒවා විසඳා ගත් ආකාරයද දෙස බලන විට, මුල පටන්ම පේදුරුතුමා තම මූලිකත්වයෙන් ප්‍රකාශ කරන ලද දේ සියළුදෙනා විසින් පිළිගත් ආකාරයත්, විවිධ මත තිබුනත් හැම කෙනෙක්ම එකාමෙන් එක්සත් වූ ආකාරයත් අපට දැකිය හැක. පේදුරුතුමා රෝමයේ රදගුරුතුමා ලෙස තම සේවය ඉටුකරද්දී සෙසු අපෝස්තුළුවරුන් එතුමාව නායකයා ලෙස පිළිගෙන එම නායකත්වය තුළ අන් අය ක්‍රියා කළේය. බඳිනු ලැබීමට හා මුදනු ලැබීමට ක්‍රිස්තුස් වහන්සේ පේදුරුට දානය කළ බලය හා නායකත්වය එතුමා තම සහෝදර අපෝස්තුළුවරුන් අතර බෙදාගත්තේය. එසේම තමන්වහන්සේගේ බැටළුවන් පෝෂණය කිරීමේ විශේෂ වගකීම ක්‍රිස්තුස් වහන්සේ පේදුරුතුමා මත පැවරූ අවස්ථාවේ, එම දූත සේවාව ඉදිරියට පවත්වාගෙන යෑමට උන්වහන්සේ පේදුරු තුමා වෙනුවෙන් විශේෂයෙන් යාච්ඤා කළ සේක. “ඔබේ ශ්‍රද්ධාව නොබිඳෙන පිණිස ඔබ උදෙසා මම යාච්ඤා කළෙමි. ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරියන් ධෛර්යමත් කරන්න” යි ජේසුස් වහන්සේ පේදුරුට වදාළ සේක. (ලූක් 22:32) එමනිසා සමදර්ශක සුවිශේෂවලත්, ජුවාම් තුමාගේ සුවිශේෂයේත්. පාවුළුතුමාගේ ලිපිවලත් පේදුරුතුමාගේ නායකත්වයත්, එතුමාට සෙසු අපෝස්තුළුවරුන් මෙහෙයවමින් දහම ජනතාවට උගන්වමින්, තමන්වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමේ වගකීම බාර දුන් බවත් බයිබලය අපට පැහැදිළිව පෙන්වා දෙයි.

පාප්තුමන්ගේ නොවරදින සුළු භාවය පිළිබඳ මුල් සභාවේ සිට පිළිගැනීම තිබුනත්, එය විශේෂාකාරයෙන් අර්ථකථනය කරන ලද්දේ පළමුවෙනි වතිකාන මන්ත්‍රණ සභාවේදීය. ඒ අනුව පහත සඳහන් අවස්ථාවලදී පාප්තුමන්ට වැරදිය නොහැකි බව එම මන්ත්‍රණ සභාව පෙන්වා දුන්නේය.

1. පාප්තුමා විශේෂිත නිල ඉගැන්වීමක් තමාගේ නිල මට්ටමින් (Ex Cathedra) ඉදිරිපත් කරන විටකදි,
2. එය සභාව තුළ විශ්වාසය හා ශීල ධර්මය පිළිබඳ කරුණක් වන අවස්ථාවකදි,
3

එම ඉගැන්වීම සමස්ත සභාවටම බලපාන හා පිළිගත යුතු ඉගැන්වීමක් වන විටකදි.

පළමුවෙනි වතිකාන සභාවේ මෙම ඉගැන්වීම තව දුරටත් සනාථ කළ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පාප්තුමා පමණක් නොව රාජගුරු මණ්ඩලයද සාමුහිකව, පාප්තුමා සමග විශ්වාසය හා ශීලධර්මයට අදාල ඉගැන්වීමක් ඉදිරිපත් කරන විට නොවරදින සුළු භාවය ඇති බව පෙන්වා දුන්නේය. පාප්තුමා සාමාන්‍යයෙන් මෙවැනි ඉගැන්වීමක් ඉදිරිපත් කරන්නේ මන්ත්‍රණ සභාවකදීය (Ecumenical Council). දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ලුමෙන් ජෙන්සියුම් හෙවත් ‘සභාව’ පිළිබඳ විශ්ව ලේඛණයේ අංක 25 හි සඳහන් වන්නේ නොවරදින සුළු භාවය ක්‍රිස්තුන් වහන්සේ දානය කළේ සභාවට බවත්, එම දීමනාව ක්‍රියාත්මක වෙන්නේ පාප්තුමා හා රාජගුරු මණ්ඩලය මගින් බවත්ය. එම ලේඛණයට අනුව මෙම හැකියාව පැන නගින්නේ තමන්ගේ ප්‍රසාද ස්නාපනය තුළින් ජනතාව සහභාගවෙන ක්‍රිස්තුස් වහන්සේගේ දිවැසි කාර්ය තුළින්ය. ජුවාම් තුමා විසින් ලියන ලද පළමු ලිපියේ 2 වන පරිච්ඡේදයේ අංක 20 සිට 27 දක්වා මෙය මනාව විග්‍රහ කරයි.

සභාවේ පළමු සියවස් වලදී සිටම, අන්තියෝකයේ ඉග්නාසි මුනිඳුන්, කාර්තේජ්හි සිප්‍රියානු වැනි සභා පියවරුද, පසුකාලීන නූතන කතෝලික දෙව් දහම් විශාරදයින්ද




## විශේෂ අතිරේකය

## ශ්‍රද්ධානාථ ප්‍රදීපය

පාප්තුමන්ගේ නොවරදින සුළු භාවය පිළිගැනීම පිළිබඳ ලේඛණ හා ඉගැන්වීම් ඉදිරිපත් කර ඇත.


1983 ප්‍රකාශයට පත්කළ ශාසන නීති සංග්‍රහයේ පාප්තුමන්ගේ නොවරදින සුළු භාවය පිළිබඳ 749 වෙනි නීති වගන්තියේ මෙලෙස සඳහන් වෙයි.

1. පාප්තුමන් සෑම විශ්වාසකයකුගෙම උත්තරිතර එඬේරාණන් හා ගුරුවරයාණන් වන නිසා, එතුමා තම විශ්වාසකයින්ගේ විශ්වාසය තහවුරු කළ යුතුය. එතුමාට තමන්ට පැවරී ඇති නිල බලය තුළ, පිළිගත යුතු විශ්වාසය හා ශීල ධර්මය පිළිබඳ කෙරෙන ප්‍රකාශන වලදි නොවරදින සුළු භාවය හිමිය.
2. රදගුරුතුමන්ලාටද තමන් සතු ගුරු බලය, මන්ත්‍රණ සභාවකදි සාමුහිකව, ගුරුවරුන් හා විශ්වාසය හා ශීල ධර්මය පිළිබඳ තීරකයින් ලෙස ක්‍රියා කිරීමේදී ද නොවරදින සුළු භාවය හිමිය. ලොව පුරා විසිරී සිටින රදගුරුතුමන්ලා, ඔවුන් එකිනෙකා සමග හා පේදුරුතුමාගේ තැනට පත්ව සිටින පාප්තුමා සමග එකමුතුකමින්, එතුමන්ලාගේ ගුරුබලය තුළ, විශ්වාසය හා ශීල ධර්මය පිළිබඳ නිගමන ගැන එකගතාවයකට එළඹෙන විටද, එතුමන්ලාට නොවරදින සුළු භාවය හිමිය.
3. යම් ධර්මතාවයක් නොවරදින සුළු ලෙස අර්ථකථනය කර ඇති බව පැහැදිලිවම ප්‍රකාශ කර නැත්නම්, එය නොවරදින සුළු ඉගැන්වීමක් ලෙස පිළිගනු නොලැබේ.

සභා ඉගැන්වීම් තුළ නොවරදින සුළු භාවය ගැන කථා කරන ‘කතෝලික ධර්මෝපදේශය’ සභා ගුරුබලය හෙවත් ධූරාවලිය (Magisterium) දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළින් ජනතාව හා සමග ඇතිකරගත් ගිවිසුම හා සම්බන්ධ බව පෙන්වා දෙයි. එහි මූලික පරමාර්ථය දේව ජනතාව අපගමනයෙන් හෙවත් නොමග යැවීමෙන් හා ප්‍රහරණය හෙවත් අත්හැර දැමීමෙන් මුදාගෙන, නිවැරදිව විෂය මූලික විශ්වාසය ප්‍රකාශ කිරීමේ හැකියාව ලබාදීමය. එමනිසා ධූරාවලියේ එඬේරික අරමුණ දේව ජනතාව, ඔවුන්ව නිදහස කරා ගෙන යන සත්‍යය හා එකඟ කිරීමය. මෙම කාර්ය ඉටුකිරීම සඳහා ක්‍රිස්තුස් වහන්සේ සභා එඬේරුන්ට විශ්වාසය හා ශීල ධර්මය පිළිබඳ ඉගැන්වීම් වලදී නොවරදින සුළු භාවයේ කරිස්මාව පවරා දුන් සේක. මෙම කරිස්මාව ඉහත සඳහන් කළ පරිදි විවිධ ස්වභාවයන්ගෙන් එනම්, පාප්තුමා තුළින්, රාජගුරු මණ්ඩලය තුළින් මගින් ක්‍රියාත්මක වන බවද කතෝලික ධර්මෝපදේශය උගන්වයි (අංක 890, 891, 892).


පාප්තුමන් සතු නොවරදින සුළු භාවය මිථ්‍යා ඇදහීමක්වත්, අන්ධ විශ්වාසයක්වත් නොව, සභාවට දෙවියන් වහන්සේ දානය කළ ශුද්ධාත්ම දීමනාවකි. එය එක් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් සතු හැකියාවක් නොව, දේව ජනතාව තම ප්‍රසාධ ස්නාපනය තුළින් ක්‍රිස්තුස් වහන්සේගේ දිවැසි කාර්යයට සහභාගි වීමේ දූත සේවාව ක්‍රියාත්මක කිරිමකි.

**ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානයක පියතුමා**



# සසුන් පිය උපහාර

විශේෂ අතිරේකය









## රදගුරු සහෝදරත්වය අත්දුටුවා



**මහනුවර රදගුරු**
**අති උතුම් වියානි ප්‍රනාන්දු හිමි**

භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා ස්වර්ගස්ථ වීමත් සමඟම උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයා කවුරුන්දැයි යන්න සිතන විට හැඟුණේ අති උතුම් ජෝශප් රැට්සිංගර් කාදිනල් හිමිපාණන්වයි. උන්වහන්සේ සසුන් පියා ලෙස පත් වූ විට මා සිත පිනා ගියේ එතුමන්ගේ දස්කම් නිසාමයි. ධුරය ලබන විට වියපත්ව සිටියත්, එතුමන් තුළ තිබූ දේව විශ්වාසය හා දෙවිඳුන් තුළ යැපීම හොංකොං ආසියාතික දේවධර්මාචාර්ය සමුළුවක දී මගේ ඇසින් දකින්නට ලැබුණා. සැම විට දෙවිඳුන් යදිමින් එතුමා ගත කළ ජීවිතයත්, රදගුරු සහෝදරත්වය පිළිබඳව මුල්ම "අද්ලිමිනා" චාරිකාවේදීත් අත් දුටුවා.


## දුර්මත දුරලන්නට පොතපතින් සමත්වුණා



**අගරදගුරු පදවි සහයක රදගුරු**
**අති උතුම් මේරියස් පීරිස් හිමි**

උන්වහන්සේගේ පොත පත ලොව පැවැති දුර්මත දුරලමින් දෙවන වතිකාන කතිකාවේ සැබෑ හරයන් ලොවට විවර කරන්නට මුල් වුණා. සසුන් ධූරාවලිය දැරුවේ කෙටි කලක් වුවත් දෙවන වතිකාන කතිකාවේ පනස් වසරක් සපිරෙන යුගයක ඒ ගැන යොමු කරන්නට එතුමා සමත් වුණා.


## බුද්ධිමත් සංහිඳියාවේ ප්‍රතිමූර්තියක්



**බදුල්ල රදගුරු**
**අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමි**

මේ පුවත අනාවරණය වන විට මා වතිකානයේ සිටියේ. ඒ මොහොතේ තිගැස්මකට පුදුමයකට මා පත්වුණා. අප සසුන් පියාණන් බොහොම යථාර්ථවාදීව, ධෛර්යසම්පන්නව සහා නායකත්වයට පත්වී දේව අනුහසින් ඉදිරියට යන්නට සමත් වුණා. බොහොම බුද්ධිමත්, සංහිඳියාවේ මූර්තියක් වූ අප සසුන් පියා විවෘත මනසකින් එංගලන්ත සභා නිකායිකයන් පවා වැළඳගත්තේ කිතුනු සභා එකමුතුභාවය ගැන එතුමා තුළ තිබූ දැඩි උනන්දුව නිසාමයි.

## සමයාන්තර සංවාදයෙන් පෙරට



**අනුරාධපුර රදගුරු**
**අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි. හිමි**

අන්තර් ආගමික සහජීවනය වෙනුවෙන් කැපවූ කෙනෙක්. සභා අර්බුද පිළිගත් කෙනෙක්. ඒවාට පිළිතුරු සෙවූ කෙනෙක්. ඒවාට ගොදුරු වූ අය වෙත සානුකම්පිතව යොමුවුණා. ගැඹුරු චින්තකයකු ලෙස ජනතාව තමන් වෙත ඇද බැඳ ගන්නට ඒ චින්තනය හේතුවක් කරගත්තා. එයින් සභාවේ ශක්තිමත් පදනමක් ගොඩනැගුවා. අන්තර් ආගමික හා සමයාන්තර සංවාදය ඔස්සේ ඉදිරියට පිය නඟන්නට සමත් වුණා.


## නූතන ලොවේ සැබෑ දිවැසිවරයෙක්



**කුරුණෑගල රදගුරු**
**අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමි**

2005 වර්ෂයේ සසුන් පිය ධුරයට ඔසවනු ලැබූ උන්වහන්සේ දේව අනුග්‍රහයෙන් සකල ලෝකය තුළ ජන ප්‍රසාදය සහ දේව ප්‍රසාදය ලබමින් මහඟු දූත මෙහෙවරක් ඉටු කළේය. උන්වහන්සේගේ දැතින් ලියැවුන විශ්ව ලේඛන මෙන්ම නිකුත් කර ඇති ප්‍රකාශන සමස්ත ලෝකයටම අභියෝගයක් මෙන්ම වත්මන් ලෝකයේ දිවැසි හඬකි. සැබවින්ම දිවැසිවරයෙකි. විශ්වාසයේ වසර ප්‍රකාශ කර ඇදහිල්ල අව්‍යාජ මාවතකට යොමු කිරීමට එඩිතරව තීරණය කිරීම ප්‍රශංසනීය ය.

අප ලබන ධුරයෙන් අපව බබළවා ගන්නවාට වඩා ඒ උත්තරීතර ධුරය අප විසින් බබළවන්නට සැලැස්වීම උන්වහන්සේගේ තීරණය තුළ ගැබ්වී ඇත. ජීවිතයේ සැඳෑ සුවය ශාන්තව ගත කරන්නට අවැසි දේවාශිර්වාදය ලැබෙන ලෙස සැදැහැවත් අපි සියලු දෙනාම උන්වහන්සේ වෙනුවෙන් යාච්ඤා කරමු.


















# සුසුදු පිය සමරු













## අසමසම ආධ්‍යාත්මික නායකත්වයක්

**හලාවත රදගුරු**
**අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමි**

අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පිය නායකත්වය හා ආධ්‍යාත්මය වඩ වඩාත් ශක්තිමත් කරමින් ලොවට අසමසම මඟ පෙන්වීමක් කළා. උන්වහන්සේගේ ලේඛන තුළ පෙන්වූ සේවක නායකත්වය සිය සසුන් දූත කාර්යයේ දී ප්‍රායෝගිකව ජීවිතයෙන් පෙන්නුම් කළා. වියත් ලේඛකයකු, දේවධර්මාචාර්යවරයකු, දේශකයකු ලෙස දැක් වූ කුසලතා මඟින් අසමසම ආධ්‍යාත්මික නායකත්වයක පෞරුෂය ලොවට අනාවරණය කළා.



## පීතෘක සෙනෙහසින් වේදනා සමනය කළා

**රත්නපුර රදගුරු**
**අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි සා.බෙ.නි. හිමි**

නිහතමානී බවින් යුතු සරළ දිවි පැවැත්මෙන් බොහෝ දෙනකුට ළං වීමට සමත් වුණා. තුවාල සුවපත් කරන්නට යොමුවෙද්දී පියකු දරු කැල වෙත යොමුවන පීතෘක සෙනෙහසින් වේදනා සමනය කරන්නට එතුමා සමත් වුණා.



## දූතකාර්යය තුළ සවිමත් අනාගතයක්

**ගාල්ල රදගුරු**
**අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමි**

ශුද්ධෝත්තම පියතුමන් හමුවීමේ වරම මට ලැබුණා. ඒ මොහොතේ දී මට හැඟී ගියා උන්වහන්සේ අන්‍යයන් කෙරේ මොනතරම් සැළකිලිමත් වන්නේ ද කියා. උන්වහන්සේගේ නිහතමානී බව, චාම්කම ඔස්සේ ඉටුකළ දූත කාර්යය තුළ එහි අනාගතය වඩාත් සවිමත් හා බලවත් බවක් ගැනීමට අවකාශ සලසා තිබීම සුවිශේෂී ලක්ෂණයක්. කතෝලික සසුන බලවත් කරන්නට එතුමන්ගේ ලියකියවිලි මහත් සේ ප්‍රයෝජනවත් වෙනවා. කතෝලික ධර්මෝපදේශයට එතුමන් ලබා දුන් මූලිකත්වය නිසා ඉදිරි පරම්පරාව නිසි ලෙස එහි ප්‍රතිඵල නෙලනු නියතයි.



## නවක රදගුරු හිමිපාණන්ට කදිම මඟ පෙන්වීමක්

**අගරදගුරු පදවි සහයක රදගුරු**
**අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමි**


උන්වහන්සේ හා සමීපව කතාබහ කරද්දී ආධ්‍යාත්මිකත්වයෙන් ලත් සෙනෙහසින් අප ඇඳ බැඳ ගත්තා. නවක රදගුරුවරුන්ට එතුමාණන්ගේ මේ ආධ්‍යාත්මික ශක්තිය හා නැඹුරුව කදිම මඟ පෙන්වීමක් බව මගේ වැටහීමයි. දෙවන වතිකාන කතිකාවේ 50 වන සංවත්සරය මූලික කොටගෙනත් කතෝලික ධර්මෝපදේශයට 20 වසරක් පිරීම මුල් කොටගෙනත් එතුමාණන් ආරම්භ කළ ක්‍රියාවලීන් තවත් බොහෝ කාලයක් සභාව තුළ අනුස්මරණීය ඉගැන්වීම් සේ තිබේවි. එය අනිවාර්යයි.



## ආධ්‍යාත්මික නායකත්වයේ පන්නරය

**අගරදගුරු පදවි සහයක රදගුරු**
**අති උතුම් මැක්ස්වල් සිල්වා හිමි**

බැහැපත්කම, නිහතමානීකම, අල්පේච්ඡ බව තුළ සසුන් නායකත්වය උපරිමව සේවය කළා. ලෝකය තුළ මේ ආධ්‍යාත්මික නායකත්වයේ පන්නරයෙන් කතෝලික සභාව ඔසොවා තබන්නට ගත් වෑයම අමතක කරන්නට බැහැ. සහයක රදගුරු තුමන් වශයෙන් මමත්, අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරුතුමාත් එතුමාණන්ව මුණ ගැසුණු මුල්ම අවස්ථාවේ එතුමාණන් ලංකාව ගැන දැරුවේ පුදුම ආදර හැඟීමක්.



# සසුන් පිය උපහාර

විශේෂ අතිරේකය

**ශ්‍රද්ධාංජලී ප්‍රදීපය**

# මොහොතකින් ලොව සසල කළ ඉසිඹු පුවත

අති උතුම් XVI වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියාණන් කතෝලික සභාවේ සිය ශුද්ධාසන පදවියෙන් ඉවත් වන බැව් උන්වහන්සේ විසින්මැ ලොවට ප්‍රකාශ කළ මොහොතේ සිට සකළ ජනතාව උන්වහන්සේ වෙත නමස්කාරය පුද දුන්හ. උන්වහන්සේගේ ඉසිඹු ගැනීම කිසිවකු විසින් බලාපොරොත්තු වූවක් නොවීය. එබැවින් එම ඉසිඹු ප්‍රකාශය ලොව පුරා ගුවන් විදුලියද, රූපවාහිනියද, අන්තර්ජාලයද, ජංගම හා ගෘහස්ථ දුරකථනද ඔස්සේ එක් මොහොතකින් පැතිර ගියේය.

XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාගේ ඉසිඹු ගැන්ම ශුධොතුම් පියාණන් කෙනෙකු ස්වර්ගස්ථ වීමේදී ජනතාවන් විසින් දක්වනු ලබන ප්‍රතිචාරයට වෙනස් ආකාරයේ ප්‍රතිචාරයක් යයි කිතුනු පුවත් වාර්තා කරයි. මන්දයත් වයස හෝ සෞඛ්‍යය හේතුන් නිසා හෝ නූතන ලෝකයේ වෙසෙන කිසිදු බලධාරියකු විසින් මෙවැනි ඉසිඹු ගැන්මක් කිසිදා සිදුනොවන නිසාය. බලය හා සවිය අවසන් මොහොත දක්වා රැගෙන යාමට කැස කවන ලෝක නායකයන් හමුවේ XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන්ගේ විශ්‍රාම ගැන්ම තවත් ඓතිහාස ගත වන සංසිද්ධියක් ද වනු ඇතැයි වාර්තා වේ.

ලොව නන් දෙසින් අයැදුම් හා යැදුම් ගලයි. "කතෝලික සභාව ලෝක ජනතාවගේ යහ පැවැත්ම සඳහා පෙරමුණ ගනී. පසුගිය සතර වසර පුරා ඒ සඳහා එකට එක්ව ක්‍රියාකිරිම පිළිබඳව XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාණන්ට අපේ නමස්කාරය හා යැදුම් පුදකරනවා. මෙලෙසින් ප්‍රකාශ කරනු ලැබුවේ ඇමෙරිකා ජනාධිපති බැරක් ඔබාමා විසිනි.

තවද ඊශ්‍රායෙලයේ රබ්බි නායක යෝනා මෙත්ෂගර් තුමා විසින් ද ප්‍රකාශ කරනු ලැබුවේ XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියා සිය ධූර කාලය තුළදී ජුදා ආගමද ක්‍රිස්තියානියද අතර සමීප සම්බන්ධතාවයක් තහවුරු කිරීමට විවිධාකාරයෙන් කටයුතු කළ බවයි. තවද ජුදා ආගමද ක්‍රිස්තියානියද ඉස්ලාම් දහමද අතර අන්තර් ආගමික සම්බන්ධතා ගොඩනැගීමේ අරමුණින් කටයුතු කිරීම අරභයා XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන් සැමදා සිහිපත් කරනු ඇතැයි ද එතුමා විසින් අවධාරණය කරනු ලැබීය.

නේපාලයේ කිතුනු හා අන්‍යාග මික තරුණ තරුණියෝ XVI වැනි ශුධොතුම් පියාගේ ඉසිඹු ගැන්මට ප්‍රතිචාර දක්වමින් එතුමාගේ රුව හා ප්‍රකාශයන් ඇතුලත් පත්‍රිකා ද හුවමාරු කර ගත් බැව් ආසියාන කතෝලික පුවත් වාර්තා විසින් පසක් කරත. XVI වැනි බෙනඩික්ට් පාප්තුමා සැබෑ ප්‍රේමය, ආධ්‍යාත්මික සවිය පිළිබඳ මහගු ආදර්ශයක් වන හෙයින් එතුමාගේ පිතෘක සෙනෙහස දක්වන කාඩ් පතක් මගේ පෙම්වතිය වෙත මා පූජා කරනවා." මෙලෙස ප්‍රකාශකොට ඇත්තේ හින්දු භක්තික කිෂෝර් නදිතා නම් තරුණියාය. නේපාලයේ ජනගහනයෙන් කිතුනුවන් සියයට එකකි. එසේ වූවත් විශේෂයෙන් තරුණ තරුණියන් විසින් එවැනි ප්‍රතිචාර දක්වා තිබීම. විශ්‍රාම යන ශුධොතුම් පියාගේ පිතෘක සෙනෙහසේ සුවඳවත් බව ලොව පුරා පැතිර ඇති බවේ ලක්ෂණයක් ලෙසින් පිළිගැනේ. ශුද්ධෝත්තම පියාගේ ඉසිඹු ප්‍රකාශය ලොව පුරා විසිරී යද්දී විශේෂයෙන් කාදිනල් වරුද වෙනත් ලෝක රාජ්‍ය නායකයන්ද XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන් වෙත සිය ආදර භක්තිය හා ප්‍රණාමය දිගින් දිගටම පුද කැරුමට පටන් ගත් බව වාර්තා වී ඇත.

### සුදොතුම් පිය ඉසිඹුව පෙර අවසන් දින සටහන්

ශුධොතුම් පියා සිය ධූරයෙන් ඉවත්වන දිනට පසුදා එනම් මාර්තු මස 1 දා ලොව සියළු කාදිනල් හිමිවරු රෝමයේදී කණ්ඩායමක් ලෙස හමුවෙති. මෙම රැස්වීමට වයස 80 ඉක්මවූ කාදිනල් හිමිවරුද සහභාගි වෙති. එම රැස්වීමේදී කාදිනල් වරුන්ගේ සංසදය සඳහා දින නියම කරගනු ලැබේ.

- කාදිනල් වරුන්ගේ සංසදයේ දැනට හිමිවරුන් 118 දෙනෙක් සිටියත් යුක්‍රේනියාවේ කාදිනල් ලුබෝමීර් හුයාර් තුමා පෙබරවාරි මස 26 වැනිදා 80 වැනි වියට පත්වන හෙයින් එතුමාව කැමැත්ත ප්‍රකාශ කිරීමේ කාදිනල් සංසදයට ඇතුළු කිරීමට නොහැකි වනු ඇත.
- වසර ගණනාවක් මුළුල්ලේ XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන්ගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කළ ජෝර්ජ් ගැන්ස්වේන් අගරදගුරු හිමිපාණන් තවදුරටත් එතුමාගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කරනු ඇත.
- ඉතාලියේ ගිහි කතෝලික සංවිධානයන් විසින් XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන අතර ශුද්ධාසනය විසින් එතුමන් වෙත ආරක්ෂාව ලබාදෙනු ඇත.
- මෙම කාලපරාසය තුළදී යොදා තිබූ පරිදි, රුමේනියාවේ ජනාධිපතිද, ගෞතමාලාවේ ජනාධිපති ද ඉතාලියේ මාරියෝ මොන්ටි සෙනේට් සභිකවරයාද එතුමන් හමුවීමට නියමිත වේ.
- පෙබරවාරි මස 18 දා සිට පෙබරවාරි මස 23 දා දක්වා XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන් චතාරික ඥානකාන්තියට සහභාගි වනු ඇත.
- එතුමෝ ප්‍රසිද්ධ වශයෙන් සිය අවසන් ඉරිදා දිව්‍ය යාගය පෙබරවාරි මස 24 වැනිදා පවත්වති.
- පෙබරවාරි මස 27 වැනිදා එතුමාගේ අවසන් ජන හමුව, ශාන්ත පීතර චතුරශ්‍රයේදී පවත්වනු ලබයි.

පෙබරවාරි 28 වැනිදා පෙරවරු 11.00 ට එතුමා කාදිනල් හිමිවරුන් මුණගැසී එතුමන්ලා ගෙන් සමුග න්නවා ඇත. එදිනම සවස 5.00 ට 'කාසල් ගැන්ඩෙල්ෆෝ' සිය ආරාමය කරා පැමිණෙනු ඇත.

### ඉදිරියෙන් ඇත්තේ කවුරුන්දැයි ඔට්ටු මෙහෙයුමක්

'විලියම් හිල්' නම් ලෝ ප්‍රකට ඔට්ටු අල්ලන්නන්ගේ ව්‍යාපාරික කොම්පැනියක් විසින් අන්තර් ජාලය ඔස්සේ ප්‍රකාශකරනු ලැබ ඇත්තේ XVI වැනි බෙනඩික්ට් සසුනිසුරාණන්ගේ ඉසිඹු ගැනීමෙන් හිස්වන ශුධොතුම් පිය තනතුරට පත් කරනු ලැබීමට නයිජීරියාවේ ප්‍රැන්සිස් රින්සේ කාදිනල් තුමාද ඝානාවේ පීටර් ටර්ක්සන් කාදිනල් තුමාද කැනඩාවේ මාර්ක් ඔයුලට් කාදිනල් තුමාද ඉදිරියෙන් සිටිනා බවයි. මෙම ඔට්ටු මෙහෙයවන සමාගම විසින් තවදුරටත් දක්වා ඇත්තේ එම හිමිවරුන් අතරද ප්‍රැන්සිස් රින්සේ කාදිනල් තුමා සැමදෙනාටම වඩා ඉදිරියෙන් සිටිනා බවය. තවද ඔවුන් විසින් දක්වා ඇත්තේ පීටර් ටර්ක්සන් තුමා හා මාර්ක් ඔයුලට් කාදිනල් තුමා තේරී පත්විය හැකි තැනැත්තන් අතර වන හිමිවරුන් බවය.

අයර්ලන්තයේ ඔට්ටු මෙහෙයවනු ලබන සංවිධානයක් විසින් ද පෙරකී කාදිනල් හිමිවරුන් තිදෙනා පෙරටුවෙන් සිටිනා බැව්ද දක්වා ඇත. 2005 වර්ෂයේදී ජෝශප් රැට්සින්ගර් කාදිනල් තුමා සසුනිසුරාණන් ලෙස පත් කැරුණු මොහොත දක්වාමැ 'විලියම් හිල්' නම් ඔට්ටු මෙහෙයුම් සමාගම විසින් යළි යළිත් ප්‍රකාශකරනු ලැබ ඇත්තේ නයිජීරියාවේ ප්‍රැන්සිස් රින්සේ කාදිනල් තුමා පෙරටුවෙන් සිටිනා බවයි. එහෙත් එම උපකල්පනය සැබෑවූයේ නැත.

සසුනිසුරාණන් කෙනකු පත්කැරෙන වතිකාන සංසදයේ මුළු සංඛ්‍යාවෙන් 1/4 ක සංඛ්‍යාවක් ඉතාලි ජාතික කාදිනල් හිමිවරු වෙති. එමනිසාවෙන් ඉතාලි ජාතික කාදිනල්වරයකු පත්කර ගැන්මේ ප්‍රවණතාවයක් ඇතැයිද ඇතැම් මාධ්‍යයන් විසින් හුවා දක්වා ඇත. තවද ප්‍රැන්සිස් කාදිනල් හිමි, පීටර් කාදිනල් හිමි ඇතුළුව අප්‍රිකාන කාදිනල්වරු 18 දෙනෙක් වතිකාන සංසදය තුළ සිටිති.

### සුදොතුම් පිය ඉසිඹු ආරාමය චාම් තැනක්

XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාණන් විසින් සිය විශ්‍රාමික දිවිය ගත කිරීමට තෝරා ගෙන ඇති ආරාමය වතිකානයේ ඇත්තාවූ කලා නිර්මාන සහිත වෙනත් ආයතනික ගොඩනැගිලි හා සංසන්දනය කරන විට අතිශය චාම් ස්ථානයකි. ශුධොතුම් පියා වයස්ගතව, ශාරීරිකව දුර්වලවී ඇතත්, ආත්මයෙන් සවිමත් බැව්, මෙම තෝරා ගැනීම මගින්ද ඒත්තු යනවා." එලෙස පැවසුවේ එම ආරාමයේ වෙසෙන මරියතුමියගේ බැහැදැකීමේ නිකායට අයත් කන්‍යා සහෝදරියක් විසිනි. එම කන්‍යා සොහොයුරියන් බාහිර ලෝකයෙන් පිටස්තරව ආරාම ගතව සිටිනා හෙයින්. එතුමියගේ නම මාධ්‍ය වෙත ප්‍රකාශ නොකෙරිණි.

කිසිදු කාර්යමණ්ඩලයකින් තොරව එම ආරාමගත කන්‍යා සොහොයුරියෝ සරල ජීවිත ගත කරති. දවසේ වැඩි වෙලාවක් ඔවුන් ගත කරනු ලබන්නේ පොදු හා තනි යාච්ඤාවෙනි. ව. අඩි 4300 ක් පමණ ඉඩකඩකින් යුත් මෙම ආරාමයට 18 වසරක් තුළ කිසිදු ප්‍රතිසංස්කරණයක් හෝ අලුත් වැඩියාවක් කර නොමැත. ආරාමය කුඩා දෙව් මැඳුරකින් ද, ගීතිකා කුටියකින් ද, කුඩා පුස්තකාලයකින්ද, අමුත්තන් හමුවීමේ කුටියකින්ද, පෞද්ගලික පරිසරයකින් ද සමන්විතය. පෙබරවාරි 11 වැනි දිනැ තමන් විශ්‍රාම ගනු ලබන බැව් ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවේදීම ශුධොතුම් පියා විසින් ප්‍රකාශ කරනු ලැබුවේ තම විශ්‍රාමික සුව පැවැත්ම එම ආරාමය තුළ ගත කරනා බවයි.


වර්ෂ 1994 දී මෙම ආරාමය පිහිටුවනු ලැබ ඇත්තේ භාග්‍යවන්ත 11 වැනි ජුවාම් පාවුළු තුමන් විසිනි. එම ආරාමය පිහිටුවීමේ අරමුණවී ඇත්තේ ශුධොතුම් පියාණන් වෙනුවෙන් අඛණ්ඩව යාච්ඤාවේ යෙදීම සඳහාය. ආරාමයේ වෙසෙන සියළු පැවිදි සොහොයුරියන් ස්පාඤ්ඤ ජාතිකයෝ වෙති. XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියා ඔවුන් හා නිතරම යාච්ඤාවේ නිරත වූවා පමණක් නොව එම පැවිදි සොහොයුරියන්ගේ ඕනෑ එපාකම් ද නිරන්තරයෙන් සළකා බැලූ බැව්ද එතුමියෝ පවසති.

### ආත්මාර්ථය හා වෛරය ජයගැන්මේ ශුධොතුම් පිය වදන්

XVI වැනි බෙනඩික්ට් ශුධොතුම් පියාගේ අළු බදාදා අවසන් අනුශාසනාවේ මෙලෙසින් ද දැක්විණි. 'අපෝස්තුළුවර පේදුරු තුමාගේ සොහොන් ගැබ සිසාරා සිටිනා ඔබ සැම සමග පරමෝත්තම ගුරුවරයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි අපේ පරම ඇදහිල්ල අලුත් කර ගනිමු. දේව වාක්‍යයේ දැක්වෙන පරිදි දෙව් අනුහස් අනුව මෙම පාස්කු සමයේදී අපේ චින්තන හා හැසිරීම් රටාවන් දෙව් මහෝත්තමයාණන් තුළ කේන්ද්‍රගත කරගත යුතුවේ. තවද ජොවෙල් දිවැසිවරයා විසින් ඊශ්‍රායෙල් ජනතාව වෙත කැරුණු ඉල්ලීම සභා මාතාව විසින් අප වෙතට ඉදිරිපත් කරත. උපවාසයෙන් ද, හැඬුමෙන්ද, වැළපීමෙන්ද, තමන් වහන්සේ වෙත මුළු හදවතින්ම හැරී එන්නැයි ස්වාමින් වහන්සේ වදාරණ සේක. 'මුළු හදවතින්ම හැරි එන්නැ'යි යනුවෙන් අදහස් කැරෙන්නේ අපේ සිත්හි හා දැනීම් හි මුල්බැස ඇත්තාවූ තීරණයන්ද මනාපයන්ද ක්‍රියාකාරකම්ද හැර පියා පූර්ණ නිදහසකින් උන්වහන්සේ වෙත හැරී එම වේ. එහෙත් මෙම සිත් හැරුම කළහැකි දෙයක්ද? එසේ කළ හැකිය. මන්දයත් ස්වාමින් වහන්සේගේ මෙහෙයුම අපේ අභ්‍යන්තරය කරා ඇදීයන නිසාය. එමගින් 'අපේ සිත් ඉරා ගැනීමේ' සවිය අප විසින් අත් දකිනු ඇත.

"ඔබේ වස්ත්‍ර නොව හදවත් ඉරා ගන්න" යන දෙව් වදන් අපේ හදවත් තුළ රැව් පිළිරැව් දිය යුතුය. එනමුත් අපේ කාලයේ බොහෝ දෙනා අසාධාරණය හා විෂමාචාරයන් හමුවේ තමන්ගේ වස්ත්‍ර ඉරා ගැන්මට කැමති වූවත්, තම හෘද සාක්ෂිය හා ක්‍රියාකාරකම් දෙවිඳුන් විසින් වෙනස් කිරීම සඳහා හදවත ඉරා ගන්නා ඇත්තෝ නම් ස්වල්ප දෙනෙක් වෙති. දෙවිඳුන් කරා හදවතින්ම එන්නැයි කැරෙන යෝජනාව පෞද්ගලිකව පමණක් නොව සකළ සමාජයටමැ කැරෙන්නක් වේ. පාස්කු මනස්ථාපනය සමස්ත කතෝලික ජනතාව අරබයා කැරෙනා පොදු ආරාධනයක්ද වේ. තවද පාස්කු සමයේ දෙවිඳුන් වෙත ළඟාවීම සඳහා යැදුමද, දානයද, උපවාසය ද නිහැඬියාවද අවශ්‍ය වේ.

**බැසිල් පොන්සේකා**




## ඉසුඹු ලබන සුදු පියෙනි

**දෙදහස් පහේ බක් මස විසි හතර දින**
**පත්වූ අති උතුම් බෙනඩික් සොලොස වන**
**සුදු පිය ඉසුඹු ලබනට යන පුවත ගැන**
**විපිලිසරව ඇත ලොව පොදු සියලු දන**

**තනතුරෙ කාදිනල් තිස් හය වස නිතුල**
**අට වසරක්ම රැඳි සුදු පිය ලෙස පබල**
**සාමය රැගත් නායක ලෙස ලොව පතළ**
**දෙව් දම කෙළ පැමිණි පඩි රුවනකි හසල**

**මුස්ලිම් දහම් සංවාදය ගෙන තුළට**
**කළ ඒ දෙසුම පරසිදු විය දස දෙසට**
**ආවත් විරුදු හඬ පිට පිට එක දිගට**
**වැටහුන පසුව ලැබුනිය තුති ගොස එයට**

**දැනුවත් කරන අටියෙන් අප සියලු දන**
**කිතු හිමි ලවා තොරතුරු සැම රැගෙන ගෙන**
**දොරට වැඩිය තම පන්හිඳ අතට ගෙන**
**අනගි පොතකි නාසරතයේ ජේසු යන**

**යුද ගිනි අඳුරු දුරු කරනට ඇතිව හිත**
**පෙරමුණ රැගෙන ලැබදි සාමයෙ" අත**
**සහජීවනය තුළ ලබනට අනගි සෙත**
**කළ මෙහෙවරය ජන හද තුළ රැඳී ඇත**

**හැටපස්වන දෙසිය අප සුදු පිය තුමන්**
**ඉසුඹු ලබන අප සුදුපිය ලෙස දෙවැනි**
**පරසිදු අතිඋතුම් බෙනඩික් සුදු පියෙනි**
**වියපත් වූවත් කල මෙහෙවර අති රමණී**

**තියබෝල්ඩ් සමරතුංග**



සසුන් පිය උපහාර

විශේෂ අතිරේකය

ඥානාර්ථ ප්‍රදීපය

# සසුන් පියා පත් කර ගන්නේ මෙහෙමයි

**කිතුනු සසුන් පිය ධූරාවලියේ 25 වැනි මහා පුදැදුරු එඬේරාණන් ලෙස 2005 අප්‍රේල් 19 වැනිදා පත්ව, 2005 අප්‍රේල් 24 වැනිදා පදවිප්‍රාප්තවූ අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා 2013 පෙබරවාරි 28 වැනිදා ඉතාලි වේලාවෙන් පස්වරු 4 ට ඉසිඹු ලබන්නේය.**

ඒ අනුව එදා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පේදුරු නුඹ පර්වතයක්ය, මේ පර්වතය මත මාගේ සභාව ගොඩනගන්නෙමි යැයි පවසමින් ශුද්ධ වූ සභාවේ මුල් ශුද්ධෝත්තම පියතුමා පත්කළ සේක. එතැන් සිට පැවත ආ සසුන් පරපුරේ 266 වැනි සසුනිසුරාණන් පත්කර ගැනීමේ අවස්ථාවට ශුද්ධවූ සභාව එළඹ සිටින්නේය. සසුන් පිළිවෙතට අනුව ශුද්ධෝත්තම පියතුමකු සගසුව දිනීමෙන් හෝ ඉසිඹු ලැබීමෙන් පසු දින 15 ක් ඇතුළත නව නායකයාණන් තෝරා පත්කර ගත යුතුය.

මේ තෝරා පත්කර ගැනීම හුදු පුද්ගලික මති මතාන්තර හෝ දේශපාලන බලපෑම් හෝ මනාප පොරයන් ලෙස අර්ථ දැක්විය නොහැකිය. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ යැපෙමින් යැදුමෙන්, ධ්‍යානයෙන් අතිශයින් රහසිගතව, බාහිර ලෝකයෙන් මුළුමනින් වෙන්වී දේව හඬට අවනත වෙමින් සිදුකරන්නකි. එහෙත් අවාසනාවකට මෙන් සියල්ල වානිජකරණය වූ මේ ලෝකයේ සසුන් පිය නිලවරණය ද එවැන්නක් කර ගැනීමට බුකීකරුවන්, පැපරාසින්, ජනමාධ්‍ය ඇතුලු විවිධ අංශ වෑයම් කරනු දැකගත හැකිය. සසුන් පිය නිලවරණය කාලයෙන් කාලයට, යුගයෙන් යුගයට වෙනස් වෙමින් පැවත ආවකි. මුල්ම යුගයේ දී සසුන් පියාටම තමන්ගේ අනුප්‍රාප්තිකයා. එසේ නොවේනම් තමන්ගෙන් පසු පත්වන සසුන් පියා පත්කිරීමේ වරය තිබිණි. කාලයත් සමග ඇතිවූ සමාජයීය ආර්ථික හා දේශපාලන වෙනස්කම් මත සසුන් පියා ඡන්දයෙන් පත්කර ගැනීමේ ක්‍රමයක් ඇතිවිය.

වර්ෂ 1975 දී අතිඋත්තම සවැනි පාවුළු සසුන් පියා රොමානෝ පොන්ටිපිකෝ එළිගෙන්ඩෝ (Romano Pontifico Eligendo) නම් අපෝස්තලික හසුන නිකුත් කරමින් සසුන් පිය නිළවරණය සඳහා නව නීති රීති මාලාවක් ප්‍රකාශයට පත්කළේය. එම නීති රීති අතර වයස අවුරුදු 80 ට වැඩි කාදිනල් හිමිපාණන්ට සසුන් පිය නිළවරණයකට සහභාගි වීමේ සහ ඡන්දය පළකිරීමේ අවස්ථාව අහිමි කිරීම විශේෂ තැනක් ගත්තේය.

සසුන් පිය පදවියට කාදිනල් හිමිපාණන්ගේ ඡන්දයෙන් පත්වීමේ අවකාශ ඇත්තේ කාදිනල් හිමිපාණන් නමකට පමණකැයි යන්න බොහෝ දෙනාගේ විශ්වාසයයි. එහෙත් නීතිය පවතින්නේ ප්‍රසාද ස්නාපනය, පූජකවරය, රදගුරුවරය ලබාගැනීමට සූදානම් ඕනෑම කෙනකුව කාදිනල් හිමිපාණන්ට සිය ඡන්දයෙන් පත්කරගත හැකිය. එසේම සසුනිසුරාණන් ලෙස පත්වන තැනැත්තා අනිවාර්යයෙන් සසුන් පිය නිළවරණයට සහභාගි විය යුතු බවටද නියමයක් නැත. එමෙන්ම සසුන් පිය නිළවරණයට සුදුසුකම් ලබන කාදිනල් හිමිපාණන් තෝරා ගැනෙන්නේ සසුන් පියා සගසුව දිනූ හෝ ඉසිඹු ලැබූ දිනට වයස අවුරුදු 80 නොඉක්ම වූ පදනම මත පිහිටාය.

සසුන් පිය නිලවරණයේ රහස්‍ය භාවය සුරැකීම එදා මෙන් අදත් මුල්තැන්හිලා සැලකේ. අදාල කාල සීමාවේදී බාහිර ලෝකයෙන් මුළුමනින් ඈත්ව, කිසිදු ලෞකික, දේශපාලනික, මූල්‍ය හෝ රාජ්‍ය බලපෑම් වලින් වියුක්තව ස්වාධීනව, යැදුමෙන්, ධ්‍යානයට සමවැදී කටයුතු කිරීම සුවිශේෂී ලක්ෂණයකි. ලිපි හුවමාරුව, පුවත්පත්, දුරකතන ජංගම දුරකථන, රූපවාහිනී, ඊමේල්. පැක්ස් අන්තර්ජාලය ඇතුලු කිසිදු ලෞකික දෑ භාවිතාවෙන් වියුක්තව කටයුතු කිරීමට නියමවී තිබේ.

ඉපැරැණි සිස්ටයින් දෙව්මැඳුරේ සුප්‍රකට මයිකල් ආන්ජලෝගේ ලෝකය නිරූපණය වන චිත්‍ර දෙක මැදිකරගෙන කාදිනල් හිමිපාණන් රැස්වීම සිරිත විය. අතීතයේ සසුන් පිය නිලවරණය පැවැත්වෙන කාල සීමාවේදී කාදිනල් හිමිපාණන් නවාතැන් ගත්තේ අපෝස්තලික මන්දිරයේය. එහෙත් එම ස්ථානය කාර්යාල සහ රැස්වීම් ආදියට නිමවන ලද්දක් මිස නවාතැන් සඳහා සැකසුවක් නොවුහෙයින් නවාතැන් ගැනීමට පහසුකම් නොවීය. කෙසේ වෙතත් මේ තත්ත්වය වෙත අවධානය යොමුකළ අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා 1996 දී නිකුත්කළ අපෝස්තලික හසුන මගින් මේ කාර්යයට 'දෝමුස් සාන්ක්තේ මාර්තේ' (Domus Sanctae Marthae) නම්වූ පූජක තුමන්ගේ නවාතැනක් වෙන් කර දෙන ලදී. කාමර 130 කින් පමණ සමන්විත මේ ගොඩනැගිල්ල යැදුමට හා භාවනාවට රුකුල් දෙන ස්ථානයකි.







නිලවරණයේදී ඡන්ද පත්‍රිකා බහාලන බඳුන්








සසුන් පිය නිළවරණයේ තොරතුරු පිටකිරීම හෝ හුවමාරු කර ගැනීම දේශපාලන බලයන්ට හෝ වෙනත් බලවේගවලට යටත්වීම. ඡන්දය පිළිබඳව පූර්ව ගිවිසුම් වලට ඇතුළත් වීම ආදි කුමන හෝ කාරණාවකට වරදකරුවකු වන කාදිනල් හිමිපාණන් නමක සභාවෙන් නෙරපා හැරීම බඳු බරපතළ දඬුවම්වලට යටත්වීමට පවා සිදුවිය හැකිය. මිතුරුකම් හෝ සතුරුකම් මත, යම්කිසි පුද්ගලික හේතුන් මත, ජනමාධ්‍ය ඇතුලු විවිධ බලවේගවල බලපෑම් මත ඡන්දය පාවිච්චි නොකරන ලෙසටද කාදිනල් හිමිපාණන්ට අවවාද කැර සිටී.


අතීතයේ යම් යම් කාලවකවානුවල දේවානුභාවයෙන් හෝ නම ප්‍රකාශ කිරීමෙන් සසුන් පිය පදවියට කෙනකු පත්කරගත හැකි වූවත් දැන් එය කළ හැකි වන්නේ ඡන්දයෙන් පමණි. කාදිනල් හිමිපාණන්ගේ ඡන්දයෙන් 2/3 කට වැඩි එක් ඡන්දයක් ලැබෙනතෙක් සසුන් පිය නිළවරණය පැවැත්වේ.

සසුන් පිය නිළවරණය දින උදෑසන සාන්ත පීතර බැසිලිකාවේදී කාදිනල් හිමිපාණන් දිව්‍ය පූජා යාගයකට සහභාගිවේ. ඉන්පසු යාච්ඥා පෙරදැරිව අදාල ස්ථානය කරා සාන්ත සිතින් පියමං මනින කාදිනල් හිමිපාණන් ඇතුළු වූ පසු අවසාන කාදිනල් හිමිපාණන් ඇතුළතින් අගුළු දමා දොර වසා දමනු ලැබේ. වතිකාන ආරක්ෂක බලකාය වෙනත් අයගේ කතාබහ පටිගත කරන හෝ බාහිර ස්ථානයක සිට සවන් දිය හැකි සංනිවේදන උපකරණ සඟවා තබා ඇතිදැයි සොයා ශාලාව පරීක්ෂාවට ලක් කරනුයේ රැස්වීමට පෙරාතුවමය. එමෙන්ම එහි සේවක සේවිකාවන් විදුලි සෝපාන ක්‍රියාකරුවන්, රියැදුරන් ආදීන් රහස්‍ය භාවය සුරකින බවට එකඟ කරවා ගැනේ. යම් රහසක් හෙළිවූවොත් තරාතිරම නොසලකා සභාවෙන් නෙරපා හරිනු ලබන තරමට දැඩි දඬුවම් ලබාදීමෙන්ම මේ කටයුත්තේදී සභාව රහස්‍ය භාවය සුරැකීම පිළිබඳව දරන ස්ථාවරය මැනවින් පැහැදිලිවේ.



සසුන් පියා සග සුව දිනීමෙන් හෝ ඉසිඹු ලැබීමෙන් පසු නව සසුනිසුරාණන් කෙනෙකු පත් වන තුරු භාවිතා වන සසුන් ලාංඡනය

සසුන් පිය නිළවරණය මෙහෙයවීම කාදිනල් සංසදයෙන් කාදිනල් හිමිපාණන් තෙනමක් අහඹු ලෙස තෝරාපත් කරගන්නා අතර එතුමන් හමුවේ නිළවරණය පැවැත්වේ. මේ සඳහා වන ඡන්ද පත්‍රිකා ද විශේෂයෙන් සැලසුම් කර සකස් කරනු ලැබේ. එහි ලතින් බසින් මෙලෙස ලියා තිබේ. "Eligo in Summum Pontifican" යන්නෙන් අදහස් කරන්නේ 'පාප්තුමන්ගේ තනතුර සඳහා මම........ තෝරා ගන්නෙමි යන්නයි. අත්අකුරින් තමන් තෝරා ගන්නා කාදිනල් හිමිපාණන්ගේ නම සටහන් කළ පසු සිස්ටයින් දෙව්මැඳුරේ අල්තාරය මත තබා ඇති බඳුනට දමන්නේ ජ්‍යෝෂ්ඨත්වය අනුව එකිනෙකාය.




වර්ෂ 1621 දී අතිඋත්තම 15 වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමන් විසින් මේ රහස් ඡන්ද ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඡන්දය පාවිච්චි කිරීමේදී කාදිනල් හිමිපාණෝ සිය හෘදය සාක්ෂියට මිස අන් කිසිදු සමාජ, ආර්ථික හෝ දේශපාලනික බලපෑම් වලට නතු නොවෙති. කාදිනල් හිමිපාණන් තිදෙනකු ඡන්දය ගණින අතර තවත් හිමිපාණන් තිදෙනකු එම සංඛ්‍යාව නිවැරදි දැයි නැවත පරීක්ෂා කර බලති.

දිනකට අවස්ථා හතරකදී ඡන්ද විමසුම පවත්වනු ලැබේ. පූර්වභාග යේ දෙවරක් හා අපරභාගයේ දෙවරක් වශයෙනි. එහිදී එක් තැනැත්තකුට සහභාගිවන කාදිනල් හිමිපාණන්ගේ 2/3 ට එක් ඡන්දයක් වැඩිපුර ලද වහාම එම ඡන්ද පත්‍රිකා පුළුස්සා දමන අතර සිස්ටයින් දෙව්මැඳුරේ දුම්කවුළුවෙන් සුදු පැහැති දුම් නැගේ නම් සසුන් පියතුමකු පත්වී ඇති බව හැඟවෙයි. මේ සඳහා පුළුස්සන ඡන්ද පත්‍රිකා වලට විශේෂ රසායන ද්‍රව්‍යයක් යොදනු ලැබේ. යම් හෙයකින් සසුන් පියතුමකු තෝරා නොගත්තේනම් දුම් කවුළුවෙන් කළු පැහැති දුම් නිකුත්වේ. කෙසේ වෙතත් අවුල් සහගත තත්ත්වයන් මතුවීම වැලැක්වීම සඳහා නව ශුද්ධෝත්තම පියතුමකු පත්වූ වහාම වතිකානයේ සියලු සීනු නාද කිරීමට දැන් පියවර ගෙන තිබේ.

මෙසේ තුනෙන් දෙකකට වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ශුද්ධෝත්තම පියතුමකු පත්කිරීමෙන් පසු කාදිනල් සංසදයේ ප්‍රධානියා එතුමන්ගෙන් මේ තනතුර බාර ගැනීමට සූදානම් දැයි විමසා සිටී. එහිදී සූදානම් බව ප්‍රකාශ වුවහොත් සසුන් පිය ධූරයට යොදා ගන්නා නම කුමක්දැයි විමසා සිටී. ඒ අවස්ථාවේ අදාල නම ප්‍රකාශ කළ යුතුවේ.

නව ශුද්ධෝත්තම පියතුමකු පත්කර ගැනීම සඳහා පැවැත්වෙන සසුන් පිය නිළවරණයට පෙර සසුන් පිය ඇඳුම් ආයිත්තම් ප්‍රමාණයන් තුනකට සූදානම් කර තැබීම සාමාන්‍ය සිරිතවේ. නව සසුන් පියාව විශේෂයෙන් සූදානම් කර ඇති කාමරයකට රැගෙන ගොස් කාදිනල්වරයේ ඇඳුම් ආයිත්තම් වෙනුවට ශුද්ධෝත්තම පිය ධූරයේ නව ඇගළුම් පළඳනු ලැබේ.

සසුන් පිය පළඳනා පැළඳීමෙන් පසු කාදිනල් සංසදය සිය සුබ පැතුම් පිරිනමන්නේ නව සසුන් පියා වැළඳ ගැනීමෙනි. මේ අතර කාදිනල් සංසදයේ ප්‍රධානියා සාන්ත පීතර චතුරස්‍රයේ රැස්ව සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාව අමතන්නට සාන්ත පීතර බැසිලිකාවේ ප්‍රධාන බැල්කනියට යන අතර එහිදී පත්වූ කාදිනල් හිමිපාණන්ගේ නම සමඟ එතුමා සසුන් පිය පදවියට තෝරාගත් නමක් ප්‍රකාශ කරන්නේ "Habemus Papum" යැයි ජනතා ඔල්වරසන් මධ්‍යයේ කියයි. ඉන්පසු නව ශුද්ධෝත්තම පියතුමා කාදිනල් හිමිපාණන් සමඟ බැල්කනියට පැමිණ කෙටි දෙසුමක් පවත්වා සිය අපෝස්තලික ආශිර්වාදය දානය කිරීමෙන් සසුන් පිය නිලවරණය නිමාවේ. සසුන් පිය පදවි ප්‍රාප්තිය පසුව සිදුවේ.

**ශිරාන් මෛත්‍රී**

# සමස්ත මානව සංහතියට ශ්‍රේෂ්ඨත්වයක් ගෙන ආ ආධ්‍යාත්මික නායකයා



සසුන් පිය උපහාර

විශේෂ අතිරේකය

ශ්‍රද්ධානාථ ප්‍රදීපය

අතිඋතුම් සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාගේ තීරණය සම්බන්ධයෙන් විවිධාකාරයේ පුද්ගලයන් සහ ජනමාධ්‍ය පළ කරන විවිධාකාරයේ ප්‍රතික්‍රියාවන් වලින් එළිදරව් වන්නේ කුමක්ද?

කතෝලික සභාවේ සතුරන් ඒ දෙස බලන්නේ ඉතා කෲර සතුටකින් සහ තෘප්තිමත් භාවයකින්ය. ඔවුහු කතෝලික සභාවට පහර ගැසීම සඳහා ඕනෑම දෙයක්, ඕනෑම සිද්ධියක්, ඕනෑම අවස්ථාවක් උපයෝගි කර ගනිති.

මානව සංහතියට අත්‍යවශ්‍ය උදාර ගුණාංග රාශියක් තවමත් ආරක්ෂා කර ගෙන සිටින්නේ කතෝලික සභාව පමණි. මානව සංහතියේ උදාරත්වය, ශ්‍රේෂ්ඨත්වය, කතෝලික දහමේ හරයයි. කතෝලික සභාව නොපවතින්නට මේ ලෝකය මීට වඩා දරුණු, හිංසාකාරී, දූෂිත, අශිලාචාර සහ අමන ස්ථානයක් වීමට ඉඩ තිබුණි. තවමත් කිසිදු මරණ තර්ජනයක් ලබා ගන්නේ නැතිව විවේචනය කළ හැකි එකම ආයතනය සහ ආගමික සම්ප්‍රදාය කතෝලික සභාවයි. මෙය ලංකාවේ පමණක් නොව වෙනත් රටවල් සම්බන්ධයෙන් ද සත්‍යයකි. කතෝලික සභාව සමග එකඟ නොවීමටත්, මිනිසුන්ට ඇති අයිතිය කතෝලික සභාව පිළිගනියි

මිනිසුන් ලංකාව තුළ කතෝලික සභාවට පහර දෙන ආකාරයට බුදු දහමට හෝ ඉස්ලාම් දහමට පහර දීමට පටන් ගතහොත් කුමකින් කුමක් සිදු වේද? මිනිසුන් කිසිදු බයක්, චකිතයක් නොමැතිව කතෝලික සභාවට පහර දෙන්නේ ඇයි? මිනිසුන් ගල් ගසන්නේ ඵල දරන ගස්වලට නම්, කතෝලික සභාව තුළ යම් ගතිකත්වයක්, ගුණාත්මක භාවයක්, අව්‍යාජත්වයක් තිබිය යුතු වේ.

ශුද්ධෝත්තම පියතුමාගේ තීරණය ඉතා ලාබ සහ බාල වර්ගයේ අදහස් සහ සංකල්ප භාවිත කොට තේරුම් ගත නොහැකිය. පුද්ගලයන් විසින් විවිධ අවස්ථාවලදී ගන්නා තීරණ තේරුම් ගැනීමට සංකීර්ණ විග්‍රහයක් අවශ්‍ය ය. පුද්ගලයන් තීරණ ගන්නේ රහස් කුමන්ත්‍රණයක හෝ බල අරගලයක හෝ බලපෑමක හෝ බාහිර කණ්ඩායම් වලින් එන පීඩනයක් නිසාම නොවේ. බුද්ධිමය ලෙස මන්ද පෝෂණයෙන් පෙළෙන්නෝ ක්ෂණික නිගමන වලට එළඹෙති. සිදුවූ දේ සම්පූර්ණයෙන්ම දන්නා ලෙස හැසිරෙති. මිනිසුන් විසින් ගන්නා තීරණවලට හේතුවූ අභ්‍යන්තරික කරුණු කාරණා සහ අරගලයන් විශ්ලේෂණාත්මක ලෙස තේරුම් ගැනීම මෙහිදී ඉතා වැදගත්ය.

අපගේ ආත්මයේ ගැඹුරෙන්ම නිදහස් තීරණ ගැනීම දෙවියන් වහන්සේ තුළ පමණක් ජීවත් වන පුද්ගලයෙකුට කළ හැකි දෙයක් පමණි. දෙවියන් වහන්සේ වෙතට සියල්ල භාර කර උන්වහන්සේ මත පමණක් පූර්ණ විශ්වාසය තැබීම සෑම පුද්ගලයෙකුට කළ හැකි දෙයක් නොවේ. සභාවේ අනාගතය උදෙසා තමා කිරීමට බලාපොරොත්තු වූ සියලුම සැලසුම් සහ ක්‍රියා මාර්ග, බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාට පෙබරවාරි 28 පසුව සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේගේ කැමැත්තට භාර කිරීමට සිදුවේ. එය අතිශයින්ම ගැඹුරු හිස්වීමකි, ආධ්‍යාත්මික මරණයකි.

තමාට මිය යන ප්‍රමාණය අධික වන තරමට, දෙවියන් වහන්සේ තුළ නැවත උපදින ප්‍රමාණය අධික වේ. ආධ්‍යාත්මික මරණයක් සිදුවන්නේ නොමැතිව ආධ්‍යාත්මික උපතක් සිදුවන්නේ නැත. සමහර විට බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමාගේ ධර්ම දූත මෙහෙවරේ ගැඹුරුතම කාර්යභාරය සිදුවිය හැක්කේ පෙබරවාරි 28 දායින් පසුව විය හැකිය.

ලෝකයේ වැඩියෙන්ම බලපෑමක් ඇති කළ හැකි පුද්ගලයා ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති තුමා හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා ලේකම් තුමා හෝ නොව පාප් වහන්සේය. සමස්ත ලෝකයම උන්වහන්සේට ඇමතිය හැකිය. ලෝකයේ සෑම තැනකම උන්වහන්සේට පක්ෂපාතිත්වයක් දක්වන්නන් විසිරී සිටිති. උන්වහන්සේ පත් වී සිටින්නේ මහජන ඡන්දයකින් නොව ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙසයි. එසේ නම් ලොව සිටින බලවත්ම පුද්ගලයා පාප් ධූරය දරන පුද්ගලයායි. නමුත් එම ධූරයෙන් විශ්‍රාම ගැනීම කළ හැක්කේ ආධ්‍යාත්මිකව ශක්තිමත් පුද්ගලයෙකුට පමණි (විශ්‍රාම නොගන්නා පාප් වහන්සේලා ආධ්‍යාත්මිකව ශක්තිමත් නොවන බව මින් අදහස් නොවේ.)

පාප් ධූරය වැනි ඉතාමත් බලවත් සහ බලපෑමක් (Influential) කළ හැකි තනතුරකින් ඉසිඹු ලැබීම උදාර පුද්ගලයෙකුගේ නිහතමානි ක්‍රියාවකි. සැබෑ බලය තම තනතුරෙන් ඔබ්බට යන්නෙකි. සැබෑ බලපෑම අඩංගු වන්නේ එම තනතුර දරන පුද්ගලයාගේ ආත්මයේ ගුණාත්මක භාවය මතයි. අවසාන විග්‍රහයේදී පුද්ගලයෙකුගේ ශ්‍රේෂ්ඨත්වය පවතින්නේ තමන් දරන තනතුරේ පමණක් නොව, තමන්ගේ චරිතයේ අව්‍යාජත්වයද මතයි. තමන් දරන තනතුරේ වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය චරිත ශක්තියටත් වඩා ගැඹරු චරිත ශක්තියක් ඇති පුද්ගලයා ඇත්තෙන්ම ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. ලෝකයේ සිටින බොහෝ දේශපාලන නායකයන්ට නැති ගුණාංගයත් එයයි.

සැබෑ අධිකාරිය (Authority), සැබෑ බලය, සැබෑ බලපෑම පැමිණෙන්නේ පුද්ගලයෙකුගේ පෞරුෂත්වයේ අඩංගු ගුණාත්මක භාවය තුළින්ය. බලය අනවශ්‍ය ලෙස පාවිච්චි නොකරන්නා ලොව සිටින බලවත්ම පුද්ගලයාය. ලොව ඇති බලවත්ම තනතුරින් විශ්‍රාම ගන්නා ඊටත් වඩා බලවත් පුද්ගලයෙක් විය යුතුවේ. ඒ අනුව දැනට ලොව සිටින බලවත්ම පුද්ගලයා සොළොස්වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා වේ. ලෝකයට වැඩියෙන්ම බලපෑමක් කළ හැක්කේ වැඩියෙන්ම නිහතමානි පුද්ගලයාටය. එවැනි පුද්ගලයෙක් තුළ ක්‍රියාත්මක වන්නේ, පිටාර ගලන්නේ දෙවියන් වහන්සේගේ බලයයි, වරප්‍රසාදයයි.

තමා සැබවින්ම දෙවියන් වහන්සේගේ සේවකයෙක් බව ශුද්ධෝත්තම පියතුමා ඔප්පු කර ඇත. එතුමා සේවය කරන්නේ දෙවියන් වහන්සේට පමණක් බව සන්නිවේදනය කර ඇත. පාප් ධූරයටත් වඩා වටිනා දේවල් දෙවියන් වහන්සේ එතුමාට ලබාදී ඇති බව එතුමා ගත් තීරණයෙන් අපට පෙන්වා දී ඇත. පාප් වහන්සේ කෙනෙක් ජීවත් වන්නේ පාප් ධූරය සඳහා නොව දෙවියන් වහන්සේගේ මහිමය උදෙසායි. පාප් ධූරය දෙවියන් වහන්සේට සේවය කිරීම සඳහා ඇති එක මාර්ගයක් පමණි. පාප් ධූරය දේව රාජ්‍යයේ ප්‍රධානතම හොරණෑවයි.

දෙවියන් වහන්සේ මත යැපෙන්නේ නැති පුද්ගලයාට එවැනි තීරණයක් ගැනීම අතිශයින්ම දුෂ්කර කාර්යයකි. ආධ්‍යාත්මික පරිණතභාවයක් නැති පුද්ගලයාට එවැනි තීරණයක් ගැනීම අතිශයින්ම අමිහිරි අත්දැකීමකි. අපි ගන්නා තීරණාත්මක තීරණ මගින් අපි කවුද යන්න ලෝකයටම හෙළිවේ. අප ගන්නා සෑම තීරණයක්ම අපගේ ආත්මයේ පරාවර්තනයකි.

ආධ්‍යාත්මික ලෙස පිරිහුණු පුද්ගලයෙකුට පාප් ධූරය මෙන් බලයක් ලැබුනොත් ඔහු හෝ ඇය කෙසේ හැසිරෙයිද? විශේෂයෙන් පාප් ධූරය විවේචනය කරන පුද්ගලයන්ට එවැනි සුවිශාල බලයක් අයිති වුනහොත් කොයි ආකාරයෙන් ක්‍රියා කරයිද? එවැනි පුද්ගලයන් බලයට කොයිතරම් කෑදර කමක් දක්වයිද? කොතරම් දුරට ඵළුව ඉදිමුවා ගනීද? කොතරම් දුරට බලය අයුතු ලෙස පාවිච්චි කරයි ද? කොතරම් ප්‍රමාණයක උඩගුවක් ඇති කර ගනීද? දැනට සිටින පාප්වහන්සේට වඩා උදාර ගතිගුණ, ශ්‍රේෂ්ඨ ගුණාංග ඔවුන් තු ළ පවතී ද? එවැන්නන් සැබෑ ලෙසම පරාර්ථකාමී ලෙස මානව සංහතියට සේවයක් කරයිද?

සොළොස්වන බෙනඩික් පාප් තුමාව විවේචනය කරන්නන්ට එතුමාගෙන් ඉගෙන ගැනීමට බොහෝ දේවල් ඇත. එතුමාගේ ජීවිතයෙන් ලබාගත හැකි බොහෝ ආදර්ශයන් ඇත. මෙම පාප් තුමාව ඉතා දරුණු ලෙස විවේචනය කරන්නන් තුළ ඉතා ගැඹුරු වටිනාකම් සහ උදාර චරිත ලක්ෂණයන් මා දැක නැත. මෙම පාප් තුමා සර්ව සම්පූර්ණ, අඩුපාඩුකම් විරහිත පුද්ගලයෙක් යයි මා කියන්නේ නැත. නමුත් එතුමාගේ විවේචකයන් අතර ආදර්ශවත් ජීවිත ගත කරන්නන් සොයා ගැනීමද දුෂ්කර කාර්යයකි. එසේනම් අප මෙම පාප් වහන්සේ සමග එකඟ වුවත් නොවුවත්, එතුමාගෙන් ඉගෙන ගැනීමට බොහෝ දේවල් ඇත. එතුමාගේ චරිතය තුළ ඇති යහපත් ගුණාංග අපි අගය කළ යුතු වෙමු. එතුමා පාප් ධූරයේ සිට ගන්නා



ලද ධෛර්යමත් තීරණ ක්‍රියාත්මක කිරීමට අධිෂ්ඨාන කර ගත යුතු වෙමු. එමෙන්ම මෙම පාප් තුමාව නිවැරදිව සහ ගැඹුරින් තේරුම් ගැනීමට සමස්ත කතෝලික දහමේ මූලික ස්වභාවය ද නිවැරදිව සහ ගැඹුරට තේරුම් ගත යුතුයි. ඒ සඳහා ජන මාධ්‍ය මගින් ප්‍රචලිත කරන ලද සංකල්ප වන 'සම්ප්‍රදායික' (Conservative) 'ප්‍රගතිශීලී' (Progressive), 'වාමාංශික, 'දක්ෂිණාංශික', 'ලිබරල්', 'දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පෙර' යනාදී ඉතා ලාබ සහ බාල සංකල්ප කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ.

මහා කතෝලික සම්ප්‍රදාය 'ප්‍රගතිශීලි' හෝ 'සම්ප්‍රදායික' වත් , 'දක්ෂිණාංශික' හෝ 'වාමාංශික' වත් 'ලිබරල්' හෝ 'ප්‍රතිගාමී' වත් හෝ නොවේ. කතෝලික සභාව ලෝකය දෙස බලන්නේ දේශපාලන මතවාදවල දෘෂ්ඨි කෝණවලින් නොවේ. කතෝලික දහම තුළ ඉහත කී කණ්ඩායම් එකඟ වෙන මෙන්ම එකඟ නොවන ඉගැන්වීම්ද ඇත. උදාහරණ කිහිපයක් ගනිමු. කතෝලික සභාව ගබ්සාවට සම්පූර්ණයෙන්ම විරුද්ධය. එය දක්ෂිණාංශික දේශපාලන කණ්ඩායම් ද එකඟ වන කරුණකි. එමෙන්ම කතෝලික සභාව මරණීය දණ්ඩනයද (කිසිසේත්ම පුනරුත්ථානය කළ නොහැකි දරුණු මිනී මරුවන් හැරෙන්නට) අනුමත නොකරයි. එය වාමාංශික දේශපාලන කණ්ඩායම් සතුටට පත් වෙන කාරණයකි. කතෝලික සභාවේ සමාජ සාධාරණත්වය සහ සමානතාවය ගැන ඉගැන්වීම් 'ලිබරල්' කණ්ඩායම්වල ප්‍රශංසාවට භාජනය වී ඇත. එමෙන්ම කතෝලික සභාවේ විවාහය ගැන ඉගැන්වීම් සමහර කණ්ඩායම් සලකන්නේ ඉතා 'ප්‍රතිගාමී' ඉගැන්වීම් ලෙසයි. (විශේෂයෙන්ම සම ලිංගික විවාහයෙ' පාපකාරීත්වය).

කතෝලික සභාව ප්‍රධාන කාර්යභාරය එක් එක් කණ්ඩායම් සෑහීමකට පත් කිරිම නොව, ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචියට ජීවිත පරිත්‍යාගයෙන් සාක්ෂි දැරීමයි. එහිදී සභාව ජනප්‍රිය දේශපාලන ක්‍රියාවලියක නියලෙන්නේ නැත. සභාවේ ඉගැන්වීම් සමග එකඟවෙන්නේ කවුද එකඟ නොවන්නේ කව්ද කියා කරදර වන්නේ නැත. ඇයගේ කාර්යභාරය වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ න්‍යාය පත්‍රය මේ ලෝකය තුළ ක්‍රියාත්මක කරවීමට වෙහෙසීමයි.

කතෝලික දහම සුවිශේෂීවූ දහමකි. එයට සමාන කළ හැකි වෙනත් දහමක් නැත. එයට සුවිශේෂිතවූ අනන්‍යතාවයක්, සමාජ මෙහෙවරක්, දූත කාර්යයක් ඇත. කතෝලික දහම දැනට පවතින කිසිදු දේශපාලන මතවාදයක් සමග කිසිසේත්ම සංසන්දනය කළ නොහැකිය. එය වෙනත් ආගම් සමගද සංසන්දනය කළ නොහැකිය. කතෝලික දහම තේරුම් ගත යුත්තේ කතෝලික දහමේ දෘෂ්ඨි කෝණයෙන් පමණි. කතෝලිකයකු නොවන පුද්ගලයකු කතෝලික දහම නිවැරදිව තේරුම් ගැනීම දුෂ්කරය. එය හරියා කාරව තේරුම් ගැනීමට කතෝලික සභාවේ ඇතුළතට පැමිණිය යුතුවේ. පාප් ධූරයේ මූලික ස්වරූපය තේරුම් ගැනීමට කතෝලික දහමේ මූලික ඉගැන්වීම් ගැඹුරින් තේරුම් ගත යුතුවේ.

කතෝලික දහම සෑම දෙයක්ම සම තුලිතව ආරක්ෂා කර නඩත්තු කිරීමට උත්සාහ දරන දහමකි. සෑම දෙයක්ම දෙස සදාකාලීත්වයේ දෘෂ්ඨි කෝණයෙන් බැලීමට වෙහෙස මහන්සි දරන දහමකි. එය කතෝලිකයන්ට පමණක් නොව සමස්ත මානව සංහතියටම සේවය කිරීමට තීරණයක් ගෙන ඇති දහමකි. කතෝලික දහම දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් විශ්වය සම්බන්ධයෙන් සහ මානව ජීවිතය සම්බන්ධයෙන් සෑම සත්‍යයක්ම සමතුලිතව සහ සමබරව ආරක්ෂා කිරීමට උත්සාහ දරන දහමකි. එය අන්තවාදී දහමක් නොවේ. අපි ඒ සඳහා උදාහරණ කිහිපයක් සලකා බලමු.

කතෝලික සභාව දෙවියන් වහන්සේ පිළිබඳව එක අදහසකට පමණක් එල්බ ගෙන එය සම්පූර්ණ සත්‍යය මෙන් ඉදිරිපත් නොකරයි. දෙවියන් වහන්සේ ස්වර්ගයේ මෙන්ම අප අතරත් වාසය කරන බව කතෝලික සභාව උගන්වයි. එමෙන්ම දෙවියන් වහන්සේගේ ඒකත්වය මෙන්ම ත්‍රිත්වීය ස්වභාවයද අවධාරණය කරයි. උන්වහන්සේව තේරුම් ගත හැක්කේ උන්වහන්සේට සම්පූර්ණයෙන්ම ආදරය කිරීමෙන් පමණක් බවද උගන්වයි. දැනීම යනු ආදරය කිරීමෙන් ලබා ගන්නා දෙයක්ය. එසේම ජේසුස් වහන්සේ මරිය තුමියගෙන් උපත ලැබුවාක් මෙන්ම ආරම්භයේ සිටම වාසය කොට ඇත. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සැබෑ මනුෂ්‍යයා මෙන්ම සැබෑ දෙවියන්ද වන සේක. එනම් මනුෂ්‍යත්වය සහ දේවත්වය යනු එකිනෙකට පරස්පර විරෝධී සංකල්පයන් දෙකක් නොවන බවයි.

එමෙන්ම කතෝලික සභාව විවාහය මෙන්ම බ්‍රහ්මචර්යාවද සක්‍රමේන්තුවක් ලෙස සලකයි. මෙම යථාර්ථයන් දෙකම මානව සංහතියට අවශ්‍යය. මානව නිදහස සහ දේව වරප්‍රසාද වල සම්බන්ධතාවයත් අවධාරණය කරයි. දේව වරප්‍රසාද මගින් මානව නිදහස අහෝසි නොකර එය තව තවත් පරිපූර්ණ කරනු ලබයි. උපවාස රැකීමත්, විශේෂ මංගල්‍ය දිනයන් ඉතා ජයට සැමරීමත්, යන කරුණු දෙකම අවධාරණය කරයි. ශබ්ද නගා යාච්ඤා කිරීම මෙන්ම නිසලතාවයත්, සක්‍රමේන්තු වල වටිනාකම මෙන්ම දේව වචනයේ වටිනාකමත්, සභානායකත්වයේ ධූරාවලිය මෙන්ම කුඩා කිතුනු සංසවල වටිනාකමත්, භාවනාත්මක සහ ක්‍රියාශීලි දූත මෙහෙවරත්, සභා නායකයින්ට කීකරු විම සහ හෘද සාක්ෂිය නිවැරදිව විමසීමත්, සභාවට ඉතා පක්ෂපාතීව සේවය කිරීම සහ විචාරාත්මක බුද්ධියත්, සභා නීතියේ වැදගත්කම සහ ප්‍රේමයට ප්‍රමුඛතාවය දීමත්, සරලභාවය සහ දේවස්ථාන සංකේතාත්මකව සැරසීමත්, පෞද්ගලික දේපළ අයිති කර ගැනීමේ නිදහස (එය ද්වීතීය අයිතියක් වූවත්) සහ කිසිම ද්‍රව්‍යමය දෙයක් අයිති කර නොගෙන දෙවියන් වහන්සේ මත සම්පූර්ණයෙන් යැපීමත්, ශුද්ධාත්මයාණන් වහන්සේට අවදිවීම සහ සභා නායකයන්ට අවනත වීමත්, ශුද්ධවූ ත්‍රිත්වයට වන්දනාමාන කිරීම සහ ශාන්තුවරයන්ට ගරු කිරීමත් යනාදී සංකීර්ණ සත්‍යයන් බොහෝමයක් කතෝලික සභාව ආරක්ෂා කරයි. සෑම සංකල්පයකම පැති දෙකක් ඇත.

කතෝලික සභාව අනෙකුත් සෑම කිතුනු සභාවකින්ම වෙනස් වීමට හේතුවද එයයි. ජීවිතයේ සංකීර්ණත්වය කතෝලික සභාවේ ඉගැන්වීම් වලින් මනාවට පිළිබිඹු වේ. මානව සංහතියට සැබවින්ම සේවය කළ හැක්කේ එවැනි ගැඹුරු දහමකට පමණි. පාප් ධූරයේ ප්‍රධාන වගකීම එවැනි සුවිශේෂ වූ දහමක් ආරක්ෂා කොට අනාගත පරපුරට දායාද කර දීමයි. කතෝලික දහම තුළින් ස්වර්ගය පිළිබඳව පූර්ව රසයක් විඳිය හැකිය. ස්වර්ග රාජ්‍යයට ඇතුළු වන පෘථිවියේ දොරටුව කතෝලික සභාවයි. සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා එම සභාව තුළ බිහිවූ ශ්‍රේෂ්ඨ කතෝලිකයෙකි. විශ්‍රාම යෑමට එතුමා ගත් තීරණය තුළින් එම ශ්‍රේෂ්ඨත්වය තව තවත් අලංකාරව බැබලීමට පටන් ගෙන ඇත. පාතිරීමට පටන් ගෙන ඇත. එමගින් සමස්ත මානව සංහතියටම මහඟු ආදර්ශයක් සපයා ඇත.

ඔබත් එවැනි උදාර සහ ශ්‍රේෂ්ඨ කතෝලිකයෙක් වීමට උත්සා නොදරන්නේ ඇයි?

**මහාචාර්ය ඇන්ටන් මීමන**

# ජන වන්දනාව

**පසුගිය සතිය හා සබැඳේ ....**

එහෙත් එය මිනිස් ජීවිතයට නව අර්ථයක් දෙන ක්‍රිස්තුන් වහන්සේ සමඟ ඇතිවන පෞද්ගලික හමුවකි" (එම 7)

විශ්වාසය යනු තමන් අනාවරණය කරන දෙවියන් වහන්සේ වෙත දක්වන ප්‍රතිචාරයක් ලෙස මිනිසා උන්වහන්සේ සමඟ ඇති කර ගන්නා පුද්ගලාන්තර සබඳතාවයක් ලෙසට කතෝලික සභාවේ ධර්මෝපදේශය තුළ දක්නට ලැබෙන අවබෝධය, සත්‍ය විශ්වාසය ඉගැන්වීම පිළිබඳ ශු. සභාවේ ශ්‍රේෂ්ඨතම අධිකාරිය වන ශුද්ධෝත්තම පියතුමන්ලාගේ ද අවබෝධය වන බව ඉතා පැහැදිලිය. මා හට හැඟෙන පරිදි විශ්වාසයේ වසර අප එකිනෙකා වෙත එල්ල කරන පළමුවන අභියෝගය වන්නේ විශ්වාසය නමැති පරිශුද්ධ සංකල්පය පිළිබඳව පැහැදිලි අවබෝධයක් අප එකිනෙකාගේ හදවත් තුළ නිදන් ගත කර ගැනීමය.



## විශ්වාසය යනු...

### විශ්වාසය දේව දීමනාවකි

කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 162 විශ්වාසයේ සුවිශේෂී අංගයක් වෙත අපගේ අවධානය යොමු කරයි. විශ්වාසය දේව දීමනාවකි.

"විශ්වාසය යනු **දෙවියන් වහන්සේ පූර්ණ නිදහසින් යුතුව මිනිසා වෙත දානය කරන තිළිණයකි"** (C.C.C. 162)කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 153 විශ්වාසයේ මෙම ගුණාංගය වඩාත් තහවුරු කරයි. විශ්වාසය දේව දීමනාවක් යන සත්‍යතාවය තහවුරු කිරීම සඳහා ශුද්ධ ලියවිලි පදනමක් වශයෙන් කතෝලික සභාවේ ධර්මෝපදේශය යොදා ගන්නේ මතෙව් 16:13-17 යි. මෙම සිද්ධිය තුළින් ජේසුස් වහන්සේ අවධාරණය කරන්නේ "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය" (මාක් 16:16) යන පේදුරුතුමාගේ මහා ප්‍රකාශනය "මිනිස් මඟකින්" කෙරුණු එළිදරව්වක් නොව "ස්වර්ගීය පියාණන් වහන්සේ" විසින් කරන ලද අනාවරණයක් වන බවයි. (මාක් 16:17)

**"විශ්වාසය දේව දීමනාවකි. එය දෙවියන් වහන්සේ වෙතින් මිනිසා වෙත දානය කෙරෙන පාරලෞකික ධර්ම ගුණයකි.** (C.C.C. 153)

දෙවියන් වහන්සේ පරිපූර්ණ නිදහසකින් යුතුව විශ්වාසයේ තිළිණය තමන් කැමති කෙනෙකු වෙත කැමති ආකාරයකින් දානය කරන සේක. කිසිවෙකුට මෙම දීමනාව දෙවියන් වහන්සේ වෙතින් බලෙන් ලබාගත නොහැකිය. විශ්වාසයේ දීමනාව දෙවියන් වහන්සේ මිනිසා වෙත දක්වන අසීමිත ප්‍රේමයේ ප්‍රබල ප්‍රකාශනයකි. මෙම ප්‍රේමය තිළිණයට මිනිසා දෙවියන් වහන්සේ වෙත දැක්විය යුතු ප්‍රතිචාරයන් දෙකක් ගැන ශු. ලියවිල්ල සඳහන් කරයි.

1. පුදුමාකාරයෙන් වර්ධනය වන තෙසලෝනික වරුන්ගේ ඇදහිල්ල ගැන දෙවියන් වහන්සේට තුති පිදිය යුතු බව ශු. පාවුළු තුමා අවබෝධ කර ගනියි. (2 තෙසලෝනික 1:3). විශ්වාසයේ දීමනාව ලබා ගන්නා දෙවියන් වහන්සේ වෙත දැක්විය යුතු පළමුවන ප්‍රතිචාරය ස්තුතිය හා ප්‍රශංසාවයි.

2. දේව දීමනාවක් වන විශ්වාසය තමන් තුළ වර්ධනය කරගනු සඳහා ගත යුතු එකම ක්‍රියා මාර්ගය එම විශ්වාසයේ දායකයාණන්ට බැගෑපත්ව යාච්ඤා කිරීම බව අපෝස්තුළුවරු දොළොස් දෙනා තේරුම් ගෙන සිටියහ. "අපේ ඇදහිල්ල වැඩි කළ මැනව" යි ඔවුහු ස්වාමින් වහන්සේට යාච්ඤා කළේ ඒ නිසාය. (ලූක් 17:5). අබ ඇටයක පමණක්වත් ඇදහිල්ලක් නැති අප විශ්වාසයේ දීමනාවට දක්වන දෙවන ප්‍රතිචාරය විය යුත්තේ "ස්වාමිනී, අපේ ඇදහිල්ල වැඩි කළ මැනවයි (ලූක් 17:5) නිරන්තරයෙන් යාච්ඤා කිරීමයි.

### විශ්වාසය මිනිස් ක්‍රියාවකි.

දෙවියන් වහන්සේ විශ්වාසය අරබයා මිනිසා තුළ ඉටු කරන ක්‍රියාවලිය මිනිසා වෙත විශ්වාසයේ දීමනාව දානය කිරීමට පමණක් සීමා නොවේ. මිනිසා තුළ විශ්වාසයේ දීමනාව එල ගැන්වීම සඳහා දෙවියන් වහන්සේ ඉටු කරන ක්‍රියාවලිය පිළිබඳව ශුද්ධ සභාවේ ධර්මෝපදේශය අංක 153 පැහැදිලි ඉගැන්වීමක් ඉදිරිපත් කරයි. මෙම ක්‍රියාවලියේ අංග දෙකක් පැහැදිලිව හඳුනාගත හැකිය.

1. විශ්වාසය මිනිසා තුළ ක්‍රියාත්මක වීමට නම් ; ඒ සඳහා ඔහු මෙහෙයවන හා ඔහුට සහය වන දේව වරප්‍රසාදය ලැබිය යුතුය.
2. දෙවියන් වහන්සේ වෙතට යොමුවන පරිදි මිනිස් හදවත ස්පර්ශ කරන හා සත්‍ය පිළිගැනීමට හා විශ්වාස කිරීමට පහසුවන පරිදි මිනිසාගේ දෙනෙත හා මනස විවර කරන ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභ්‍යන්තරික සහයද මිනිසාට ලැබිය යුතුය. (C.C.C. 153)

☛ 15 පිටුවට

✍ ගරු විල්ප්‍රඩ් පින්තු පියතුමා



# කඩතුරාව හැර බලන්නට

**සියල්ල සූදානම් මොකට ද?, කල්වාරි යන්නට.... කොහේද?**

චතාරිකය හෙවත් කොරොස්ම කාලයට පා තබන කොයි කාගෙත් කැමැත්ත නම් කල්වාරි පුදබිමකට ගොස් ජේසු සමිඳුන්ගේ කල්වාරි ගමන සිහි කරමින් පාදනමස්කාරය කිරීමයි. එය සැබෑය. අවශ්‍යය. ජේසු සමිඳුන් ගමන් කළ අයුරු ගමන් කරන්නට භක්තියෙන් ගරු ගාම්භීරයෙන් සියල්ලෝ කැමතිය. අපගේ සිත් සැනසෙන්නේත් එවිටය. එය ද හරිය වැරදි නැත. එලෙසම මේ දින හතලිහක පශ්චත්තාපික කාලයකි. ඇතුළාන්තය සුවපත් කරගන්නට ජේසු සමිඳුන්ගේ කුරුසියේ ගමනට ඇතුල් වෙමින්, එතුමන් සමඟ ගමන් කරන, වැටෙන, නැගිටින කාලයයි.

ගමන් කිරීම තුළ අපගේ කුරුස දරාගෙන, බර වැඩි නිසාවෙන් ම හතිලන්නට වේවි. සුසුම්ලන්නට වේවි. අපගේ ජීවිතේ පශ්චත්තාපය එයයි. වැටීම තුළ අපගේ පාපයට වන්දි ගෙවීම, අමනාපකම් වලින් නිදහස් වන්නට, නිහතමානී හා බැහැපත් වන්නට, අසාධාරණයන්ට එරෙහි වන්නට, සමාදාන වන්නට යන මොහොත වැටීමයි. නැගිටීම නම් එසේ කිරීම යි.

උසස් යන නාමයෙන් බුද්ධිය ලබා උපන්නෝ මිනිසාමය. එසේ නම් බුද්ධිය යහපත කරා යොදවන්නටත් හැක්කේ මිනිසාට ම ය. මෙය අවදි වන්නට කාලයයි. පළිගැනීම, වෛරය, නැමති කඩතුරාවෙන් වැසී තිබෙන සමාජයේ හදවත විවෘත කරන්නට, පාපය නමැති වලාපටලය ඉරා දමන්නට ඇරියුමකි.

එසේ නම්, මිනිස් අප තුළ "ආදරය" කිරීමේ ශක්තිය වගා කිරීම, සමාජයේ හදවතට ජීවයේ ජලය පෙවීමේ ඇරැඹුමයි. චතාරිකයේ කල්වාරි පුදබිමේ නමස්කාරය, එක්වරුශීලය රැකීම, යාච්ඤාව මෙයම වේ ජීවින්ගේ හදවතේ.... වෙනස් වීමයි!

✍ ගරු දමයන්ති පැවිදි සොයුරිය (ශු.ප.)
රාජගිරිය





# පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය

**පසුගිය සතිය හා සබැඳේ**

**ගීතාවලියේ කර්තෘත්වය**

සාම්ප්‍රදායිකව, ගීතාවලියේ කතුවරයා දාවිත් රජතුමා බව පැවසේ. ශු. බයිබලයේ සඳහන් පරිදි හා ජනවන්දනාව සංගීතය කෙරෙහි දාවිත් රජතුමා දක්වා ඇති යොමුව නිසා කිතුනු යුගයට කලින් පැවැති ජුදා සම්ප්‍රදාය විසින් තෙහිලි ගීත බොහොමයක කර්තෘත්වය දාවිත් රජතුමා වෙත පවරා ඇත. (2 සාමුවෙල් 6,5. 13-16). කර්තෘත්වය දාවිත් වෙත පිරිනැමුණු සමහර තෙහිලි ගීත පසුකාලීන සම්භවයක් සහිත වෙයි. නිද. තෙහිලි ගී 51 මෙම ගීතයේ බස් වහර විප්‍රවාසී යුගයට අයත් ය. එනම් ක්‍රි.පූ. 587 න් පසු එන එහි අවසාන වගන්තිවල, විනාශ වූ බව කියැවෙන ජෙරුසලෙම ගොඩනඟන ලෙස දෙවිඳුන් හට යැදුමක් සනිටුහන් වෙයි. එලෙසම මුල් කාලීන රාජ්‍ය සමයට අයත් තෙහිලි ගීත ද ඇති බව කිව යුතුය. නිද. තෙහිලි ගීත 110.

## 02. තෙහිලි ගීත අධ්‍යයනය

තෙහිලි ගීත අධ්‍යයනය සඳහා විවිධ ක්‍රම යොදා ගෙන ඇත. පෞද්ගලික හෝ ස්ව අධ්‍යයනයක් සඳහා යොදා ගත හැකි අදියර පහකින් සමන්විත සැලැස්මක් මෙහි දී පාඨකයා වෙත සැපයීමට අදහස් කරමු. එය නිබන්ධන විමර්ශන ක්‍රමය පදනම් කරගෙන ය.

1. සාහිත්‍යමය ස්වරූපය නැතහොත් තෙහිලි ගීත වර්ගය නිශ්චිතව දැන ගැනීම. නිද. ප්‍රශංසා ගීත, විලාප ගීත ආදි වශයෙන්.

2. සම්පාදිත පසුතලය කතුවරයා කිනම් ආකාර කෙනෙක් ද යන්න හා ගීත සම්පාදනය වූ අවස්ථාව මේ සඳහා යෙදෙන පාරිභාෂික ව්‍යවහාරය "සිට්ස් ඉම් ලේබෙන්" ය. ( Sitz im Leben)

3. බෙදුම සඳහා හේතු දක්වමින්, තෙහිලි ගීතයේ අන්තර්ගත තේමාවන් අනුව එය කොටස්වලට බෙදා වෙන් කිරීම.

4. අර්ථ නිරූපණය : ගීතයේ ප්‍රධාන වචන හා වාක්‍යාංශ විස්තර කිරීම හෙවත් විග්‍රහය.

5. පණිවුඩය (දේව ධර්මය): ගීතයේ අන්තර්ගතය අද අපට දෙන පණිවුඩය.

**95 වන තෙහිලි ගීතය**

**ගීතයේ සාහිත්‍යමය ස්වරූපය**

මෙම ගීතයේ 1 - 7 දක්වා වගන්ති තුළ (විශේෂයෙන් 7 වන වගන්තියේ) ඉශ්‍රායෙල් ජනතාව දේව ජනතාව බවට පත්වූ ගිවිසුම මෙන්ම මැවීම සම්බන්ධ දෙවියන් වහන්සේගේ මහත් ක්‍රියා වෙනුවෙන් උන්වහන්සේ පැසසීමට කෙරෙන ඇරියුමක් අන්තර්ගත වෙයි. එබැවින් සාහිත්‍යමය ස්වරූපය නැතහොත් මෙහි තෙහිලි ගීත වර්ගය ප්‍රශංසා ගීතයක් බව නිගමනය කළ හැකිය.

ඉදිරියට...





# කිතු සමිඳුන්ගේ මහිමාලංකාරය තුළ අපි එක්සිත් වෙමු

## පෙබරවාරි 24 - චතාරික සමයේ දෙවන ඉරුදින

**ඉරුදින සුපුවත ගෙනහැර දක්වන්නේ ශු. ලූක් සුභාරංචියට අනුව ජේසුස් ස්වාමිදරුවන්ගේ අන්‍ය රූප විලාශයයි. මෙම සුවිශේෂය හා ඉතා ගැඹුරින් සම්බන්ධ වන්නාවූ පැරණි ගිවිසුමෙහි ඒක පාර්ශ්වයීය ගිවිසුමක් වන දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ කළ ගිවිසුම පළමු කියවීමෙන් ද, ශු. පාවුළුතුමා සිරගත වී සිටි අවධියක පිලිප්පිවරුන්ට යැවූ හසුනින් මාංශික තෘෂ්ණාවලට වහල් වූවන්ගේ අවසානය විනාශය වන හෙයින් අපි කුරුසියේ මිතුරන් වී සමිඳාණන් වහන්සේ තුළ ස්ථිරව සිටිය යුතු බව දෙවැනි කියවීමෙන් ද උගන්වයි.**

අන්‍යරූප විලාශය ඇති සැටියෙන් වටහා ගන්නට නම් දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමඟ කළ ගිවිසුම හා එහි ස්වභාවය විමසා බැලිය යුතුමය. පළමුවෙන් ආබ්‍රහම් තුන් අවුරුදු වැස්සියක ද, එළු දෙනකද, බැටළුවකු ද, කොබෙයියකු හා පරවි පැටවකු දේව අණ පරිදි ගෙනාවේය. ඔහු පක්ෂීන් හැර අන් සතුන් දෙපළු කළේ ය . සතුන් දෙපළු කොට ගිවිසුමට එළැඹෙන පාර්ශ්වයන් ඒ මළකුණු හරහා ගමන් කිරීම එදා ගිවිසුම් සනිටුහන් කිරීමේ සම්ප්‍රදාය විය. ඉන් කියැවුණේ අදාළ ගිවිසුම කඩකරන පාර්ශ්වයක් වේද, මළකුණට සිදුවූ දේ ඒ පාර්ශ්වයටත් එලෙසම විය යුතු බවය. කරුණු කාරණා මෙසේ වුවද ඔහු පක්ෂීන් දෙපළු නොකළේ ඇයි? වැස්සිය ද, එළු දෙන ද, බැටළුවා ද පොළොවට පය ගසා සිටින සතුන් ය. මේ "පොළොවට පය ගසා සිටීම" යනු කුමක් ද? එය අවබෝධ කර ගත හැක්කේ අන්‍ය රූප විලාශය මගිනි.

තාබෝර් කන්ද මත දී සිදු වූ ජේසුස් වහන්සේගේ අන්‍ය රූප විලාශය සියැසින් දැක ගැනීමට භාග්‍ය ලද පේදුරු, ජොහාන් හා ජාකොබ් යන ශ්‍රාවකයන්ට මෙය අමතක නොවන අත්දැකීමක් වූවාට සැක නැත. මෙහි පැහැදිලි තල දෙකක් ඇත. එකක් නම් ජේසුස් වහන්සේ, මෝසෙස් හා එළියාගෙන් සැදුම් ලත් තලයයි. මෝසෙස් තුමා වූ කලී රතු මුහුදෙන් ජනයා එතෙරට ගෙනගිය නායකයා ය. එළියා වූ කලි ඊශ්‍රායෙල් දිවැසාවලියේ අද්වීතිය චරිතයකි. මෙනයින් බලන කල මේ දෙදෙනා ජුදා නීතිය හා දිවැසාවලිය ක්‍රිස්තුන් වහන්සේ තුළ පූර්ණත්වයට පත්වන ආකාරය ඉඟිකරයි. මේ තිදෙනාගෙන් සැදුම් ලත් තලයේ එක්සිත් භාවයක් ඇත. එනම් ඔවුන් සාකච්ඡා කරමින් සිටියේ ජේසුස් වහන්සේ ජෙරුසලමෙහි කරන්නට යන්නාවූ ජීවිත පූජාව පිළිබඳවයි. (ලූක් 9:31). ජේසුස් වහන්සේගේ වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබැළී පුදුමාකාර වූ මහිමාලංකාරයක් දිස්වූයේ ඒ එක්සිත්භාවය නිසාමය. මෙසේ උන්වහන්සේලා නිසැකවම "පොළොවට පය ගසා සිටියාහ."

මෙම එක්සිත් වූ තලයට ප්‍රතිවිරුද්ධ තලයක ගෝලයෝ තිදෙනා සිටිති. "ස්වාමිනී මෙහි සිටීම අපට වාසනාවකි. එබැවින් මණ්ඩප තුනක් සාදමු; එකක් ඔබටය. එකක් මෝසෙස්ටය; එකක් එළියාට" යි පේදුරු තුමා කළ ප්‍රකාශයෙන් එවැනි එක්සිත්කමක් ප්‍රකාශ නොවන්නේ ය. මණ්ඩප තුන වනාහි බෙදී යාමක ප්‍රතිඵලයකි. තවද "පේදුරු තුමන් කුමක් කියන්නේ දැයි නොදැන" (ලූක් 9:33) යන්නෙන් ශ්‍රාවක තලයේ තවත් ලක්ෂණයක් ඉස්මතු කරයි. එනම් එක්සිත් බව නොමැති වූ තැන අප කුමක් කරන්නේ ද, කුමක් කියන්නේ ද යන්න නොදැන සිටීමයි. මෙම එක්සිත්කම වනාහි පියාණන් වහන්සේගේ සිත (දේව අභිමතය) සහ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සිත එකිනෙක යාවීමයි. නොඑසේ නම් පියාණන් වහන්සේගේ කැමැත්ත පුත්‍රයාණන් වහන්සේගේ අභිප්‍රායම වීමයි. ගෝලයන් දුටුවේ මෙම එක්සිත්කම හරහා විහිදුනු තේජශ්‍රීයයි, මහිමාලංකාරයයි. ඔවුන් නුදුටු දෙය නම් එක්සිත්කමයි. දේව මහිමාලංකාරය අප තුළ දිස්වන්නේ අපිදු පොළොවට පය ගසා සිටින තුරාය. එනම්, ආබ්‍රහම් තුමා පොළොවට පය ගසන සතුන් දෙපළු කළාක් මෙන් අපගේ මිනිස් අභිමතය, ආශාව, රුචිය, ඇල්ම, තෘෂ්ණාව, බලාපොරොත්තු හා සැලසුම් යනාදිය දෙපළු කොට දෙවියන් වහන්සේට ඒ මැදින් ගමන් කිරීමට ඉඩ සැලසීමයි. දේව මහිමාලංකාරය අප තුළ දිස්වන්නේ එවිටයි.

තවද ආබ්‍රහම් ගිවිසුමට අවශ්‍ය සියල්ල සූදානම්කොට තබා දෙවියන් වහන්සේ වඩින තුරු බලා සිටියේය. නමුත් සවස් වන තුරු උන්වහන්සේ වැඩියේ නැත. ඒ වෙනුවට ආවේ මළකුණු ආහාරයට ගන්නා ගිජු ලිහිණියන් ය. අපගේ ජීවිත යථාර්ථය ද මෙයයි. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ කාලය ගන්නා සේක. අප බලාපොරොත්තුවන තරම් ක්ෂණයකින් ඇතැම් විට අපට පිළිතුරු නොදෙන සේක. උන්වහන්සේට අපට තරම් හදිසියක් නොවන්නේ ය.

☛ 15 පිටුවට

අම්පිටිය ජාතික දෙව්සත්හලේ
ගොන්සාල්වේස් සිංහල ආයතනයේ
✍ ගරු ඇන්ටන් දිනේෂ් ප්‍රියසාද් තේවාචාර්ය තුමා

විශේෂාංග

# තාරුණ්‍යයෙන් ඔබ්බට... ජීවිතය සුන්දරයි

තාරුණ්‍යය හෙවත් යොවුන් විය ජීවිතයේ සුන්දරම අවධියයි. කෙනෙකුගේ ළමා වියෙන් පසුව එළැඹෙන මේ සමය තාරුණ්‍යයේ හැඩතල ප්‍රදර්ශනය කිරීම බොහෝ විට සිදුවන්නකි. යෞවනත්වය තුළ ඔහු හෝ ඇය සූදානම්වනුයේ ලෙස සලකා තම ජීවිතයෙන් බැහැර කිරීමට ද ඇතැමෙක් උත්සාහ කරති. විශ්ව විද්‍යාල ප්‍රවේශය තුළ අධ්‍යාපනයට, ඔවුන් වෙහෙසද්දී දේශපාලන මතවාදයන් හිස දරාගෙන සටන් වදින්නේ ද මේ යෞවන යෞවනියන් ය. ඔවුන්ගේ යුක්තිය, සාධාරණය, එඩිතරකම කිසියම් කාලයකට සීමා වූවකි. වෛරය, පළිග ැනීම, මේ තාරුණ්‍යය තුළ අත රඳවන්නට බලයේ සිටින හෝ පරාජිත හෝ දේශපාලකයින් බොහෝ විට උත්සාහ දරනු ඇත. ඇතමුන් දේශපාලන අතකොළු බවට

දේව සේවය සඳහා යොමුවන යෞවන / යෞවනියන් කොතරම් ද? ඔවුන්ගේ ජීවිත කථාන්තරය කොතරම් සුන්දර ද? පැරැණි ගිවිසුමේ මෙන්ම නව ගිවිසුම තුළ ද, දෙවිඳුන් තුළ දේව සේවය සඳහා කැපවුන තාරුණ්‍යයෙන් ඔබ්බට ජීවිතය සුන්දර කරගත් චරිත බොහොමයක් අපට හමුවේ.

ආධ්‍යාත්මික ජීවිතය තුළ දෙවිඳුන් සතුටු කිරීම ඔවුන්ගේ ආශාව විය. ස්නාවක ජුවාම්, කන්‍යාමරියෝත්තමාවන්, ශ්‍රාවක ජුවාම්, සාවුල් තරුණයා වැනි චරිත මෙන්ම ශු. සභා ඉතිහාසය තුළ හමුවන ශුද්ධවර ශුද්ධවරියන් ද තාරුණ්‍යය තුළ හෝ තම ජීවිතයේ තේමාව කරගෙන ඔවුන් දෙවිඳුන්ට සමීප වූහ. ක්‍රිස්තුන් වහන්සේ තම ස්වාමියාණන් ලෙස පිළිගැනීම හා අදහාගැනීම තුළ මෙම ජීවිත වෙනස් වූහ. දෙවිඳුන් විසින් යෞවන යෞවනියන් කැඳවනු ලබන්නේ ද ජීවිතයේ සුන්දර අවධියේදී ය.

ශුද්ධවූ සභාව තුළ දේව සේවය සඳහා කැපවන ඔවුන් ලෞකිකත්වය අත්හැරිය යුතුය. ලෝකය ජයගත යුතුය. ලෝකය ජය ගැනීම යනු ලෞකිකත්වය පරාජය කිරීම තුළින් ලබන ආධ්‍යාත්මික ජීවිතයයි. දෙවිඳුන් තුළ තාරුණ්‍යයෙන් ඔබ්බට ජීවිතයේ සුන්දර බව



තමන්ටම ආවේනික වූ ජීවිතයක් ගොඩනගා ගැනීමට විශේෂයෙන් බැඳීම් වලින් තොර නිදහස ඔවුන් අගය කරති.

අප ගති පැවතුම්, සමාජ ආචාර ධර්ම, අන්‍යෝන්‍ය ඇසුර ආදි දේ ඔහුට හෝ ඇයට පමණක් සීමා වුණා විය හැකිය. එමෙන්ම සමාජය තුළ ගැවසීමේදී වඩාත් ජනප්‍රිය දේ ඔහුගේ හෝ ඇයගේ සිත් ගත්තා විය හැකිය. විශේෂයෙන් ඇඳුම පැළඳුම, හැසිරීම් රටාව ඔහුට හෝ ඇයට වෙනස් දෙයකි.

අන්‍යයන් ඉදිරියේ කැපී පෙනෙන්නට, තම හැකියාවන් ප්‍රදර්ශනය කරන්නට ඉමහත් කැමැත්තක් දක්වන්නේ කෙනෙකුගේ තාරුණ්‍යය තුළය. සංගීතය යෞවනත්වයට අත්වැලකි.

එමෙන්ම තම ජීවිතයේ ඉදිරි ගමන කෙසේ විය යුතු ද යන්න තීරණය කිරීමට ද තාරුණ්‍යය ඔහුට බල කරනු ඇත. හදවතින් නැගෙන කාරුණිකත්වයට වඩා එහා යන සිතැඟියාවන් ඔහු තුළ බලපැවැත්වෙන හෙයින් තම ආශාවන් ඉටු කර ගැනීමට ඔවුන් දක්වන්නේ බලවත් කැමැත්තකි. ආදරය සෙනෙහස ඔවුන් සොයා එන්නාක් මෙන්ම ඔවුන්ද ආදරය සෙනෙහස සොයා ඉගිලෙති. ආගම දහම ඇදහීම හෝ තම විශ්වාසය ප්‍රකාශ කිරීමට හෝ මැලිකමක් දක්වන ඔවුන් තමන් රිසි ලෙස ආගම දහම ඇදහීමට උත්සාහ කරති. ආගම යල් පැන ගිය මතවාදයක්

පත්වෙද්දි, ඇතැමුන් තම ජීවිතයේ සාර්ථකත්වය කරා පා නඟති.

සමාජය තුළ ගිහියකු ලෙස ඉදිරි ගමන සකසන යෞවනයින්, දේශපාලකයින්, උගතුන්, බුද්ධිමතුන්, විද්වතුන්, පඬිවරුන් හෝ කාර්මිකකරණයේ ඉහළ තැන් කරා මෙහෙයවනු ලබයි. කිතුනු යෞවනත්වය තුළ ගිහියකු ලෙසට හෝ පූජක

තාරුණ්‍යයෙන් ඔබ්බට ජීවිතය සුන්දර කරගත් යෞවන යෞවනියන්ය. ඇතැම් විට තම යෞවනත්වය තුළ සත්‍ය විශ්වාසය හා දෙවිඳුන් වෙනුවෙන් තම ජීවිතය පවා පූජා කළ අවස්ථා එමටය. එදා මෙන්ම අදත් අද මෙන්ම හෙටත් ලොව තුළ මේ පූජාවීම සිදුවනු ඇත.

ඔවුන් තම තාරුණ්‍යය

> **ගිහි ජීවිතයේ දී තමන් ලබන කැඳවීම මනාව තේරුම්ගත යුතුව ඇත. ජනතාව වෙනුවෙන් කරනු ලබන සෑම කාර්යයක්ම, දේව කාර්යයක් සේ සලකා කටයුතු කරන්නේ නම් ඔහු හෝ ඇය දෙවිඳු ප්‍රසාදය ලබනු ඇත. සැමවිට තම කේන්ද්‍රස්ථානය කරගත යුත්තේ මැවුම්කාර දෙවිඳුන්ය.**

පැවිදිවරයකු ලෙසට කැඳවීම ලබන්නේ ඔහුගේ මැවුම්කාර දෙවිඳුන්ගෙනි. එය ඔහු හෝ ඇය වෙත බලපැවැත්වෙන දේව කැමැත්ත වේ. තමනට ලැබෙන කැඳවීම තුළ තම ජීවිතය ගොඩ නගා ගැනීම තරුණ ජීවිතයේ ඊළඟ අදියරයි. දෙවිඳුන් තුළ තම ජීවිතයේ සුන්දරත්වය දැකීම තාරුණ්‍යයෙන් ඔබ්බට සිදුවන භාග්‍යයකි. ශුද්ධ බයිබලය පුරාවට දිවෙන දේව ප්‍රේමයේ මහා කථාන්තරය තුළ දෙවිඳුන් හා බැඳුන, දෙවිඳුන් වෙත සමීප වුන,

දෙවිඳුන්ට පුදකර දේව සේවය සඳහා කැපවෙමින් තම ජීවිතය සුන්දර කරගත්හ. ඔවුන් මිනිස් කුසින් ඉපදුන ලේ, මස්, ඇට, නහර සහිත මිනිස් ජීවිත වූහ.

ඔවුන්ට ද ආශාවන් තිබුණි. ධනවත් පවුල්වල දූ පුතුන් වූහ. දෙමාපියන් ගෙන් හා බාහිර බලපෑම් ඔවුන්ට නොතිබුණා නොවේ. සාතන්ගේ සෘජු බලපෑම් ද ඔවුන්ට තිබුණි. එහෙත් තම ස්වාමියාණන් වූ ක්‍රිස්තුන් වහන්සේගේ "මම ලෝකය ජයගතිමි" යන ශුද්ධවූ වචනය

ලැබිය හැකි වන්නේ එවිටය. තාරුණ්‍යය හෙවත් යෞවනත්වය දේවාශිර්වාදයකි. තාරුණ්‍යය තුළ දේව ප්‍රසාදය ලැබිය හැකිවන්නේ අප ජීවිත දෙවිඳුන් වෙත එසැවීම තුළිනි. පූජක, පැවිදි ජීවිතය මෙන්ම ගිහි ජීවිතය ද දේව කැඳවීමකි. තාරුණ්‍යය තුළ අප ලබන දෙවිඳු ආරාධනය ශුද්ධවූ කැඳවීමකි. පූජක, පැවිදි ජීවිතය වෙත කැඳවීමක් නොලද කිතුනු තරුණ, තරුණියන් දෙවිඳුන් තුළ තම ජීවිත සුන්දර කරගත යුතුය.

ගිහි ජීවිතයේ දී තමන් ලබන කැඳවීම මනාව තේරුම්ගත යුතුව ඇත. ජනතාව වෙනුවෙන් කරනු ලබන සෑම කාර්යයක්ම, දේව කාර්යයක් සේ සලකා කටයුතු කරන්නේ නම් ඔහු හෝ ඇය දෙවිඳු ප්‍රසාදය ලබනු ඇත. සැමවිට තම කේන්ද්‍රස්ථානය කරගත යුත්තේ මැවුම්කාර දෙවිඳුන්ය. එමෙන්ම තමන්ට ලැබුණු සුන්දර තාරුණ්‍යය පිරිසිදුව, නොකිළිටිව, නොකැළැල්ව පවත්වාගත යුතුවාක් මෙන්ම එය දෙවිඳුන් වෙත පුද කිරීමට ද තාරුණ්‍යය බාධාවක් කරගත යුතු නැත.

නූතන සමාජ රැල්ලට හසුවෙමින් මංමුලා වූ ජීවිතයක් වීම කිතුනු තාරුණ්‍යයට නුසුදුසු වූවකි. කිතුනුකමට කැළලකි.

දේව සමීපත්වයට බාධාවකි. කිතුනු යෞවනත්වය සමාජයට පහනක් විය යුතුය. ආදර්ශයක් විය යුතුය. ඇසුරු කරන්නන්ට ආලෝකයක් විය යුතුය. පැවිදි, පූජක ලෙසට හෝ ගිහියකු ලෙසට හෝ තාරුණ්‍යය තුළ අප ලබන ආරාධනය, දෙවිඳුන්ගෙන් ලැබෙන කැඳවීමක් වන හෙයින් එහි සුන්දරත්වය විඳ ගැනීම කිතුනු අපගේ යුතුකමකි.

**සටහන**
**රංජිත් නෝනිස්**

# සිංහල සංස්කෘතියේ විශේෂත්වය ආගම් වලටත් පොදුයි

අප ශ්‍රී ලංකාවේ ජීවත් වන සිංහල භාෂාව කතා කරන ලියන කතෝලික ජනතාවක් ය. අපේ ජනවන්දනාවේදී ද යාච්ඤාවේ දීද සුභාරංචිය ඉගැන්වීමේ දී ද, සුභාරංචිය දේශනා කිරීමේනදී ද අප ඇදහිල්ල ගැන තව කෙනෙකුට කියා දීමේදී ද අප භාවිත කරන්නේ සිංහල භාෂාවය.

අප සිංහල භාෂාවේ එක එක තරාතිරමේ අය හැඳින්වීම සඳහා වෙනස් වෙනස් වචන ඇත. උදාහරණයක් වශයෙන් අතිගරු ජනාධිපති තුමා, එතුමා, විදුහල්පති එතුමා, ශුද්ධෝත්තම පාප් වහන්සේ, අති උතුම් දේවධර්මාචාර්ය.... රදගුරුතුමා, රාජගුරුප්‍රසාදින් වහන්සේ, මාහිමිපාණන් වහන්සේ, එසේම මධ්‍යම පුරුෂ වචන වන ඔබ ඔබට ඔබගේ යන වචන තමන් ඉදිරියේ සිටින මනුෂ්‍යයකු සඳහා භාවිත කළ හැකිය.

දෙවියන් වහන්සේ, බුදුන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨයන් හැඳින්වීමට ද, සිංහල භාෂාවේ විශේෂ වචන ඇත. මෙවැනි ශ්‍රේෂ්ඨයන් සම්බන්ධයෙන් ගෞරවාර්ථයේ නිපාතය යෙදිය යුතුමයයි මගේ හැඟීමයි. එම නිසා ශුද්ධවූ ත්‍රිත්වයේ තැනැත් වහන්සේලා හැඳින්වීම සඳහා සිංහල භාෂාවේ උතුම් ශ්‍රේෂ්ඨ යන හැඟීම් දෙන වචන භාවිතා කිරීමය සුදුසු, ඔබවහන්සේ, ඔබවහන්සේට, ඔබවහන්සේගේ, ඔවුන් වහන්සේ, පියාණන් වහන්සේ, ජේසුස් ස්වාමින් වහන්සේ යන වචන මඟින් ශුද්ධවූ ත්‍රිත්වයේ තැනැත් වහන්සේ හැඳින්වීම තමයි යෝග්‍ය සහ සුදුසු.

මේ වචන ගෞරවාර්ථයට සීමා වන්නේ නැත. එම වචන වලින් අදහන්නා තුළ භක්තියක් ලැදියාවක් ආදරයක් සහ සමීපතම කමක් ද හැඟී යනවා ඇත. ඒ තමයි සිංහල සංස්කෘතියේ විශේෂත්වය. ජේසු ස්වාමිදරුවන් දෙව් පියාණන් වහන්සේ හැඳින්වීම සඳහා භාවිත කළ ඇරැමයික් හෝ හිබෲ වදන වලින් හැඟී ගිය ආදරය සමීපතමකම ආදී හැඟීම සිංහල භාෂාවටම ආවේනික වචන මඟින් දිය හැකිය.

අප ජීවත් වන පරිසරය හඳුනාගත යුතුයි. සියයට 65 කට අධික අපේ බෞද්ධ සොහොයුරු සොහොයුරියෝ උතුම් ශ්‍රේෂ්ඨ යන හැඟීම්දීම සඳහා භාවිතා කරන සිංහල භාෂාවේ වචන කතෝලික අප ද භාවිතා කළ යුතු මැයි. පූජාප්‍රසාදි කෙනෙක් කියනවාට වඩා පූජා ප්‍රසාදි නමක් කියන එක සුදුසුයි නේද? සත්ප්‍රසාද ගෙනියනවා කියනවා වෙනුවට සත්ප්‍රසාද වහන්සේ වැඩමවාගෙන යනවා කීම සුදුසුයි නේද? අප ජීවත් වන්නේ තම ආගම් කර්තෘන් සම්බන්ධයෙන් හෝ ආගමික දේ "බෝධින් වහන්සේ" සම්බන්ධයෙන් ඉතා උතුම් වූද, ශ්‍රේෂ්ඨ වූද වචන භාවිත කරන සමාජයක බව අමතක නොකළ යුතුය.

එබැවින් අප කතා බහේ දී හෝ පොත පත ලිවීමේදී හෝ ශුද්ධවූ ත්‍රිත්වයේ තැනැත් වහන්සේලා සම්බන්ධයෙන් උතුම් වූද, ශ්‍රේෂ්ඨ වූද සිංහල වචන භාවිත නොකර නිකම්ම නිකං එතුමා, ඔබ, ඔබගේ, දෙවි තුමා, ක්‍රිස්තු තුමා, ජේසු තුමා වැනි වචන භාවිත කළහොත් අප කරන්නේ අප ජීවත් වන සමාජය ඉදිරියේ අප අදහන දෙවි මහෝත්තමයාණන් වහන්සේව හෝ ජේසුස් ස්වාමින් වහන්සේව හෝ අවතක්සේරු කිරීමේ ක්‍රියාවක්මය. ඒ නිසා සිංහල කතෝලිකයන් වන අප සිංහල භාෂාවේ උත්කෘෂ්ඨ වචනම අප අදහන දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් භාවිත කිරීමට පුරුදු වෙමු. අප දරු දැරියන්වද පුහුණු කරමු.

**ගරු ක්‍රිස්ටෝපර් කුරේරා පියතුමා**

# පමුණුගම රිදී සීනුව නිහඬ වෙයි

**"පුංචි වතිකානය" නමින් අබිසෙස් ලත් දෙව් ආසිරි, ශු. ජුසේ මුනි බලය හා ශ්‍රී ලේ වෙසෙස් වරමින් පෝෂිත පූජක පුතුන් බිහිකිරීමේ වාර්තා ලද පමුණුගම පුරවරයේ දෙවිඳු පැසසුම් රිදී හඬ නැගූ පමුණුගම කිතුනු ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ අයෝම යුග පුරුෂයකු ලෙස කීර්ති නාමයෙන් පුදලද පමුණුගම මහවත්ත ග්‍රාමය නිජබිම කොටගත් ප්‍රදේශයේ කීර්තිමත් ගම මැද ලියනගේ පරපුරේ ගම මැද ලියනගේ පිලිප් පෙරේරා නොහොත් පමුණුගම රිදී සීනුව සදහටම නිහඬව පසුගිය 17 වන දින දෙවිඳුන් අබියසට ගිය වග මෙසේ සංවේග යෙන් සටහන් කරමි.**

1928 සැප්. මස 24 වන දින මෙලොව එළිය දුටු පිලිප් පෙරේරා මහතා, පුත්තලම, හලාවත, මීගොමුව, ගම්පහ හා මාලිගාවත්ත රෙජිස්ටාර් ජනරාල් කාර්යාලවල රෙජිස්ටාර්වරයාගේ අමරණීය ජාතික සේවාවක් ඉටු කළ කීර්තිමත් දක්ෂ රාජ්‍ය නිලධාරියෙක් විය. අවසන් වරට එතුමා සහකාර රෙජිස්ටාර් ජනරාල්වරයා ලෙස ද කටයුතු කළේය.

පමුණුගම කීර්තිමත් වික්‍රමසිංහ පරපුරේ දහමට හා දේව ජනතාවට අමරණීය සේවාවක් කළ වික්‍රමසිංහ පරපුරේ බියට්‍රිස් වික්‍රමසිංහ ගුරු මාතාව හා යුග දිවියට පත් එතුමාට උගත් බුද්ධිමත් පුතුන් 4 දෙනෙකු හා එක් දියණියක් ද විය. එකම දියණිය විදේශීය වෛද්‍ය විද්‍යාලවල හා මෙරට වෛද්‍ය උපාධිය ලැබූ රාගම මහ රෝහලේ දක්ෂ වෛද්‍යවරියක ලෙස සේවය කරන දොස්තර රෝෂිනි පෙරේරා මහත්මියයි. පුතුන් දෙදෙනකු අමෙරිකාවේ හා කැනඩාවේ පදිංචිව සිටින අතර බාල පුත් දේව සේවයට කැපවූ ගරු රවීන් පෙරේරා පියතුමා අම්පිටිය ජාතික දෙව්සත්හලේ දේව දර්ශන පීඨයේ පීඨාධිපති තුමා ලෙස සේවය කරන කතෝලික සභාවේ ජනප්‍රිය පියතුමෙකි.



දිවයිනටම සාම විනිසුරුවරයකු වූ එතුමා වත්තල සමථ මණ්ඩලයේ හිටපු සභාපතිවරයකු ද වන්නේ ය. එතුමා ආගමික හා සමාජ සේවාවන් හිදී ප්‍රදේශයටම නිවැරදි නායකත්වය දෙමින් විවිධ නිලතල දරමින් සභා ශ්‍රේෂ්ඨයන් හැම සමඟ සමීප සබැඳියාවෙන් දහමට, දෙව්මැඳුරට හා පොදු ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කර ඇත්තේ ය.

පමුණුගම ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ ප්‍රධාන අන්නවි තනතුර ද දරමින් දෙව්මැඳුරේ සෑම ආගමික හා දෙව්මැඳුර සංවර්ධිත කටයුතු වලදී සභා ශ්‍රේෂ්ඨයන්ට පූජක තුමන්ලාට නිවැරදි අනුශාසනා දෙමින් හැමවිටම එතුමා සිය දැනුම හා හැකියාවන් දේව ජනතාව වෙනුවෙන් කැප කළේ ය.

දෙව්මැඳුරේ මංගල්‍ය සමයේ දී ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ හා ශ්‍රී ලේ සමිඳුන්ගේ ප්‍රාර්ථනා යැදුම අති මිහිරි රිදී සීනුවක් වැනි ලයාන්විත හඬින් සැදැහැවතුන් දහම් බැතියෙන් සමාධි ගන්වන උච්චාරණය කිරීම ඇසීමට බැතිමතුන් ඉමහත් ආශාවෙන් බලා සිටින්නෝ ය.

එතුමාගේ පරම්පරාවේ ඉතිහාසයේ දෙව්මැඳුරේ අන්නාවි තනතුර දැරූ යුග පුරුෂයෝ ය. එතුමාගේ පියා වන ජී. මාටින් පෙරේරා නොහොත් මාටින් අන්නවි මහතා ද පමුණුගම කිතුනු ඉතිහාසය දහමින් සුවඳවත් කළ කීර්තිමත් යුග පුරුෂයකු විය.

එතුමාගේ අවමංගල උත්සවය සඳහා අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු මහනුවර, ගාල්ල, රත්නපුර, බදුල්ල, හලාවත, අනුරාධපුර සහ කොළඹ සහයක රදගුරුතුමන් ද රදගුරු නියෝජිත පියවරු ද, එතුමාගේ පුත්‍ර ගරු රවීන් පෙරේරා පියතුමා සේවය කළ බදුල්ල පදවියේ සියළු පියතුමන්ද, සිරිලක දසතින් පැමිණි ගරු පූජක තුමන් හා සහෝදර තුමන් ද, අම්පිටිය දෙව්සත්හලේ සියළුම පූජක සිසුන්, ගරු පැවිදි සොයුරියන් සහ අති මහත් ජනකායක් ද සහභාගි වූහ.

පමුණුගම සා. ජෝශප් දෙව්මැඳුරේ පැවති අවසන් දිව්‍ය පූජා යාගය එතුමාගේ පුත් රවීන් පෙරේරා ගරු පියතුමන් ප්‍රධානව සහෝදර පියවරුන් විසින් සිදුකරන ලද අතර විශේෂ දේශනය පවත්වන ලද්දේ ගමේ පුතකු වූ කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් විසිනි. පමුණුගම රිදී සීනුව පිලිප් පෙරේරා මැතිඳුන්ට සදා මොක්සුව පතමු. එතුමාගේ සමීප ඥාතිවර ප්‍රදීප සංස්කාරක ගරු ශාන්තසාගර හෙට්ටිආරච්චි පියතුමන්ගේ සංවේගය ද මේ සමඟ එක්කරමු.

**පමුණුගම**
**ජෝ. සංගපාලආරච්චි**

දැහැමියාවෙන් .... 1 පිටුවෙන්

දකුණු ජර්මනියේ බැවේරියාවේ මර්ටල් අම්ඉන් නමැති සුන්දර ගම්මානයේ උපත ලබා භක්තිවන්ත දෙමාපියන් දෙපළකගේ ආදර උණුසුම මැද හැදුණු වැඩුණු ජෝශප් රැට්සිංගර් දරුවා තමන්ට ලද දේව කැඳවීම තුළ පූජක පුහුණුව සඳහා දෙව්සත්හලට ඇතුළු වී 1951 ජූනි 29 පූජකවරය ලැබීය. එතැන් පටන් දේව ධර්මය ගැන නූතන සමාජයට ගැලපෙන ආකාරයට අර්ථකථනයන් ලබා දීමට පුදුම හැකියාවක් ඇති කරගත් එතුමා පසුකලෙක ප්‍රකට දේව ධර්ම අචාර්යවරයකු ලෙස ද අගැයීමට ලක් විය.

1962 ආරම්භ වී 1965 නිමා වූ දෙවන වතිකාන කතිකාව සඳහා සූදානම් වීමේ අධ්‍යයන පත්‍රිකාවක් සකස් කිරීමට දායක වූ උන්වහන්සේ කතිකාවේදී එවකට ප්‍රකටව හුන් ජර්මනියේ කොලොන්හි අගරදගුරු අති උතුම් ජෝශප් කාදිනල් ෆ්‍රින්ග්ස් හිමිපාණන්ගේ උපදේශකයකු ද විය. එකී සම්මන්ත්‍රණ සභාවේදී නූතන සමාජයට ගැලපෙන පරිදි කිතුනු සත්‍යතාවයන් ඉදිරිපත් කරමින් ප්‍රකාශයට පත් කරන ලද විවිධ ලියවිලි සකස් කිරීමේදී මෙතුමා ලබා දුන් දායකත්වය සුවිසල් වූ බවද කියැවේ. පසුකලෙක මියුනිච් පදවියේ අගරදගුරු හිමිපාණන් ලෙස අති උතුම් සවැනි පාවුළු පාප් වහන්සේ විසින් පත් කරන ලද උන්වහන්සේව 1977 ජූනි 27 වැනිදා කාදිනල්වරයට ඔසවන ලදි.

අති උත්තම දෙවන ජුවාම් පාවුළු සසුන් පියාණන්ගේ සමීපතමයකු වූ එතුමාව 1981 නොවැම්බර් 25 වැනිදා විශ්වාස වර්ධන සංගමයේ අධිපති ලෙස ද පත් කරනු ලැබීය. අවුරුදු 28 ක් එහි සේවය කළ එතුමා 2005 දී අති උත්තම දෙවන ජුවාම් පාවුළු සසුනිසුරාණන් සගසුව දිනීමෙන් පසු පැවති සසුන් පිය නිලවරණයේ දී 2005 අප්‍රේල් 19 වැනි දින සොළොස්වන බෙනඩික් පාප් වහන්සේ ලෙස පදවි ප්‍රාප්ත විය.

එතුමන් මා පෞද්ගලිකව හඳුනා ගත්තේ ඉහත කී විශ්වාස වර්ධන සංගමයේ සභාපති තුමන් ලෙස කටයුතු කළ කාලයේ දී ය. එතැන් සිට වසර ගණනාවක් තුළ උන්වහන්සේ සමඟ කිට්ටුවෙන් ඇසුරු කිරීමටත්, උන්වහන්සේ ලියූ පොත පත කියවා, උන්වහන්සේගේ වැඩකටයුතු වලදී සහය වීමටත් මට ලැබුණු ඉඩකඩ දේව වරප්‍රසාදයක් ලෙස සලකමි. කොපමණ උගතකු වුවත් බැහැපත්කම නමැති අලංකාර ගුණාංගයෙන් සැරසී සිටි එතුමන් දේව ධර්මයේ අධ්‍යාත්මික පැත්ත ගැඹුරින් අධ්‍යයනය කිරීමට මට මහත් ආලෝකයක් වූ බව සඳහන් කළ යුතුමයි. එතුමන් හා මා අතර ඇති වූ සුහද සංවාදයන් තුළින් විශේෂයෙන් ජනවන්දනාවේ ඇති වැදගත්කම ද, එය අපගේ විශ්වාසයේ පැවැත්මට බලපාන ආකාරය ද එහි ස්වර්ගීය අලංකාරය ද අත් විඳින්නට මා හට ඉගැන්වූයේ උන්වහන්සේම යයි කීවොත් එය නිවැරදිය.

ඔවදනක් හෝ අනුග්‍රහ වදනක් උන්වහන්සේගේම අතින් ලියා මා වෙත තිළිණ කරන ලද පොත් බොහොමයක් මගේ පොත් අතරට එක්වූහ. මම ඒවා කියවා රස වින්දෙමි. ක්‍රිස්තුන් වහන්සේගේ ගැඹුරු දහම ඉතා සරළවද, රසවත්වද සහෝදර ජනතාවට ඉදිරිපත් කිරීමට මා හට හැකියාව ලැබුණේ උන්වහන්සේගේ එම පොත් පත් කියවීමෙන් හා උන්වහන්සේ සමඟ සුහදව කරන්නට ලැබුණු සාකච්ඡාවන් තුළිනි. උගත් වූත්, නිහතමානීවූත් මේ ශ්‍රේෂ්ඨ එඬේරා ඇත්තෙන්ම සභාවට මහත් ආශිර්වාදයක් වූ බව මගේ හැඟීමයි. උන්වහන්සේගේ දේශන පොත්පත් ලිපි ආදිය කියවන්නට අසන්නට පැමිණි ජනයාගෙන් ශු. පේදුරු මුනිතුමන්ගේ වතිකාන දෙව්මැඳුර පිරී ගියේ මේ නිසාම ය. දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ බලන්නට දස දහස් ගණනින් වතිකානයට ආ සෙනඟ සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමාණන් වෙත රොක්වූයේ එතුමන් කියන දෙය අසන්නටය කියා ද එදා කියවුණි.

මෙවැනි ශ්‍රේෂ්ඨ එඬේරකු අපට ලබා දීම ගැන දෙවියන් වහන්සේට තුති පිදිය යුතුවේ. ශාරීරික වියපත් වීම නිසා තමන්ගේ උතුම් තනතුරෙන් බැහැරව යන්නට තරම් නිහතමානි වූ මේ ශ්‍රේෂ්ඨ දේව පුත්‍රයා ඇත්තෙන්ම අද අප සැමට මහඟු ආදර්ශයක් බැව් නොකිවමනා ය. දේව වරප්‍රසාදයෙන් එතුමන්ට තව බොහෝ කලක් අප අතර රැඳෙමින් දැහැමියාවෙන් තව තවත් අප පෝෂණය කරන්නට ශක්තිය, ධෛර්යය ලැබී යම් දිනක සභාවේ උත්තරීතර ගෞරවය එනම් ශුද්ධවන්තයන් අතරට ගණන් ගනු ලැබීමේ මහඟු වරම උන්වහන්සේට ද ලැබේවා යි මම ප්‍රාර්ථනා කරමි.

කිතු සමිඳුන්ගේ .... 13 පිටුවෙන්

එවිට නිසැකවම ගිජු ලිහිණියෝ අපගේ විශ්වාසයේ ජීවිතය කා දමන පිණිස ළං වෙති. උන් ගෙනෙන්නේ ලෞකික බිය මිස ශුද්ධාත්මයාණන්ගෙන් නික්මෙන දේව ගරුබිය නොවේ. පාපයකට වැටුණු විට යක්ෂයා ගිජු ලිහිණියකුගේ වෙසින් අවුත් කලකිරීම, සෘණාත්මක ආකල්පය හා කාලකන්නි හැඟීම අප තුළ වපුරයි. ආබ්‍රහම් තුමා කළේ ගිජු ලිහිණියන් එළවා දැමීමයි. සවස් වන විට ආබ්‍රහම් බර නින්දකට වැටිණි. ආබ්‍රහම් තුමා නිදාගත් විට ගිජු ලිහිණියන්ගෙන් මලකුණු ආරක්ෂා කළෝ කවරහුද? ආබ්‍රහම් බර නින්දකට පත් කළේ අනෙකෙකු නොව දෙවියන් වහන්සේ ය. උන්වහන්සේට අවශ්‍ය වූයේ මිනිසා හා ඒකපාර්ශවයීය ගිවිසුමක් පිහිටුවීමයි.

යම් හෙයකින් තමන් වහන්සේ මෙම ගිවිසුම කඩකරන්නේ ද, මළකුණුහි ඉරණම තමන් පිට පවරා ගැනීමට ඉදිරිපත් වීමයි. අප අදහන දයාබර අබ්බා පියාණන්ගේ ස්වභාවය මෙයයි. උන්වහන්සේ අප බර නින්දකට පත්කොට අපට නොදැනුවත්වම ජීවනය දෙන සේක, අපේ කඳුළු පිස දමන සේක. අපට සැනසීම දෙන සේක. ඒ සඳහා අප කළ යුත්තේ අපගේ තද සිත් දෙපළු කොට එකිනෙකට මුහුණ ලා තබා යක්ෂයා ගෙනෙන පරීක්ෂාවන්ගෙන් ඒවා ආරක්ෂා කොට දෙවියන් වහන්සේට ඒ සිත් හරහා ගමන් කිරීමට සැලැස්වීමයි. කල්වාරි යාගය වූ කලී පුත්‍රයාණන් වහන්සේ අපගේ ගැලවීම උදෙසා ස්වකීය ජීවිතය දෙපළු කළ අති ගාම්භීර මොහොතයි. නියම මහිමාලංකාරය දිස්වූයේ කල්වාරිය හරහා ගමන් කිරීමෙන් මිස තාබෝර් කන්දේ නතර වීමෙන් නොවේ. මෙය අවබෝධ කරගැනීමට නම් අපිදු වළාකුළෙන් නික්මුනු හඬ පිළිපැදිය යුත්තෙමු. එනම්, "මේ මාගේ පුත්‍රයාණෝ ය, මේ මා තෝරාගත් තැනැත්තාණෝය, මොහුට සවන් දෙන්න" යනුයි (ලූක් 9:35).



සිරිගල මීසමේ සා. වින්සන්ද පාවුලා සමිතිය මගින් දහම් පාසල් දරු දැරියන්ගේ ප්‍රයෝජනය සඳහා රු. 7,50,000/= පමණ වියදමින් දහම් පාසල් මණ්ඩපයක් සාදා පසුගියදා කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් විසින් විවෘත කරන ලදි. මේ සඳහා මීසම් ජනතාවගෙන් සහ ප්‍රදේශයේ බෞද්ධ දානපතියන් ඇතුළු ව්‍යාපාරිකයින්ගේ නොමසුරු සහයෝගය ලැබුනි. මේ අවස්ථාවට මීසම් සේවක ගරු ඇන්සලම් ප්‍රනාන්දු පියතුමා ඇතුලු මීසමේ හිටපු පියවරුන් කීප නමක්ද, සමිතියේ සභාපති බෙනට් වික්‍රමගේ මහතා ඇතුලු නිලධාරි මණ්ඩලයද සහභාගි වූහ. **(හිල්ඩා කුමාරපේරු)**

## ප්‍රදීප ලේඛක පුතු ස්වර්ණවාහිනියේ

කන්දතොඩුවාව ප්‍රදීප ලේඛක ෂෙලී රතුගම මහතාගේ බාල පුතනුවන් වන තිසර ධනුෂ්ක රතුගම මහතා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දැනට සේවය කරන අතර "ස්වර්ණවාහිනී" නාලිකාවේ අනුග්‍රහයෙන් එම රට තුළ විහිදී විසිරී සේවය කරන ශ්‍රී ලාංකික දූ පුතුන්ගේ ගායනා - නර්තන හැකියාවන් "රටවිරුවෝ" වැඩසටහන යටතේ මේ දිනවල සෑම ඉරිදාවකම, රාත්‍රී 10.00 සිට 11.00 දක්වා ස්වර්ණවාහිනියෙන් විකාශය කෙරේ.

ලංකාවේ ජනප්‍රියතම නිළි මාලනී ෆොන්සේකා මහත්මිය ප්‍රමුඛ කලාකරුවන්ගේ විනිශ්චය හමුවේ මෙම තරගය පැවැත්වෙන අතර තිසර ධනුෂ්ක මහතා ගිටාරයෙන් තම දායකත්වය ලබාදී, සංගීතය සපයයි. ඔහුගේ සංගීත දිවියට ප්‍රදීප සුභාසිරි.

විශ්වාසය යනු.... 13 පිටුවෙන්

විශ්වාසය එල ගැන්වීමේ දී මිනිසා තුළ සිදුවන මෙම දිව්‍යමය ක්‍රියාකාරීත්වය නිසාම විශ්වාසය සහමුලින්ම දේව ක්‍රියාවක් යැයි යන හැඟීම කෙනකු තුළ ඇතිවිය හැකිය. විශ්වාස කිරීම නිත්‍ය වශයෙන්ම මිනිස් ක්‍රියාවක් බව කතෝලික සභාවේ ධර්මෝපදේශය උගන්වයි.

"විශ්වාස කළ හැක්කේ දේව වරප්‍රසාදයේ හා ශුද්ධාත්මයාණන්ගේ අභ්‍යන්තරික දීමනාවන්ගේ උදව්වෙන් පමණකි. එහෙත් විශ්වාස කිරීම නිත්‍ය වශයෙන්ම මිනිස් ක්‍රියාවක් වන බව ද සත්‍යයකි." (C.C.C. 154)

මෙලෙස විශ්වාසයේ ක්‍රියාකාරීත්වය සඳහා දේව දායකත්වය තහවුරු කරන අතරම මානව ක්‍රියාකාරීත්වය ද දැඩිව අවධාරණය කෙරේ. විශ්වාස කිරීම මානව නිදහසට හෝ විචාර බුද්ධියට පටහැනි නොවේ. තමන් අනාවරණය කරන දෙවියන් වහන්සේට පූර්ණ අවබෝධයෙන් හා නිදහසින් යුතුව අවනත වීම මිනිසාගේ ගෞරවනීයත්වයට පටහැනි ක්‍රියාවක් නොවන බව ද එහි ඉගැන්වේ. (C.C.C. 154) ශුද්ධාත්ම සහය හෝ දේව වරප්‍රසාද මිනිස් නිදහස සීමා නොකරයි; මිනිස් බුද්ධිය මොට නොකරයි; අසීමිත වූ සත්‍ය දැකීමට හා පිළිගැනීමට මිනිස් නිදහසට විචාර බුද්ධියෙන් ලබන ගැඹුරු අවබෝධයෙන් හා පූර්ණ නිදහසින් යුතුව තමන් අනාවරණය කරන දෙවියන් වහන්සේ අදහා ගන්නා මිනිසාගේ ක්‍රියාව සත්‍ය වශයෙන්ම මිනිස් ක්‍රියාවකි.

### නිගමනය

කතෝලික සභාවේ ධර්මෝපදේශයේ ඉගැන්වීම "විශ්වාසය යනු තමන් අනාවරණය කරන දෙවියන් වහන්සේ වෙත දක්වන ප්‍රතිචාරයක් ලෙස මිනිසා උන්වහන්සේ සමඟ ඇතිකර ගන්නා පුද්ගලාන්තර සබඳතාවක් " බව පෙන්වා දෙයි. එය දේව දීමනාවකි. එම දීමනාව ලැබීමට අපි සුදුස්සන් නොවෙමු. දේව දයාවෙන් අපි ඒ මහඟු තිළිණය ලැබීමට සුදුස්සන් ලෙස ගනන් ගනු ලැබ සිටිමු. මෙම විශ්වාසයේ වසර තුළ දී අප සැමගේ පළමුවන සාමුහික ප්‍රයත්නය විය යුත්තේ තමන් වහන්සේව අපට අනාවරණය කර දෙවියන් වහන්සේ සමඟ සමීප පුද්ගලාන්තර සබඳතාවක් ගොඩනඟා ගැනීමයි. දෙවනුව තමන් අනාවරණය කරන දෙවියන් වහන්සේ ගැන ද, උන්වහන්සේ අනාවරණය කළ ගැලවීමේ සත්‍යතාවයන් ගැන ද අපගේ අවබෝධය වැඩිකර ගැනීමට වෙර දැරීමයි. මන්ද ශුද්ධවූ අගුස්තීනු තුමා උගන්වා ඇති පරිදි "විශ්වාස කරන සත්‍යතාවයන් පිළිබඳ ගැඹුරු අවබෝධය දෙවියන් වහන්සේට වඩා ප්‍රේම කිරීමට අප පොළඹවයි." - නිමි -



ජෝන් අමරතුංග පදනම මගින් පවත්වන ලද වෘත්තීය පුහුණු පාඨමාලාවන් සාර්ථක ලෙස හදාරා අවසන් කරන ලද සිසු සිසුවියන්ට සහතික පත්‍ර පිරිනැමීමේ උත්සවය කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හැඳල කෙරවලපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයීය උත්සව ශාලාවේදී නොබෝදා පැවැත්විණි.

පදනමේ සභාපති ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග, බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍ය ලෝරන්ස් මාදිවල සහ වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැල්කම් පෙරේරා යන මහත්වරුන් සමඟ මැක්ස්වල් සිල්වා හිමිපාණන් උත්සවය නැරඹූ අවස්ථාව මෙහි දැක්වේ. **(නිමල් පෙරේරා)**



රණවිරු දරුවන්ට තිළිණ බෙදා දීමේ වැඩසටහනක් පසුගියදා පමුණුගම දී සිදුකෙරිණි. මෙයට රණවිරු සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපතිනි නන්දා ඉන්ද්‍රවංශ මහත්මිය ඇතුළු ආරාධිතයන් රැසක් සහභාගි වූ අතර එහිදී පමුණුගම බෝපිටිය සාන්ත නිකුලා මුනි දෙව්මැඳුරේ මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමා උත්සව සභාව ඇමතූ අයුරු සේයාරුවෙන් දැක්වේ. **(සටහන - ජෝ. සංගපාලආරච්චි, සේයා - කැප්ටන් ඇන්ටන් හපුආරච්චි)**

# ශුද්ධවත් ජීවිතයක් ගත කිරීමට පවුලක් වශයෙන් විශ්වාසයෙන් අයදින්න

## චෝලන්කන්ද ශු. සෙබස්තියන් මුනි මංගල්‍යයේ දී මහනුවර පදවි රදගුරු හිමිපාණෝ ප්‍රකාශ කරති

නාවලපිටිය ප්‍රදේශයේ පිහිටි ප්‍රසිද්ධ ජනවන්දනා භූමියක් වන චෝලන්කන්ද ග්‍රාමයේ සා. සෙබස්තියන් මුනි මංගල්‍ය සඳහා වසරක් පාසා එම දෙව්මැඳුරට රොක් වන බහු වාර්ගික බහු ආගමික විශ්වාසිකයන්, මුනිඳු අනුහසින් නිරෝගී සුවය අත්විඳ ගැනීම වසරේ ප්‍රමුඛව ලබන උතුම් අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

එහි මංගල්‍ය දිව්‍ය යාගය සිදු කළ මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන් පවසා සිටියේ "කානාහි මඟුල් ගෙදර ජලය මිදිරසට හැරවීමේ ප්‍රාතිහාර්ය මගින් දේව මාතාවන් අපට කීවේ ඔහු කියන දේ ඔබ කරන්න, යනුයි ඒ විශ්වාසය තුළ ඇදහිල්ල පරම්පරාවෙන් පරම්පරාව වැළඳගත් අය අතරින් ශු. සෙබස්තියන් මුනිතුමා තම ජීවිතය පරදුවට තබා දිව්‍ය පුත්‍රයාණන්ගේ උතුම් පරිත්‍යාග යට තිළිණයක් වුණා. ඔබත් තිළිණයක් වීමට නම් ශුද්ධවත් ජීවිතයක් ගත කිරීමට පවුලක් වශයෙන් විශ්වාසයෙන් අයදින්න. එසේ නොවී මෙම වත් පිළිවෙත් බාහිර අලංකරණයෙන් දේව කාර්යයට වටිනාකමක් දීමට නොහැකි" බවය.

සුපුරුදු පරිදි අති මහත් ජනකායක් එකමුතුව දානමාන බෙදා හදා ගෙන පුද පූජා පැවැත්විය. සා. මරියා මීසම් සේවක ගරු නිව්මන් පීරිස් පියතුමා ද, චෝලන්කන්ද කාර්මික පුහුණු මධ්‍යස්ථානයේ විදුහල්පති ගරු ටිරෝන් මිහිඳුකුලසූරිය පියතුමා හා සහයක ගරු රන්ජන් ජයමාන්න පියතුමන්ගේ සහභාගිත්වයෙන් මනා සංවිධානයෙන් යුතුව මෙය සිදුකෙරිණි.

**(සටහන - මිකී ප්‍රනාන්දු, නාවලපිටිය)**



පිටිපන ශු. කානික්ක දේවමාතා වාර්ෂික මංගල්‍යය නිමිතිකොට මීසම් සේවක ගරු සරත් නිමල් පියතුමාගේ මඟ පෙන්වීම මත රෝස කුසුම අප මාතා දෙටු මිශ්‍ර ප්‍රසීඩියම මගින් රෝගීන්ගේ විශේෂ මෙහෙයක් පසුගියදා පිටිපන දෙව්මැඳුරේ දී පැවැත්විණි.

මෙයට රෝගීන් විශාල පිරිසක් සහභාගි වූ අතර මීසම් සේවක පියතුමන් ඔවුන්ව ශු. තෛලයෙන් ආලේප කරන ලදි. දිව්‍ය යාගය සිදුකළ ගරු සරත් නිමල් පියතුමන්ට ද රෝගීන් සඳහා නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයූ ත්‍රිරෝද රියදුරන්ට ද ටියුඩර් මාස්ටර් ඇතුළු ගායනා කණ්ඩායමට ද දෙටු මරිය භටයන්ට ද නන් අයුරින් සහය වූ සැමට ද අපගේ ප්‍රණාමය පුද කරමු. **(රෝස කුසුම අප මාතා දෙටු මිශ්‍ර ප්‍රසීඩියම - පිටිපන)**

## සභා ශ්‍රේෂ්ඨයිනට අවනත වූ ආදර්ශවත් චරිතයක්

"මා සහෝදරතුමකුව සිටින අවධියේ සිට හඳුනන අතිගරු නිකලස් ප්‍රනාන්දු පියතුමාගේ මිහිදන් උලෙළේ අනුශාසනය කිරීමට ලැබීම මට සතුටට කරුණක්. සභාවේ උන්නතිය සඳහා ඕනෑම අභියෝගයකට මුහුණ දීමට සූදානම්, සභා ශ්‍රේෂ්ඨයනට අවනත වූ ආදර්ශවත් චරිතයක් එතුමා සතුව තිබුණා" යැයි දැලතුර දෙව්මැඳුරේ පැවති අවමංගල්‍ය දේව මෙහෙයේ දී ගාලු පදවි අනුනායක අතිගරු නිහාල් නානායක්කාර පියතුමා පැවසීය.

ගාලු රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ, රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් පෙරේරා සා.බෙ.නි., කුරුණෑගල විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් පැවැති මේ දේව මෙහෙයේ දි තවදුරටත් අදහස් දැක්වූ අනුනායක මාහිමිපාණෝ රත්නපුර, ගාල්ල රදගුරු පදවිවල පියවරුන් සමඟ සමීප මිත්‍රශීලි සම්බන්ධතාවයක් අතිගරු නික්ලස් ප්‍රනාන්දු පියතුමාට තිබූ බව ද පැවසීය.

රත්නපුර සර්ව ආගමික සංසදයේ සභාපති අති පූජ්‍ය කොටපොල සුධර්ම හිමි අනුශාසනය කරමින් රත්නපුර ප්‍රදේශයේ ආගමික සහජීවනය ගොඩනැගීම සඳහා සුවිශේෂී මෙහෙවරක් කළ පියනමක් හැටියට හැඳින්විය හැකි යයි ද පැවසීය. ගුණ කථන කිහිපයක් ද පැවති අතර රත්නපුර දිසා සංඝනායක ගෞරව කෙහෙල්ඹිවිටිගම තිස්ස ස්වාමින් වහන්සේ ද රත්නපුර මවුලවි තුමා හා කුරුක්කල් පූජක තුමා ද විවිධ පදවි වලින් පැමිණි ගිහි පැවිදි පූජක රැසක් ද මෙයට සහභාගි වූහ. **(තියබෝල්ඩ් සමරතුංග)**

## දෙමාපියන් වටිනාකම් නොතැකීම කණගාටුවක්!

අද අපේ දෙමාපියන් දරුවන් කෙරේ වඩාත් විමසිලිමත් වෙනවා. එහෙත් ආගමික වටිනාකම් නොතැකීම කණගාටුවක් යැයි ගාල්ල මීසම් සේවක ගරු මයිකල් කොලින් පියතුමා ගාල්ල ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ ආසන දෙව්මැඳුරේ පැවති ළමා ධර්මදූත ඉරුදින දිව්‍ය පූජාවේදී පැවසීය.

මේ දිව්‍ය පූජා යාගයට මීසම් වාසින්, දහම් පාසල් දරුවන්, පැවිදි සංඝයන්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්, යුධහමුදා සාමාජික හා නාවික හමුදා සාමාජිකයන්, ආධුනික හමුදා සාමාජිකයන් වෙනත් ආගමික සැදැහැවතුන් ඇතුලු අති විශාල පිරිසක් සහභාගි වුහ.

**(මංගල ජයවර්ධන)**